**04 වන සැසි වාරයේ 01 වන මංගල මහා සභාවේ වාර්තාව 2018/04/05**

සහභාගීත්වය -

| | | | |
|---|---|---|---|
| 01. | එච්.පී. සෝමදාස මැතිතුමා | - | ගරු නගරාධිපති |
| 02. | එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමා | - | ගරු නියෝජ්‍ය නගරාධිපති |
| 03. | ආනන්ද දහනායක මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 04. | ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 05. | ඒ.එම්.පී. අන්සාර් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 06. | නලීන් සංජීව සිරිවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 07. | දුමිඳු දයාසෙන් රූවියල මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 08. | නීතීඥ රංජිත් රාජකාරුණා මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 09. | එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 10. | ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. වීමුක්ති රණවීර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 11. | සුපුනි සඳමාලී මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 12. | නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 13. | එස්.ආර්.ඒ. සුරංගි රේණුකා සමරතුංග මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 14. | එම්.ඩී.කේ. විනෝදනි විජේසූරිය මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 15. | කේ.පී. සචිනි නිමේෂා මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 16. | කේ.එච්. ඉන්දික අරුණ කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 17. | නීතීඥ ජේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 18. | ජේ.එම්. සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 19. | රශ්මික ගමආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 20. | ඩී. ජී. ජේමදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 21. | ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 22. | රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 25. | කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 26. | ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 27. | කේ.පී. අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |

28. එච්.බී. සීතා හේරත් මැතිනිය - ගරු නාගරික මන්ත්‍රී

29. එම්.එස්.එම්. අල් ෆාරීස් මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී

30. ඩබ්.එම්.එස්.එල්. විජේසිංහ මහතා - සභා ලේකම්

සභා ලේකම් ඩබ්.එම්.එස්.එල්. විජේසිංහ මහතාගේ ආරාධනාවෙන් අනතුරුව ගරු නගරාධිපති එච්.පී. සෝමදාස මැතිතුමා විසින් 04 වන සැසි වාරයේ 01 වන මහා සභා රැස්වීමේ කටයුතු 2018/04/05 වන දින පෙ.ව. 10.00 ට ආරම්භ කරන ලදී.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

සුභ උදෑසනක් සියලුදෙනාටම. අද දින න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රථමයෙන් මෙම සභාවට අදාලව කැඳවීමේ නිවේදනය ඉදිරිපත් කරනවා.

'' 2018/02/10 වන දින පැවති පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත් වූ අනුරාධපුර මහා නගර සභාවේ 04 වන සැසි වාරයේ සභා කටයුතු ආරම්භ කිරීම සඳහා මෙම මංගල මහා සභා රැස්වීම අනුරාධපුර මහා නගර සභාවේ 04 වන නගරාධිපති එච්.පී. සෝමදාස වන මා විසින් කැඳවන ලදී ''

***02. ඉදිරි මහ සභා රැස්වීම සඳහා දින නියම කිරීම.***

ඔබතුමාලට දැන් දීලා තියෙනවා 2018 වර්ෂයට අදාළව මහා සභාව, ස්ථාවර කමිටු සඳහා දිනයන් , කියවන්න ඕන ද නැත්තං, සභාගත කරනවා.

**<u>නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා</u>**

අපට අවශ්‍ය වන පරිදි සංශෝධනය කරගන්න වන්නේ.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**

ඔව් එක අවශ්‍ය පරිදි සංශෝධනය කරගන්න පුළුවන්. ඔබතුමාලගේ මේසය මත තබා ඇති සටහන අපි සභාගත කරනවා. ( ඇමුණුම අංක 01 )

***03. ස්ථාවර කමිටු සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.***

අපි පහුගිය සැසි වාරයට වඩා මන්ත්‍රීවරු සංඛ්‍යාව මෙම සැසි වාරයේ දී වැඩි වෙලා තියනවා. එම නිසා අපට සිද්ධ වුණා කමිටු සංඛ්‍යාව වැඩි කරන්න.

- ***කමිටු පිළිබඳ විස්තර සභා ගත කිරීම***

**<u>යෝජිත කමිටු හා විෂයයන්</u>**

1. **මුදල් කමිටුව**
   i. සියළුම ආදායම් හා වියදම් පිළිබඳ අධ්‍යනය කොට අවශ්‍ය තීරණ ගැනීම
   ii. රු. 15,000ට වැඩි සියළු බැදීම් හා එම බැදීම් නිරවුල් කිරීම් සම්බන්ධව මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම
   iii. සියළු කමිටු වාර්තා සළකා බලා ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්දේශ සමගින් මහා සභාවට ඉදිරිපත් කිරීම

**2. සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතික කමිටුව**

i. සනීපාරක්ෂක කටයුතු
ii. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
iii. කාණු පද්ධති නඩත්තුව
iv. මළ අපවහන සේවා
v. ඩෙංගු රෝග මර්ධනය
vi. බෝවන රෝග පාලනය
vii. ආහාර සෞඛ්‍ය
viii. සුසාන භූමි හා ආදාහනාගාර
ix. සත්ව සෞඛ්‍ය
x. අයාලේ යන ගවයන් පාලනය
xi. ජලභීතිකා රෝග පාලනය
xii. පොදු වැසිකිළි
xiii. බෙහෙත් ශාලා
xiv. රසායනාගාර සේවා
xv. පොසොන් සැණකෙළියට අදාළ කටයුතු
xvi. උරුම කළමනාකරණය (Heritage Management)
xvii. සංස්කෘතික උත්සව හා වැඩසටහන්
xviii. සංස්කෘතික ප්‍රවර්ධන කටයුතු
xix. ආගමික උත්සව හා වැඩසටහන්

**3. ක්‍රීඩා, නිවාස, සංචාරක කමිටුව**

i. ක්‍රීඩාංගන නඩත්තුව හා සංවර්ධනය
ii. ක්‍රීඩා සංවර්ධනය
iii. ක්‍රීඩා උත්සව
iv. ඇවිදින මංතීරු හා ශරීර සුවතා වැඩසටහන්
v. විනෝදාත්මක කටයුතු හා වැඩසටහන්
vi. නිවාස (කුලී නිවාස, නිල නිවාස)
vii. සංචාරක කටයුතු
viii. පොදු උද්‍යාන හා ළමා උද්‍යාන

**4. නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන, ඉඩම් හා දේපළ නිරවුල් කිරීම පිළිබද කමිටුව**

i. නව ආයෝජනයන් හදුනා ගැනීම
ii. නව ආයෝජන යෝජනා ඉදිරිපත් කිරීම
iii. ආදායම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති හදුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සදහා නිර්දේශ ඉදිරිපත් කිරීම
iv. සභාව සතු දේපළ නිරවුල් කිරීමට අදාළ කටයුතු
v. සභාව සතු දේපළ සුරක්ෂිත කිරීම
vi. ඉඩම් කටයුතු
vii. ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු

**5. පරිසර, කෘෂිකර්ම හා රථවාහන කමිටුව**

i. කෘෂිකර්ම කටයුතු
ii. මාර්ග ආරක්ෂණ කටයුතු
iii. පොලිස් රථවාහන නියාමන පිළිබද කටයුතු
iv. පරිසර ආරක්ෂණ කටයුතු
v. කර්මාන්ත ශාලා හා නිශ්පාදන කර්මාන්ත සම්බන්ධ කටයුතු
vi. ගිනි ආරක්ෂණ
vii. ජලාශ හා නාන තොටුපළ
viii. පොලිස් පරිසර ඒකක කටයුතු
ix. රථගාල්
x. පදික වේදිකා
xi. මහජන පොළ
xii. ප්‍රජා ශාලා

**6. යටිතල පහසුකම්, පුස්තකාල, තොරතුරු තාක්ෂණ හා පුහුණු පිළිබද කමිටුව**

i. මාර්ග සංවර්ධනය
ii. මාර්ග නඩත්තුව
iii. කාණු පද්ධති සංවර්ධනය
iv. ජල සැපයුම් සේවා හා ජල නල එළීම්
v. වීථි පහන්
vi. අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු
vii. යන්ත්‍ර සූත්‍ර කුලී පදනම මත සැපයීම්
viii. සංචාරක නිවාස හා විශ්‍රාම ශාලා
ix. පුස්තකාල කටයුතු
x. නැණ සළ පුහුණු මධ්‍යස්ථානය
xi. තොරතුරු තාක්ෂණ සංවර්ධනය

**7. සමාජ සවිබල ගැන්වීම් හා ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබද කමිටුව**

i. සුභසාධන වැඩසටහන්
ii. පුණ්‍යාධාර සම්බන්ධ කටයුතු
iii. වෘත්තීය පුහුණු වැඩසටහන්
iv. ස්වයංරැකියා උත්පාදන වැඩසටහන්
v. සුළු හා මධ්‍යපරිමාණ කර්මානත කරුවන් දිරිමත් කිරීමේ කටයුතු
vi. ප්‍රජා සංවර්ධන

**8. කාන්තා කටයුතු, පූර්ව ළමා විය, ළමා සහ මාතෘ සායන**

i. පූර්ව ළමා විය සංවර්ධන කටයුතු
ii. පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන
iii. ළමා හා මාතෘ සායන
iv. කාන්තා කටයුතු

මේකෙත් කාර්යභාරයන් සියල්ලම සභාගත කරලා තියෙනවා ඒ සඳහා ඔබතුමාලගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලීමක් කරනවා.

<u>**ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා.**</u>

ගරු නගරාධිපතිතුමනි, නගර සභා ආඥා පනත 26 වැනි වගන්තිය අනුව " *සෑම මහා නගර සභාවක් විසින් ම, එක් එක් වර්ෂයේ පළමු වරට පත්වන ඒ සභාවේ සාමාන්‍ය රැස්වීමේ දී මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවක් ද වෙනත් ස්ථාවර කමිටු දෙකකට නොඅඩු ගණනක් ද සභාවේ සභිකයන් අතුරින් ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් තෝරා පත් කර ගත යුතුය*"

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ඔව්, පනතේ කියලා තියෙනවා. අපි නමුත් යෝජනා කරලා තියෙනවා කමිටු සභාපතිවරුන් කමිටුවකට අපේ පහසුව සඳහා. අපි යෝජනා කරලා තියෙනවා ඔබතුමාලට ඒ පිළිබඳව මොනවා හරි අදහසක් තියෙනවා නම් කතා කරන්න පුළුවන්. අපි කමිටු සාමාජිකයන් හැටියට කමිටු සඳහා යෝජිත නාමලේඛනය ඉදිරිපත් කරල තියෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

එතුමා මතක් කළේ නීති ප්‍රශ්නයක්. අපි කලින් හුගාක් දුරට කළේ පූර්වගාමී නගර සභාව අනුව කටයුතු කිරීම. නමුත් අපි මෙදා සැරේ පටන් ගත්ත දා ඉඳන්ම පොතේ හැටියට යමු කියලයි කියන්නේ. මේක පනතේ නීති ප්‍රශ්නයක් හැටියටමයි තියෙන්නේ.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතීඥ රංජිත් රාජකරුණා මැතිතුමා</u>**.

ගරු නගරාධිපති තුමනි , අපේ මේ ඉන්දික මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා පනතේ වගන්තිය. එකේ කිසිම විවාදයක් නැහැ. නමුත් අපට ප්‍රායෝගික ප්‍රශ්නයක් තියෙනවා දැන් පෙර සභා වාරය වල නම් මන්ත්‍රීවරු 13 දෙනයි හිටියේ . අද විසි නව දෙනෙක් ඉන්නවා. දැන් මේ ඡන්ද පත්‍රිකා ක්‍රමයට යන්න ගියා නම් ඡන්ද පත්‍රිකා සකස් කරලා ගන්න මං හිතන්න කාර්ය මණ්ඩලයට පැය දෙකක් විතර යනවා. ඊට වඩා නරකද ඒ පනත එසේ තිබියදී අපි ප්‍රායෝගිකව දැන් මේ කියන තත්ත්වය නිසා ඔබතුමාලගේ අදහස් තියෙනවා නම් මේ කමිටු වල යම් වෙනසක් වෙන්න ඕනේ මොනව හරි සාමාජිකයින්ගේ සංයුතිය වෙනසක් වෙන්න ඕනේ යන කරුණු ගැන සාකච්ඡා කරලා මම හිතන්නේ ඡන්ද පත්‍රිකා වලට යන්න ගියොත් කමිටු තියනවා අටක සාමාජිකයින් තෝරන්න . සභාපතිවරු තෝරන්න ඕනේ. මේසා විශාල කාර්යභාරයක් යම් යම් අවස්ථා තියෙනවා දැන් අපි දන්නවා නීති පනත්වල '' යුතුය '' කියන වචනය ඉංග්‍රීසියෙන් '' shall '' කියලා අර්ථ නිරූපණය කරනවා. නමුත් යම් යම් අවස්ථාවල ඒ යුතුය කියන එකත් අධිකරණය තීරණය කරලා තියෙනවා. ඒක හැම වෙලාවෙම පළකිරීමේ න්‍යායක්ම අවශ්‍ය නෑ. අපට පුළුවන් ඒක එක්තරා ප්‍රමාණයක ප්‍රායෝගිකව ගන්ඩ. ඒක අධිකරණ වලත් තියනවා. ඒ නිසා මම හිතන්නේ මගේ අදහස නම් නගරාධිපතිතුමනි, මේ කටයුතු කරන්න ගියොත් අපට සෑහෙන වෙලාවක් යනවා. මොකද වෙනම ඡන්ද පත්‍රිකාව හදන්ඩ ඕනේ. ඉතින් මම හිතනවා , ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමණි, ඉන්දික අරුණ කුමාර මැතිතුමනි, මම හිතනවා වඩාත් ප්‍රායෝගික තත්ත්වය මීට වඩා යුතුය කියන වචනයට වඩා එකතුවෙලා සාකච්ඡා කරලා මේක කෙටියෙන් අවසන් කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි කියලා.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**.

මම ඉස්සරවෙලා කමිටු ටික යෝජනා කරන්නම් කමිටු සහ කමිටු සාමාජිකයන් ඊට පස්සේ ඔබතුමාලට කමිටු වල මොනවා හරි ගැටලුවක් තියෙනවා නම් සාකච්ඡා කරලා ඒකට කටයුතු කරමු. පනතේ පැහැදිලිව තියනවා සභාපති පත්කරගත යුතුය කියලා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමානි, ඔබතුමා කියන ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව නාගරික මන්ත්‍රී නීතීඥ රංජිත් රාජකරුණා මැතිතුමා පෙන්වා දුන් කරුණු පිළිබඳව එකඟ වෙනවා. නමුත් අපි නරක පූර්වාදර්ශයක් විය යුතුද සභාව ආරම්භයේ දීම කාලවේලා පිළිබඳව හිතලා පනත හැල්ලු කිරීමක් වෙනවා ද කියන එක පිළිබඳ ගැටලුවක් තියෙනවා.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**.

දැන් මම කමිටු ටික යෝජනා කරන කල් ඔබතුමාලා ඉන්නකෝ.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා</u>**.

දැන් මේ කාලය පිලිබඳ ගැටළුවක් තියෙනවනම් පනතේ 26 (10) (1) තියෙනවා ඒකට කරන්න පුළුවන් දේ. එකේ තියනව කාලය ඕන්නම් කාලය ගන්න හැටි එක පැහැදිලිව කියලා තියෙනවා '' ස්ථාවර කමිටු පත් කර ගැනීම, යම් වර්ෂයක දී පවත්වනු ලබන දෙවෙනි සාමාන්‍ය රැස්වීමට අඩාලව කල් තැබිය යුතු බව යෝජනා සම්මතයක් මගින් තීරණය කිරීම සභාව විසින් කළ හැකි අතර, එකී යම් යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසු ඒ තොරා පත් කර ගැනීම එසේ අඩාලව කල් තැබිය යුතුය. එවිට ඒ යෝජනා සම්මතයෙන් කරනු ලැබු වෙනස් කිරිමට පමණක් යටත් ව, (1) වන උප වගන්තියේ සිට (4) වන උප වගන්තිය දක්වා වු උප වගන්ති වල විධිවිධාන අදාල විය යුතුය'' ලෙස.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**.

දැන් මේ ඉදිරිපත් කර තියෙන ඒවා වල ගැටලුවක් තියෙනවා නම් අපි ඒවා හරිගස්ස ගමු.

**<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමා, අපි දැන් ඒ නීතිමය තත්වයන් නොසලකා ප්‍රායෝගික තත්වයන් පිළිබඳ සලකලා කටයුතු කරපු අවස්ථා මෙතුමා නියෝජනය කර කාලයේ දීත් තිබුණා නේ. එ් නිසා අපි එහෙමනං අපි එකඟ තාවයක් තියෙනවා ආණ්ඩු පක්ෂ කණ්ඩායම එකඟතාවක් තියෙනවා එකඟතාවයක් නැත්තේ විපක්ෂයේ ඉන්න කණ්ඩායම නේ. එහෙනම් අපි ඒ අයට අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව පමණක් දෙමු. අපේ ආණ්ඩු පක්ෂය එකඟතාවය තියෙනවනේ මේ කණ්ඩායමට අවස්ථාව දෙමු. හැබැයි අපි නගර සභාවේ දීර්ඝ කාලයක් කටයුතු කරලා තියෙනවා පනතෙන් නැති සමහර සිද්ධි සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ලබා ගෙන. ඉදිරියට එනවා ඒ කාලේ. ඒ නිසා එවටත් අපි පනතේ ආකාරයෙන්ම කටයුතු කරන්න කියන එකත් මම මතක් කරන්න කැමතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

මම දැන් මේ කමිටු ටිකයි කමිටු සාමාජික මණ්ඩලයයි යෝජනා කරන්නම් ඔබතුමාලාගෙන් කෙනෙක් ස්ථිර කරන්න ඊට පස්සේ අපි ඉදිරි කටයුතු බලමු. **<u>කමිටු සඳහා යෝජිත ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය</u>**

1. **මුදල් කමිටුව**
   i. ගරු නගරාධිපතිතුමා - සභාපති
   ii. ගරු නියෝජ්‍ය නගරාධිපති බුද්ධික ප්‍රේමදාස මැතිතුමා
   iii. ආනන්ද දහනායක මන්ත්‍රීතුමා
   iv. ආර්.ඒ. විමල් රවින්ද්‍ර රණසිංහ මන්ත්‍රීතුමා
   v. ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා
   vi. කේ.පී. අසේල ඉන්දික විජේසිංහ මන්ත්‍රීතුමා
2. **සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතික කමිටුව**

i. ගරු නියෝජ්‍ය නගරාධිපති බුද්ධික ප්‍රේමදාස මැතිතුමා - සභාපති
ii. දුමිදු දයාසෙන් රැටියල මන්ත්‍රීතුමා
iii. කේ.පී. සචිනි නිමේෂා මන්ත්‍රීතුමිය
iv. නදීර ප්‍රභාත් ධර්දාස මන්ත්‍රීතුමා
v. ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත්  කුමාර වැවේගෙදර මන්ත්‍රීතුමා
vi. එම්.එස්. මුහමඩ් අල් ෆාරිස්

### 3. ක්‍රීඩා, නිවාස, සංචාරක කමිටුව

i. දුමිදු දයාසෙන් රැටියල මන්ත්‍රීතුමා - සභාපති
ii. ඩබ්.එම්. සුපිනි සදමාලි මන්ත්‍රීතුමිය
iii. නදීර ප්‍රභාත් ධර්මදාස මන්ත්‍රීතුමා
iv. රශ්මික ගමආරච්චි මැතිතුමා
v. එච්.බී. සීතා හේරත් මන්ත්‍රීතුමිය
vi. එස්.ආර්.ඒ.සුරංගි රේණුකා මන්ත්‍රීතුමිය

### 4. නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන, ඉඩම් හා  දේපළ නිරවුල් කිරීම පිළිබද කමිටුව

i. රංජිත් රාජකාරුණා මන්ත්‍රීතුමා - සභාපති
ii. ඩී.එම්.කේ. විනෝදනී විජේසූරිය මන්ත්‍රීතුමිය
iii. ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මන්ත්‍රීතුමා
iv. කේ.ඒ. ඉන්ද්‍රාණි මන්ත්‍රීතුමිය
v. ආර්.ඒ. විමල් රවීන්ද්‍ර රණසිංහ මන්ත්‍රීතුමා
vi. රොෂාන් ඉස්මත් බුහාරි මන්ත්‍රීතුමා

### 5. පරිසර, කෘෂිකර්ම හා රථවාහන කමිටුව

i. ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මන්ත්‍රීතුමා - සභාපති
ii. නලින් සංජීව සිරිවර්ධන මන්ත්‍රිතුමා
iii. එම්.පී. මොහමඩ් අන්සාර් මන්ත්‍රීතුමා
iv. විරාජ් ධනංජය මන්ත්‍රීතුමා
v. ආනන්ද දහනායක මන්ත්‍රීතුමා
vi. ජේ.එම්. සමන් ප්‍රියන්ත ජයවර්ධන මන්ත්‍රීතුමා

### 6. යටිතල පහසුකම්, පුස්තකාල, තොරතුරු තාක්ෂණ හා පුහුණු පිළිබද කමිටුව

i. නලින් සංජීව සිරිවර්ධන මන්ත්‍රීතුමා - සභාපති

ii. රංජිත් රාජකාරුණා මන්ත්‍රීතුමා
iii. එම්.පී. මොහමඩ් අන්සාර් මන්ත්‍රීතුමා
iv. එල්.ජී. ජේමචන්ද්‍ර මන්ත්‍රීතුමා
v. ඩී.ජී. ජේමදාස මන්ත්‍රීතුමා
vi. ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මන්ත්‍රීතුමා

**7. සමාජ සවිබල ගැන්වීම් හා ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබද කමිටුව**

i. එල්.ජී. ජේමචන්ද්‍ර මන්ත්‍රීතුමා - සභාපති
ii. විරාජ් ධනංජය මන්ත්‍රීතුමා
iii. ඩබ්.එම්. සුපිනි සදමාලි මන්ත්‍රීතුමිය
iv. කේ.පී. සචිනි නිමේෂා මන්ත්‍රීතුමිය
v. ජේ.එම්. සමන් ප්‍රියන්ත ජයවර්ධන මන්ත්‍රීතුමා
vi. කේ.එස්.ටී. නිර්මලී ප්‍රියදර්ශනී මන්ත්‍රීතුමිය

**8. කාන්තා කටයුතු, පූර්ව ළමා විය, ළමා සහ මාතෘ සායන**

i. ඩබ්.එම්. සුපිනි සදමාලි මන්ත්‍රීතුමිය - සභාපති
ii. එස්.ආර්.ඒ. සුරංගි රේණුකා මන්ත්‍රීතුමිය
iii. කේ.පී. සචිනි නිමේෂා මන්ත්‍රීතුමිය
iv. එල්.ජී. ජේමචන්ද්‍ර මන්ත්‍රීතුමා
v. එම්.ඩී.කේ. විනෝදනී විජේසූරිය මන්ත්‍රීතුමිය
vi. ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා

මුදල් ස්ථාවර කමිටුව සඳහා නිල බලයෙන්ම කමිටු සභාපති නගරාධිපති වෙනවා. අපි ඉතුරු කමිටු සඳහා යෝජනා කරලා තියෙනවා සභාපතිවරුන්.

**<u>ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමා ඔබ විසින් ප්‍රකාශ කරන ලද කමිටු සාමාජික මණ්ඩලය සහ කමිටු නාම ලේඛනය මා ස්ථිර කරනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, සංශෝධනයක් තියෙනවා මුදල් ස්ථාවර කමිටුවෙන් මම ඉවත් වෙනවා. ඒ සඳහා මම යෝජනා කරනවා ගරු රවින්ද්‍ර රණසිංහ මැතිතුමා මුදල් ස්ථාවර කමිටුව පත් කරන්න කියලා.

එම යෝජනාවා සමන් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.පී. අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි මම මුදල් ස්ථාවර කමිටුවෙන් ඉවත් වෙනවා ඒ වෙනුවට ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමාව යෝජනා කරනවා.

ගරු නාගරික මන්ත්‍රී එච්.බී. සීතා හේරත් මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා.</u>**

සෞඛ්‍ය, ආගමික කමිටුවේ සාමාජික වන මම එයින් ඉවත් වෙනවා ඒ වෙනුවට අපේ අසේල ඉන්දික විජේසිංහ මැතිතුමාව එම කමිටුව සඳහා යෝජනා කරනවා.

- ගරු නාගරික මන්ත්‍රී එච්.බී. සීතා හේරත් මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

වෙනත් සංශෝධන තියෙනවද ? එහෙනම් ඒ සඳහා අත උස්සලා සම්මත කරන්න කමිටු.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ජේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

මම අර කාන්තා කටයුතු කමිටුවෙන් ඉල්ලා අස් වෙනවා.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**.

දැන් යම්කිසි සාමාජිකයෙක් ඉවත් වෙනවා නම් එ් වෙනුවට කමිටුවට කෙනෙකු යෝජනා කරන්න වෙනවා මෙතුවා දැන් කමිටුවෙන් ඉල්ලා අස්වුණා අපේ ඒ සඳහා වෙනත් මන්ත්‍රීවරයෙක් කවුරුහරි යෝජනා කරන්න.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතීඥ රංජිත් රාජකරුණා මැතිතුමා.</u>**

මම යෝජනා කරනවා එම කමිටුවට අපේ නීතිඥ ප්‍රියදර්ශනි කාරියවසම් මැතිනියව.

- ගරු නාගරික මන්ත්‍රී සුරංගි රේණුකා මැතිනිය විසින් එම යෝජනා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ජේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.

මේ දීලා තියන කමිටු සාමාජික විස්තරයේ ඇතැම් කමිටුවල එකම මන්ත්‍රීතුමා කමිටු 03 ට යෝජනා කරලා තියනවා. ඒක සංශෝධනය විය යුතුයි.

ඒ අනුව, සංශෝධනය කරන ලද කමිටු සාමාජික මණ්ඩලය පහත සඳහන් පරිදි සභාවට ඉදිරිපත් කරන ලදී.

***1. මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව***

i. ගරු නගරාධිපති - එච්.පී. සෝමදාස - කමිටු සභාපති

ii. ගරු නියෝජ්‍ය නගරාධිපති එම්.ඩබ්. ප්‍රේමදාස මැතිතුමා - කමිටු සාමාජික

iii. ගරු නාගරික මන්ත්‍රී ආනන්ද දහනායක මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iv. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ. විමල් රවීන්ද්‍ර රණසිංහ මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

v. ගරු නාගරික මන්ත්‍රී ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

vi. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත් කීර්ති වැවේගෙදර මන්ත්‍රීතුමා- කමිටු සාමාජික

***2. සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතික කමිටුව***

i. ගරු නියෝජ්‍ය නගරාධිපති බුද්ධික ප්‍රේමදාස මැතිතුමා - කමිටු සභාපති

ii. ගරු නාගරික මන්ත්‍රී දුමිදු දයාසෙන් රැටියල මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iii. ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්දාස මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iv. ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

v. ගරු නාගරික මන්ත්‍රී අසේල ඉන්දික විජේසිංහ මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

vi. ගරු නාගරික මන්ත්‍රී එම්.එස්. මුහමඞ් අල් ෆාරිස් මැතිතුමා - කමිටු සාමාජික

***3. ක්‍රීඩා, නිවාස, සංචාරක කමිටුව***

i. ගරු නාගරික මන්ත්‍රී දුමිදු දයාසෙන් රැටියල මන්ත්‍රීතුමා - කමිටු සභාපති

ii. ගරු නාගරික මන්ත්‍රී සුරංගි රේණුකා සමරතුංග මන්ත්‍රීතුමිය - කමිටු සාමාජික

iii. ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iv. ගරු නාගරික මන්ත්‍රී රශ්මික ගමආරච්චි මැතිතුමා - කමිටු සාමාජික

v. ගරු නාගරික මන්ත්‍රී සමන් ප්‍රියන්ත ජයවර්ධන මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

vi. ගරු නාගරික මන්ත්‍රී එච්.බී. සීතා හේරත් මන්ත්‍රීතුමිය - කමිටු සාමාජික

***4. නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන, ඉඩම් හා දේපළ නිරවුල් කිරීම පිළිබඳ කමිටුව***

i. ගරු නාගරික මන්ත්‍රී රංජිත් රාජකාරුණා මන්ත්‍රීතුමා - කමිටු සභාපති

ii. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iii. ගරු නාගරික මන්ත්‍රී ඩී.එම්.කේ. විනෝදනී විජේසූරිය මන්ත්‍රීතුමිය - කමිටු සාමාජික

iv. ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

v. ගරු නාගරික මන්ත්‍රී රොෂාන් ඉස්මත් බුහාරි මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

vi. ගරු නාගරික මන්ත්‍රී කේ.ඒ. ඉන්ද්‍රාණි මන්ත්‍රීතුමිය - කමිටු සාමාජික

***5. පරිසර, කෘෂිකර්ම හා රථවාහන කමිටුව***

i. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මන්ත්‍රීතුමා - කමිටු සභාපති

ii. ගරු නාගරික මන්ත්‍රී ආනන්ද දහනායක මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iii. ගරු නාගරික මන්ත්‍රී නලින් සංජීව සිරිවර්ධන මන්ත්‍රිතුමා - කමිටු සාමාජික

iv. ගරු නාගරික මන්ත්‍රී එම්.පී. මොහමඩ් අන්සාර් මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

v. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. විමුක්ති රණසිංහ මන්ත්‍රීතුමා- කමිටු සාමාජික

vi. ගරු නාගරික මන්ත්‍රී ජේ.එම්. සමන් ප්‍රියන්ත ජයවර්ධන මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

***6. යටිතල පහසුකම්, පුස්තකාල, තොරතුරු තාක්ෂණ හා පුහුණු පිළිබඳ කමිටුව***

i. ගරු නාගරික මන්ත්‍රී නලින් සංජීව සිරිවර්ධන මන්ත්‍රිතුමා - කමිටු සභාපති

ii. ගරු නාගරික මන්ත්‍රී රංජිත් රාජකාරුණා මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iii. ගරු නාගරික මන්ත්‍රී එම්.පී. මොහමඩ් අන්සාර් මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

iv. ගරු නාගරික මන්ත්‍රී ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

v. ගරු නාගරික මන්ත්‍රී ඩී.ජී. ප්‍රේමදාස මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

vi. ගරු නාගරික මන්ත්‍රී ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මන්ත්‍රීතුමා - කමිටු සාමාජික

***7. සමාජ සවිබල ගැන්වීම් හා ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබඳ කමිටුව***

i. ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමා - කමිටු සභාපති

ii. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. විමුක්ති රණසිංහ මන්ත්‍රීතුමා- කමිටු සාමාජික

iii. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. සුපිනි සදමාලි මන්ත්‍රීතුමිය - කමිටු සාමාජික

iv. ගරු නාගරික මන්ත්‍රී කේ.පී. සචිනි නිමේෂා මන්ත්‍රීතුමිය - කමිටු සාමාජික

v. ගරු නාගරික මන්ත්‍රී කේ.එස්.ටී. නිර්මලී ප්‍රියදර්ශනී මන්ත්‍රීතුමිය - කමිටු සාමාජික

vii. ගරු නාගරික මන්ත්‍රී එම්.එස්. මුහමඩ් අල් ෆාරිස් මැතිතුමා - කමිටු සාමාජික

***8. කාන්තා කටයුතු, පූර්ව ළමා විය, ළමා සහ මාතෘ සායන කටයුතු පිළිබඳ කමිටුව***

| | | |
|---|---|---|
| i. | ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. සුපිනි සඳමාලි මන්ත්‍රීතුමිය | - කමිටු සභාපති |
| ii. | ගරු නාගරික මන්ත්‍රී එස්.ආර්.ඒ. සුරංගි රේණුකා මන්ත්‍රීතුමිය | - කමිටු සාමාජික |
| iii. | ගරු නාගරික මන්ත්‍රී කේ.පී. සචිනි නිමේෂා මන්ත්‍රීතුමිය | - කමිටු සාමාජික |
| iv. | ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ජේමචන්ද්‍ර මන්ත්‍රීතුමා | - කමිටු සාමාජික |
| v. | ගරු නාගරික මන්ත්‍රී එම්.ඩී.කේ. විනෝදනී විජේසූරිය මන්ත්‍රීතුමිය | - කමිටු සාමාජික |
| vi. | ගරු නාගරික මන්ත්‍රී කේ.එස්.ටී. නිර්මලී ප්‍රියදර්ශනී මන්ත්‍රීතුමිය | - කමිටු සාමාජික |

- *කමිටු සාමාජික මණ්ඩලය පත් කිරීම සඳහා ඡන්දය විමසීම.*

| | | |
|---|---|---|
| පක්ෂව ලබා දුන් ඡන්ද ප්‍රමාණය | - | 15 |
| විපක්ෂව ලබා දුන් ඡන්ද ප්‍රමාණය | - | 13 |
| ඡන්දය දීමෙන් වැලකී සිටීම | - | 01 |

ඒ අනුව කමිටු සඳහා පත් කරන ලද සාමාජික මණ්ඩලය වැඩි ඡන්ද 02 කින් සංශෝධනයන් ට යටත්ව සභා සම්මත විය.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

එහෙනම් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. සියලුම මන්ත්‍රීතුමියන්ලාට මන්ත්‍රීතුමාලට මේ මංගල සභා රැස්වීම් අවස්ථාවට සහභාගි වෙලා සිටීම පිළිබඳව. තමුන්නාන්සේලා සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා.

දැන් මේ මාස 20 ක් පමණ කාලයක් මේ සභාවේ මහජන නියෝජිතයින් නැතුව තිබිලා, පහුගිය පෙබරවාරි 10 වැනිදා පවත්වපු මැතිවරණයෙන් ලංකාවේ පළවෙනි වතාවට බිහිවූ ලාබාලම පක්ෂය හැටියට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරලා පවත්වන මංගල මහා සභාව, මේ සභාව සඳහා අද මන්ත්‍රීවරු සියලු දෙනාම දෙපැත්තම කණ්ඩායම් මෙතැන පක්ෂ තුනක් හතරක් තියෙනවා.  ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉන්නවා, එක්සත් ජාතික පක්ෂයේ ඉන්නවා, ජනතා විමුක්ති පෙරමුණ ඉන්නවා, මුස්ලිම් කොන්ග්‍රස් පක්ෂය ඉන්නවා ඉන්නවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉන්නවා. පක්ෂ 4ක් සහභාගී වෙනවා ඉතින් මේ සියලු දෙනාටම  නැවත වතාවක් මම ස්තුතිවන්ත වෙනවා අද කිසිම භේදයකින් තොරව මේ සභාවට පැමිණිලා සභාව සාර්ථක කරගන්න, නගරයට සේවයක් කරන්න තමුන්නාන්සේලා සහභාගි වීම ගැන ස්තුති වන්ත වෙනවා.

තමුන්නාන්සේලාට මාස 20 ක කාලය තුළ මේ සභාවේ මේ අනුරාධපුර වර්ග කිලෝමීටර 36 තුළ ජනතාවට සේවයක් කරන්න දුන්න අවස්ථාව අහිමි වෙලා දැන් ඒ අවස්ථාව ලබාගෙන, ඒ අවස්ථාවේ තමුන්නාන්සේලා මේ සභාවට ඇවිල්ලා ඒ වාසනාව ලැබිලා තියෙන්නේ තිස් පන්දාහක් විතර ජනතාවගෙන් , මේ තමුන්නාන්සේලා විසිනම දෙනා ට. මම ප්‍රථමයෙන්ම අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්නම් ඒ අනුව, නලීන් සිරිවර්ධන මන්ත්‍රිතුමාට ආරාධනා කරනවා ඔබතුමාගේ අදහස් මේ සභාවේ ඉදිරිපත් කරන ලෙස.

**<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මන්ත්‍රීතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි මම හිතනවා අලුත් නගර සභාවේ අපිට නුහුරු අත්දැකීමකට තමයි අරම්භක අවස්ථාව තියෙන්නේ. විශාල මන්ත්‍රීවරු සංඛ්‍යාවක් නගරය පාලනය කිරීමට මහජනතාව විසින් සහ, පනතේ ආනුභාවයෙන් පත්කරලා තියෙන්නේ. විශේෂයෙන්ම මට ස්තුති කිරීමට ලැබෙන අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා. පළවෙනි කතාව විදිහට කරද්දී මේක විශේෂයෙන්ම ඉන්පස්සේ එන කතාවන්ට ඇතැම්විට පසුබිම් වෙනවා. සමහර කරුණු කාරණා වලටත් යොදා ගන්නේ සහ ඉතාමත් පරෙස්සමෙන් කළ යුතු කතාවක් වෙනවා.

ගරු නගරාධිපති තුමනි, ස්තුතිය පළ කිරීම ආරම්භයේ දීම කලයුතුයි කියන එක මම අදහස් කරනවා. මම හිතන්නේ වසර 14ක කාලයක් පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යංශය හැරුණාම ඉතුරු සියලුම අමාත්‍යාංශවල සම්බන්ධීකරණ ලේකම් වරයෙක් හැටියට පළාත් සභා සභාපති කාර්යාලය ඇතුළත අනිත් සියලුම අමාත්‍යාංශවල කටයුතු කරන්න අවස්ථාව දීපු කේ.එච්. නන්දසේන ඇමතිතුමාට විශේෂයෙන් පළවෙනි ස්තුතිය හිමිවෙනවා . ඒ වගේම අපේ ආසන සංවිධායක එච්.බී. සේමසිංහ ඇමතිතුමාට මට මේ දේශපාලනයට එන්න අවස්ථාව උදාකර දීම සම්බන්ධයෙන් එතුමාටත් ස්තුතිවන්ත වෙනවා.  අපේ දේශපාලන අධිකාරිය නියෝජනය කරන සහ අඛණ්ඩව තුන්වන මැතිවරණය දක්වා රැඳී සිටිය සහ උපකාර කර පාක්ෂිකයන් , හිතවතුන් හා ආධාරකරුවන් සියලු දෙනාටම ස්තුතිය ප්‍රකාශ කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා.

දෙවැනි අවස්ථාව මම ස්තුතිය පළ කරන්න යොදා ගන්නවා මන්ත්‍රී වරයෙක් වෙන්න ඡන්දයක් මෙහෙයවන එක කරන්න පුළුවන් හැමෝටම. මේ පනතේ සංශෝධන අනුව මන්ත්‍රීවරු පත් වෙලා තියෙනවා දේශපාලනය පළාත් පාලනයේ සිට පළාත් සභාව , පාර්ලිමේන්තුව දක්වා පත්වන මහජන නියෝජිතයන්ට මහජන නියෝජිතයින් විදියට කටයුතු කරන්න ඕන කොහොමද කියන එක. ඒ ගැඹුර ඡන්දයක් තියන්න පාවිච්චි කරන උපාය මාර්ග වලට අමතරව මහජන සේවා

නිසියාකාරව පවත්වාගෙන යන්නේ කොහොමද ඉෂ්ට කරන්නේ කොහොමද කියන එක, ඒ ගැඹුර දර්ශනය හැකියාව ආයතනයකින් දේශපාලන කරන්නේ කොහොමද මොන වගේ සේවාවන් ද කියන, එක තේරුම් කරල දීපු මගේ තාත්තට ස්තූතිය පළ කරනවා. ඒ මොකද අවුරුදු 40ක පළාත්පාලන සේවය අනුරාධපුර මහ නගර සභාව ඇතුළු දෙහිවල-ගල්කිස්ස ,කොළඹ ,මාතර නගර සභා වල නිලධාරියෙක් විදිහට සේවය කරලා, දේශපාලනයට එද්දී මට විශාල දැනුමක් ඒකරාශි කර දීලා තිබුනා. ඒ වගේම මට උපදෙස් දුන්නේ මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන් හැබැයි නියම මහජන නියෝජිතයෙක් වෙන්නේ කොහොමද කියන එක.මට දෙන ගුරුහරුකම් වෙනුවෙන් ලබාදෙන සහයෝගය වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙනවා.

ඒවගේම මේ සියල්ල, මේ අපේ ජයග්‍රහණය අපි කොට්ඨාස 14 ක්ම ජයග්‍රහණය කරා කොට්ඨාස දාහතරයි බහු කොට්ඨාස එකයි ඒ අනුව මන්ත්‍රීවරු පහළොවක්ම පත් කරගන්න හැකියාව ලැබුණා. ශ්‍රී ලංකාවේ 45%ක ජයග්‍රහණයක් ලබාගත්තා. මේ ජයග්‍රහණය පිටුපස යෝධ සෙවනැල්ල හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඊළඟ ස්තූතිය පළ කළ යුතු වෙනවා, එතුමාගේ දර්ශනය එතුමාගේ දේශපාලන භාවිතය සහ එතුමා ලබාගත් පුද්ගල කීර්තිය මේ අපේ ජයග්‍රහණ වල බාගෙට බාගයක් ඇතුලෙ හැංගිලා තියන යෝධ ශක්තිය. ඒ වගේම අපිත් එක්ක සෘජුවම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත් එක්ක එකතු වන පක්ෂ සහ සෘජුවම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලබාගත් සාමාජික පක්ෂ හා ඒ හා බැඳුණු අනෙකුත් පක්ෂ සියලු කණ්ඩායම් වල ජයග්‍රහණ එතුමාගේ තියෙන පෞද්ගලික කීර්තිනාමය ගොඩනඟාගත්ත කීර්තිනාමය නිසා වෙනවා. ඒ අනුව මම නැවතත් එතුමාට ස්තූතිවන්ත වෙනවා . මැතිවරණ ව්‍යාපාරය අප සියලුම පාක්ෂිකයන් ජයග්‍රහණය ලැබුවා. අපි කණ්ඩායමක් විදියට ඒකරාශී වෙලා වැඩ කරපු නිසා අපි අතර ඡන්දෙදි ගැටුම් තිබුනෙ නෑ. හැබැයි ඒක මේ මැතිවරණ ක්‍රමය තුළ තිබුන හොඳ ලක්ෂණයක්. මැතිවරණ ක්‍රමයේ හොඳ නරක දෙකම තියෙනවා.

මේ මැතිවරණ ක්‍රමයේ දී තිබුණ හොඳක් තමයි අපි අතර ගැටුම් නැහැ මනාප තරග නෑ. ඒවා කලින් තිබූ නිසා තමයි මුලින් ගැටුම් තිබුනේ ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය බිහි කිරීම සම්බන්ධයෙන් අඩුපාඩු ඇතිව හෝ බිහි කිරීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත විය යුතුයි . ඇත්තටම මේ අඩුපාඩුව සිද්ද උනේ මේක හරියටම හදලා තිබ්බ මැතිවරණ ක්‍රමයක් මේ මැතිවරණ ක්‍රමය හැදුවේ මහාචාර්ය සුදන්ත ලියනගේ, එතුමා හදපු එක 2015දි වෙනස් වුණා , 2015දී තැනින් තැනින් ඇදලා වෙනස් කරන්න ගත්ත නිසා මේකේ අඩුපාඩු ඇති වුණා නැත්නම් මේක හරියට හදපු මැතිවරණ ක්‍රමයක් මේක හොඳ මැතිවරණ ක්‍රමයක් පසුව තමයි වෙනස් වුණේ , ඒ නිසා එයට අපි ස්තූතිවන්ත වෙනවා මෙපමණ මහජන නියෝජිතයන් ප්‍රමාණයක් මේ නගරයට ලබාදීම ගැන. ඇත්තටම කලින් හිටියේ මහජන නියෝජිතයන් 13 දෙනයි ආණ්ඩු පක්ෂ 10 විපක්ෂයෙන් තුන්දෙනයි. මේ බහුතරයට වැඩි සේවයක් ලබාදෙන්න මහජන නියෝජිතයන් වැඩි කිරීම සම්බන්ධයෙන් මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් මේ ගැටුම් අවම කිරීම සම්බන්ධයෙන් ස්තූතියි කළ යුතුයි. ඒ වගේම ලබාදීපු කෙටි කාලය නිසා මම කෙටියෙන් අවසන් කරන්නම් එසේම මේ ජයග්‍රහණය පිටිපස්සේ අපේ පහුගිය අවුරුදු හතරක පමණ කාලය රැඳිලා තියෙනවා ඒකේ සෙවනැල්ලක් තියෙනවා, ඒකේ ආනුභාවයක් තියෙනවා .

අද අපේ විපක්ෂයේ වාඩි වෙලා හිටියත් අපේ හිටපු නියෝජ්‍ය නගරාධිපති තුමා, එතුමා විශාල සේවයක් කරපු නායකයෙක්. පරිනත සේවයක් කරපු නායකයෙක් . අපේ සමන් මන්ත්‍රීතුමා අපි කණ්ඩායමක් විදියට කරපු සේවයක් විදිහට, විපක්ෂ නායක හැටියට කටයුතු කරපු ඉන්දික අරුණ කුමාර මැතිතුමා, අපි ඔබතුමාලා එකතුවෙලා සභාවේ වසර හතරක පාලන කාලයේ කරපු සේවාව නගරයේ ජනතාව ප්‍රතික්ෂේප කළා නම්, මේක මට විතරක් තනියම දිනවන්න බැහැ 50% කල් ක්‍රියාව, පාලනය බලනවා. ඒ නිසා ඔබතුමාගේ නායකත්වය යටතේ අපේ කාර්යභාරය කිරීමට සහාය දීමට,

හිටපු නාගරික කොමසාරිස්තුමා ඒවගේම ගණකාධිකාරි තුමා ඇතුළු සියළුම සනිපාරක්ශක කම්කරුවාගේ සිට නාගරික කොමසාරිස්වරයා දක්වා සියලු නිලධාරීන් ට ගෞරවයෙන් අඩක් හිමිවිය යුතුයි. ඒ අය අපට සහයෝගය ලබාදුන් නැත්තං මේ ගමන එන්න හම්බවෙන්නෑ. ඒ නිසා විශේෂයෙන් ඒ නිලධාරි මණ්ඩලයට ස්තුතිවන්ත විය යුතුයි. ඒ වගේම අපේ අසීරු අවස්ථා වල හිටපු අමාත්‍යවරුන් ,විෂයභාර ඇමැතිවරු විදිහට දිවංගත බර්ට් ප්‍රේමලාල් ඇමතිතුමා ගේ ඉඳලා පේසල ජයවර්ධන අමාත්‍යතුමා දක්වා, මේ ප්‍රධාන අමාත්‍යවරු විවිධ අවස්ථාවල විවිධ දේශපාලන මතවාද ගැටුම් වල හිටියත්, මේ නගර සභාව වෙනුවෙන් මේ නගර සභාවේ ඉදිරි ඉදිරිගමන වෙනුවෙන් අරමුදල් සම්පාදනය කර ගැනීම සම්බන්ධයෙන් අපිට සහයෝගය ලබා දීල තියෙනවා. ඒ සහයත් එක්ක තමයි අපි එද්දි තිබ්බ කෝටි 13 ක අපේ අය වැය අපි යද්දි කෝටි සිය ඉක්මවූවා. අවුරුදු හතරක කාලය තුලදී එසේ ඉදිරියට ගෙන යන්ඩ ගුරු හරුකම් ලැබුණේ පළාත් සභාවේ ඉඳල නගර සභාව දක්වා දීපු සහයෝගය විශේෂයෙන්ම මතක් කිරීමක් කරන්න ඕන මුද්දර ගාස්තුව , දඩ මුදල් මහා නගර සභාවට ආදායමක් හැටියට ගේන්න අපේ හිටපු නියෝජ්‍ය නගරාධිපති නීතීඥ පේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා සෑහෙන මහන්සියක් ගත්තා.

ඉතිං ඒ වගේම මේ ක්‍රියාවලියේ කිසිම තැනක බාධාවක් ඇති නොවෙන්න තත්ත්වය ඉහළ දාන්න පුළුවන් වුණ නිසා කෝටි සීයක් ඉක්මවලා අය වැයක් අවසානයට සම්මත කරල කටයුතු කළා. මම හිතනවා මේ පිළිබඳ අපි සැලකිලිමත් වෙනවා නම් පළාත් සභාවේ සියලු අමාත්‍යංශවල විෂයන් වලට සමානව අපේ මේ පළාත් පාලන ආයතනය නගර සභාවේ විෂයන් ගෙනියන්න පුළුවන්කම තියෙනවා . ඉතින් මේ සම්බන්ධයෙන් දේශපාලන අධිකාරියට මෙන්ම නිලධාරීන්ටත් ගෞරවය හිමිවිය යුතුයි. අවසාන වශයෙන් මම කියන්න කැමතියි මේ සියලුම දේට නායකත්වයක් තියෙන්න ඕන. ඒ වගේම නායකත්වයට එ්කකට මන්ත්‍රීවරු කණ්ඩායමක් ඉන්නත් ඕනේ . දැන් නායකයා ඍජුව නැති හැම වෙලාවකටම ඕනෑම ආයතනයක් කඩා වැටෙනවා .එහෙම වුනොත් නගර සභාවත් ඒ තත්ත්වය තමයි.

දැන් මේ නිසා අපේ රටට වෙලා තියෙන්නෙත් ඒක . මොන පක්ෂයෙන් හරි, පක්ෂ නෙමේ වැදගත් වෙන්නේ පක්ෂ නායකයා කවුරුහරි තීන්දු තීරණ ගැනීමේ කොන්ද කෙලින් තියන් තීන්දු තීරණ ගන්න පුළුවන් වෙන්න ඕනේ. මේ සඳහා සුදුසු නායකත්වයක් ඔබතුමාට තියෙනවා. අපි අතරත් මත ගැටුම් තියෙනවා ගිය පාරත් පාලන කාලයේ මට මතකයි මතගැටුම් තිබ්බා අපි ඔබතුමාට එරෙහි වෙච්ච අවස්ථා තිබුණා. ඇතුලේ වාද විවාද කර ගත්තත්, අවසානයේදී එලියට අපි තනි කණ්ඩායමක් හැටියට එකතු වෙලා වැඩ කරලා ජයග්‍රහණය කළා. ඒක තමයි අපේ සන්ධිස්ථානය . අපේ ජයග්‍රහණය පසුබිම. ඒ නිසා මම කියන්න කැමතියි අපේ හිටියේ මේක සංරක්ෂක මණ්ඩල කාලයේ චන්ද්‍ර බණ්ඩාර මැතිතුමා ඉඳල තියනවා,ඊ ගාවට ජයසේන දිසානායක මැතිතුමා, ඊළඟට, බී.කේ.එල්. ඩයස් මැතිතුමා ඉඳලා තියනවා. ඊළඟට ලංකා කිත්සිරි කල්දේරා මැතිතුමා ඉඳලා තියෙනවා. ඊළඟට ඔබතුමා. ඒ් එක්කෙනෙක් වත් දේශපාලන පරම්පරාවෙන් ආපු අය නෙවෙයි. කිසි කෙනෙක් පරම්පරාවෙන් ආපු අය නෙමෙයි. හැබැයි අපේ නගර සභාවේ වේවා මේ ලංකාවේ කිසිම පළාත් පාලන ආයතනයක් වේවා කිසිම තැනක් දේශපාලන ක්ෂේත්‍රයේ දේශපාලන පරම්පරාවේ ගුරු හරුකම් දීපු අය නෑ. මේ මහජන නියෝජිතයන්ට ආසන සංවිධායක සියලු දෙනාට මේ කීර්තියේ කොටසක් හිමිවිය යුතුයි දේශපාලන පරම්පරාවලට නැතුව තාත්තලා අම්මලාගෙ අනුභවයක් නැතුව සහෝදර සහෝදරියන් ගේ ආනුභාවයක් නැතුව ආපු සංරක්ෂණ සභාපතිවරු, නගර සභා සභාපතිවරු හා මහා නගර සභා නගරාධිපතිවරු පත් කරල තියනවා. ඒ නිසා අපේ නගරය මුලු ලංකාවටම ආදර්ශයක්. ඉදිරියටත් ඒක එහෙම වෙන්න ඕනේ. කාගෙවත් බැලමෙහෙවරකම් කරපු බත් ගොට්ටෝ මේ ප්‍රධාන තනතුරුවලට එන්න ඕනේ නෑ.. ඒ අතින් මම හිතන්නේ ඔබතුමා ඒ කීර්ති නාමය රැක ගන්න සමත් වුණා.

විශේෂයෙන් කියන්න ඕනේ අහඹු ජයග්‍රහණයක් නෙමෙයි මේ නගර සභාව ඒ වගේම මෙතනින් එහාට කතා වලට එන යම්කිසි තැනක හේතුවක් වෙයි කියලා.

මම මේ අදහසත් කියන්න ඕනේ ඔබතුමා නායකත්වය ලබාගැනීම සම්බන්ධයෙන් අපේ කණ්ඩායමේ කාටවත් කිසිම ගැටලුවක් නෑ .මොකද අපි පක්ෂයක් විදිහට අපේ පක්ෂය කළමනාකරණය හසුරවන්නේ බැසිල් රාජපක්ෂ මැතිතුමා හිටපු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාත් හදලා තියන නිශ්චිත ක්‍රමවේදයක් යටතේ ලකුණු දෙන්න. ඒ ක්‍රමවේදයට තමයි අපේ පළාත් පාලන ආයතන අතර ප්‍රධානීන් පත් වුණේ. පටිපාටිගත ලකුණු කපන ක්‍රමයකුත් තිබුණා. ලකුණු දෙන ක්‍රමය වගේම ලකුණු 50 කපන ක්‍රමයකුත් තිබුණා. යම් යම් වැරදි කීපයක් තියනවා මේ වැරදි තිබුණත් එ් වැරදි වලට වරදකරු වෙලා තිබුනොත් ලකුණු කපලා ඉවත් කරනවා. අපි මේ හැමෝම කොට්ඨාශ අංකයකට එක් එක් පක්ෂ සලකුණු වලින් තරග කරපු අය. මන්ත්‍රීධූර අයිති පක්ෂයට, පුද්ගල ජනප්‍රියතාවයට ලැබුණු ඡන්ද යම් ප්‍රමාණයක් තියෙනවා. හැබැයි ඒ වගේම තරග කරපු සභාව අනුව ඒ පනතේ තියෙන ක්‍රමවේදය අනුව මන්ත්‍රී ධූරයට වැඩි අයිතියක් පක්ෂයට තියනවා.

ඒ නිසා මම කියන්ඩ ඕනෑ අපේ ජයග්‍රහණ සඳහා විවිධ මත මේ නගරයේ ජනතාව අතර මෙන්ම, මේ එන සියලු දෙනාත් විවිධ මට්ටම් වලින් ඇති නමුත් නිශ්චිත ක්‍රමවේදවලට අනුව පත් වුණ නගර සභාව මම හිතන්නේ ඒකේ ලකුණුදීම ඒ පරිපාටියක් ඇතුව තමයි පත්වුනේ. වැඩිම මනාප කොට්ඨාසයටත් තරග කළේ අපේ ප්‍රේමචන්ද්‍ර සහෝදරයා, එතුමාගේ තමයි වැඩිපුරම ජයග්‍රහණය කරපු කොට්ඨාශය. ජේෂ්ඨ ධූරය ගත්තොත් අපේ ආනන්ද දහනායක මන්ත්‍රීතුමා. එතුමා ජෝෂ්ඨතම මන්ත්‍රී අවුරුදු විසි හයක් අඛණ්ඩව මේ සභාවේ. වරක් නියෝජ්‍ය නගරාධිපති ධූරයකුත් දැරුවා යම් කාලසීමාවක. අද වෙනකොට ජේෂ්ඨතම මන්ත්‍රී ඒ අනුව යම් ලකුණු දීමේ ක්‍රමවේදයක් තිබුණා. නිර්නායක 12 ක් යටතේ තමයි අපේ පක්ෂ ආයතන ප්‍රධානින් තේරුවේ ඒ යටතේ තමයි නගරාධිපති ධූරය ඔබතුමාට ලැබුණේ. නියෝජ්‍ය නගරාධිපති ධූරය අපේ බුද්ධික මැතිතුමාට ලැබුණේ. ඉතින් මේ සියලුම ක්‍රමවේද ඔක්කොම විවෘත යි. මෙතුමා අපිට ශක්තිමත් ඉදිරි ගමනක් යන්නට හොඳ නායකත්වයක් ලබා දීලා තියනවා මම හිතනවා හොඳ කෙනෙක් පත්වෙලා තියෙනවා සහ විවිධාකාරයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් හොඳ කණ්ඩායමක් ලැබිලා තියෙනවා . ඒ 29 දෙනා මේ අතර,නගරාධිපති ධූරය සහ නියෝජ්‍ය නගරාධිපතිධූරයත් ඇරුනහම වෙන ම කිසිම ධූරයක් මේ නගර සභාවේ නැහැ. ඒ නිසා අපි කණ්ඩායමක් විදිහට සියලු දෙනාටම සමාන අයිතිවාසිකම් තියෙනවා තමන් තෝරා පත්කරගෙන එවපු නගරයේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න. විශේෂයෙන් ජයග්‍රහණය කරපු මන්ත්‍රිතුමාට කොට්ඨාසය වෙනුවෙන් කටයුතු කරන්න අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ නිසා මම අද මේ ප්‍රථම රැස්වීම නිසාම මේ පැහැදිලි කිරීම් කළේ.

ඒ අනුව අපිට මින් ඉදිරියට මෙම නගරයේ ජනතාව වෙනුවෙන් කටයුතු කරගෙන යන්න මහජන සේවා විදිහට සලකලා ඉදිරි කටයුතු කරගෙන යන්න වාසනාව උදාවේවායි, වාසනාව - හැකියාව ලැබේවායි, ශක්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසන් කරනවා. ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

අපේ ඊළඟ අවස්ථාව හැටියට කාන්තා නියෝජනයක් ලෙස එච්.බී. සීතා. හේරත් මන්ත්‍රි තුමියට ආරාධනා කර සිටිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රි සීතා හේරත් මැතිතුමිය.</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි , ගරු මන්ත්‍රීවරියනි, බුද්ධගයා ප්‍රදේශයේ ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂිකාවක් ලෙස මා ඉදිරිපත් වුණා. අප නගර සභා බල ප්‍රදේශය තුල ජනතා විමුක්ති

පෙරමුණේ ජනතාවගේ ඡන්ද ප්‍රමාණය අනුව ලැයිස්තුවෙන් ලත් මන්ත්‍රීවරියක් හැටියට මේ මහා නගර සභාවට මා තේරී පත්වුණා.  අප පක්ෂය වෙනුවෙන් ඡන්දය ලබාදුන් සියළුම ඡන්ද දායක ජනතාවට මගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරන්න කැමතියි.  ඒ වගේම අප ජනතා විමුක්ති පෙරමුණේ නවක මන්ත්‍රීවරියක් විදිහට නගර සභාවට තෝරා පත් කර ගන්නා ලද ජනතාව වෙනුවෙන් , මෙය තුළ පොදු ජනතාව වෙනුවෙන් කරන පොදු සේවා සඳහා ඇප කැප වී කටයුතු කිරීමට මා සමඟ සිටින මන්ත්‍රීවරුන් දෙදෙනා සූදානම් වන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. ඒවගේම මේ සභාව තුල මහජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කරන සියලුම කටයුතු සඳහා කරන ඕනෑම තීරණයකට එකඟව කටයුතු කිරීමට අප පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙපළ සහ මම එකඟ වන බවද මා ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වගේම ඉදිරියට තිබෙන සියලුම කටයුතු සාර්ථකව කරගැනීමට එකමුතුව සියලුදෙනාටම සහයෝගයෙන් කටයුතු කිරීමට හැකියාව ලැබෙන බව ප්‍රකාශ කරමින් මගේ කතාව අවසන් කරනවා ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තූතියි මන්ත්‍රීතුමිය මා දැන් අවස්ථාව ලබාදෙනවා ශිවන්ත මලික් කුමාර මන්ත්‍රිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී ශිවන්ත මලික් කුමාර මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමා, නියෝජ්‍ය නගරාධිපතිතුමා , විපක්ෂ නායක තුමා ඇතුළු සියලුම මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. මා මුලින්ම ගරු නගරාධිපතිතුමාටත්, ගරු නියෝජ්‍ය නගරාධිපති තුමාටත් ,විපක්ෂ නායකතුමාටත් , නාගරික මන්ත්‍රී මණ්ඩලයටත් සුභ පතනවා.

මා නියෝජනය කළේ පෑනිස්පුර කොට්ඨාසය. දේශපාලනයට පැමිණීමට උදව් උපකාර කළ අපේ බටහිර ආසන සංවිධායක පී. හැරිසන් මැතිතුමාට මුලින්ම ස්තුතිවන්ත වෙනවා, ඒ වගේම නැගෙනහිර ආසන සංවිධායක චන්ද්‍රානි බණ්ඩාර මැතිනියටත් මාගේ ගෞරවය ස්තුතිය පුද කරනවා.  ඒ වගේම එක්සත් ජාතික පක්ෂය කණ්ඩායමක් හැටියට හොඳ දේ හරිවිදියට ක්‍රියාත්මක කිරීමටත්, වැරදි දෙයට විරුද්ධව කටයුතු කිරීමටත්  බලාපොරොත්තු වෙනවා. මා මගේ අදහස් දැක්වීම අවසන් කරනවා බොහොම ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ස්තුතිය ගරු මන්ත්‍රීතුමා, ඊළඟ අවස්ථාව ලබාදෙනවා අපිත් එක්ක කලින් එකට කටයුතු කරපු සමන් ජයවර්ධන මැතිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, මට සංතෝසයි මොකද කලින් මුහුණ ටික අපේ පේන්න තියෙනවා සෑහෙන කාලෙකින්. ඒ වගේම නව මන්ත්‍රීවරු වශයෙන් තේරී පත් වෙලා තියෙන සියලුම මන්ත්‍රීවරුන්ට ද මම සුභ පතනවා ඒ කටයුතු ඉටු කරගෙන යන්න. ඒ වගේම ගරු නගරාධිපති තුමනි අපි වසර හතරක කාලයක් අපේ නලින්

මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ කණ්ඩායමක් හැටියට නගරයේ ජනතාවට මහගු සේවාවක් අපි ඉෂ්ඨ කරා. ඒ වගේම ඉදිරියටත් නගරයේ ජනතාවට සහ නගරය පරිහරණය කරනය කිරීමට පිටතින් පැමිණෙන පිරිසට සේවයක් ඉටු කිරීමට මම හිතන්නේ අද ජනතාව වරම ලබා දීලා තියෙනවා. අපිට නැවත වතාවක් ඒ යුතුකම ඉටු කරන්න අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ අනුව ඒ සඳහා කරන්න පුළුවන් සෑම දෙයක්ම මම කරනවා. ඒ වගේම මගේ කොට්ඨාශය තිසා වැව කොට්ඨාසයේ මට ඡන්ද කටයුතුවලට සහය දීපු සියලුම ජනතාවට මම ස්තුතිවන්ත වෙනවා. කණ්ඩායමක් වශයෙන් නගර සභාව පවත්වාගෙන යාමේදී නගර සභාවේ නගරාධිපති වශයෙන් සහ පාලක පක්ෂය වශයෙන් ඔබතුමාලා ගන්න ඕනෑම සත් ක්‍රියාවකට සහයෝගය දක්වන බව ප්‍රකාශ කරමින් ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද සියලුම මන්ත්‍රී මණ්ඩලයටත් ඒ වගේම නාගරික කොමසාරිස් තුමා ඇතුළු සියලූම නගර සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයටත්, සියලුම ජනතාවට සුභ ම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තූතියි මන්ත්‍රීතුමා, අපි ඊළඟ අවස්ථාවල ඩබ්ලිව් එම් සුපිනි සඳමාලි මන්ත්‍රීතුමිය ට ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී සුපුනි සඳමාලි මැතිනිය.</u>**

සුභ උදෑසනක් වේවා සියලුදෙනාට, ගරු නගරාධිපතිතුමනි, ඔබ තුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මා පළමු අවස්ථාව කර ගන්නවා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන පක්ෂය, අපේ පක්ෂයට හොඳ නිවැරදි නායකත්වයක් ලබා දුන්නු හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට ස්තුතිය කරන්න, නිවැරදි නායකත්වයක් අපේ මේ පක්ෂයට ලබා දීම වෙනුවෙන්. ඊළඟට මම මේක අවස්ථාව කර ගන්නවා අනුරාධපුර මහා නගර සභාවට ජේෂ්ඨ නිවැරදි නායකත්වයක් ලබා දීම වෙනුවෙන් පුරපති ධූරයට පිදුම් ලැබූ අපේ නගරාධිපතිතුමාට සුභ පැතීම සඳහා. ඒවගේම නියෝජ්‍ය නගරාධිපති ධූරයට පත්වුණු අපේ බුද්ධික පේමදාස මන්ත්‍රීතුමාට අවස්ථාවක් කරගන්නවා සුභ පැතීම සඳහා. ගරු නගරාධිපතිතුමා, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුළුව සියලුම මන්ත්‍රීවරුන්ට සුභ පතනවා නව සභාවාරය නිවැරදිව ආරම්භ කිරීමට සහයෝගය ලබාදීම සම්බන්ධයෙන්.

ඒ වගේම තමයි මතක් කරන්න ඕනේ මම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් අනුරාධපුර මහා නගර සභාවට බටහිර ආසනයේ කොට්ඨාස අංක 4 නුවර වැව කියන කොටසින් තමයි තරග වැදුනේ අපේක්ෂිකාවක් හැටියට. මගේ කොට්ඨාශය ජනතාව නිවැරදි තීරණයක් තීන්දුවක් ලබා දුන්නා. ඒ තීන්දුව තීරණය මත මම මහ නගර සභාවේ මන්ත්‍රීවරියක් හැටියට වැඩ කටයුතු කිරීමට සූදානම්ව සිටිනවා. මම මේක අවස්ථාවක් කර ගන්නවා මගේ කොට්ඨාශයේ සියලුම ජනතාවට ස්තූතිවන්ත වීම සඳහා. තවද, ලංකාව තුළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දීම සම්බන්ධය එකතු වූ ශ්‍රී ලංකාවේ සියලුම ඡන්ද දායකයින්ට මම අවස්ථාවක් කරගන්නවා ස්තූතිය ප්‍රකාශ කිරීමට. ඒ වගේම තමයි දේශපාලන වශයෙන් ගමනක් යන්න පන්නරය මට ලබා දුන්නේ නලින් සිරිවර්ධන මැතිතුමාගේ මග පෙන්වීම යටතේ, හිටපු නගරාධිපති, අදත් නගරාධිපති අපේ නගරාධිපති තුමන්ගේ මගපෙන්වීම යටතේ අපේ ආසන සංවිධායක කේ.පී. කුමාරසිරි මන්ත්‍රීතුමා මම අවස්ථාවක් කර ගන්නවා මේ සෑම සියලු දෙනාටම ස්තූතිය ප්‍රකාශ කිරීම සඳහා.

අනුරාධපුර මහ නගර සභාවේ මගේ කොට්ඨාශය සඳහා මෙතෙක් මන්ත්‍රීවරයෙක් සිටියේ නෑ. නමුත් අ අවස්ථාවක් තියෙනවා කොට්ඨාශය මෙන්ම පුරවරයේ සියලුම ජනතාව වෙනුවෙන් නිවැරදි නායකත්වයක් , නිවැරදි තීන්දුවක් ගැනීමට කාන්තාවක් හැටියට මම කිසිදු විටක නරකත් අසතුටක් ජනතාවට නොදෙන්න දේශපාලන මෙන්ම හොඳ සමාජ මෙහෙවරක යෙදීමට බලාපොරොත්තු වෙන බව සියලු මන්ත්‍රීවරුන්ටත් නගරාධිපතිතුමාටත් දන්වා සිටිමි, සියලු දෙනාටම සමානාත්මතාවයෙන් යුතුව සේවය කිරීමට ආරාධනා කරමින් මගේ කතාව අවසන් කරනවා ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තුතියි. මම මීළඟ අවස්ථාව ලබාදෙනවා ගරු නාගරික මන්ත්‍රී රශ්මික ගමආරච්චි මැතිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී රශ්මික ගමආරච්චි මැතිතුමා</u>**.

ස්තුතියි ගරු නගරාධිපතිතුමනි, ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, සියළුම නාගරික මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. මම මෙය අවස්ථාවක් කර ගන්නවා මට දේශපාලනයට එන්න අතහිත දුන්නු ගරු කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය චන්ද්‍රානි බණ්ඩාර මැතිණිය සහ මට මේ ගමන එන්න සහයෝගය දුන්න සියලුදෙනාටම ස්තුතිය ප්‍රකාශ කරන්න. ඒ වගේම මගේ දෙමව්පියෝ දෙන්නා සහෝදරයෝ, බිරිඳ, දරුවා ඒ සියලු දෙනාටම ස්තුතිය ප්‍රකාශ කරනවා. මම මේ දේශපාලන කටයුතු වලට ආවේ මම කරපු රැකියාවෙනුත් අයින් වෙලා. මට මේ සඳහා ඉදිරිපත් වෙන්න කිව්වා චන්ද්‍රානි බණ්ඩාර මැතිතුමිය, එතුමිය සියලු වගකීම් බාර ගන්නවා කිව්වා. මම මැතිවරණට ඉදිරිපත් වුණත් ඉදිරිපත් වු කොට්ඨාශයෙන් ජයග්‍රහණය කරන්න හැකියාව නොලැබුණා. නමුත් ලයිස්තුවෙන් මට නැවත අවස්ථාව ලැබුණා මහා නගර සභාවට තේරීපත් වෙලා එන්න. මට කොට්ඨාශයේ සෑම සියලු දෙනාම උදව් උපකාර කරා. මම ඒ අයට මේ අවස්ථාවේදී ස්තුතිය ප්‍රකාශ කරනවා. ඉදිරියට මහා නගර සභාවේ ක්‍රියාත්මක කරනු ලබන පොදු කටයුතු වලට මගේ සහයෝගය ලබාදෙන්න සූදානම්. ඒ අනුව තේරී පත්වී ඉන්න ගරු නගරාධිපතිතුමාටත්, නියෝජ්‍ය නගරාධිපතිතුමාටත්, මන්ත්‍රී මණ්ඩලයටත් මාගේ සුභපැතුම් එක්කරමින් මගේ කතාව අවසන් කරනවා බොහොම ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**

බොහොම ස්තූතියි මන්ත්‍රිතුමා අපේ ඊළඟ අවස්ථාව ලබා දෙනවා ඩී. ගමගේ පේමදාස මැතිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩී. ගමගේ පේමදාස මැතිතුමා.</u>**

ස්තුතියි ගරු නගරාධිපති තුමනි, මම එක්සත් ජාතික පක්ෂයෙන් ඉසුරුමුණිය කොට්ඨාශ අංක 5 කොට්ඨාශයට තමයි තරග කළේ. ඒ කොට්ඨාශයෙන් ජයග්‍රහණය ලැබුවේ නදීර මන්ත්‍රීතුමා. එක්සත් ජාතික පක්ෂයට අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ලැබුණු ඡන්ද වලට, ඡන්ද ප්‍රතිඵලය අනුව එක්සත් ජාතික පක්ෂය ලැබූ ඡන්ද ප්‍රතිශතයක් ලෙස අපට එන්නට අවස්ථාව ලැබුණා. මා මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මම මේ මැතිවරණ ව්‍යාපාරයට

එක්කහු කළ පී.හැරිසන් මැතිතුමාව සිහිපත් කරනවා. බටහිර මගේ නායිකාව චන්ද්‍රානි බණ්ඩාර මැතිතුමිය මා මේ අවස්ථාවේ සිහිපත් කරනවා. අපට අනුරාධපුර නගරය තුළ අපේ කොට්ඨාශය තුළ අපේ ඡන්දය පාවිච්චි කරපු ජනතාවට නගර සභාව වශයෙන් යම් සේවාවක් කිරීමට හැකියාව ලැබෙයි විශ්වාසයෙන්, ඒ අවස්ථාව ආවොත් සෑම වෙලාවකම ඒ අයට සේවාවක් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මෙම නගර සභාවේ සභාව තුළ මහජනතාව වෙනුවෙන් ගන්නා ඕනෑම තීරණයකට එකඟව මා කටයුතු කරනවා. මේ නගරය දියුණු කිරීමට අවශ්‍ය ඕනෑම වෙලාවක ඒ කටයුතු ඉටු කිරීමට මාගේ සහයෝගය ලබා දෙනවා. අවසන් වශයෙන් ගරු නගරාධිපතිතුමා, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රී මණ්ඩලයට මගේ සුභ පැතුම් එක්කරමින් මා නිහඬ වෙනවා ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ස්තුතියි මන්ත්‍රීතුමා මම ඊළඟ අවස්ථාව ලබා දෙනවා ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.එම්. අල් ෆාරිස් මන්ත්‍රීතුමාට අදහස් දැක්වීමට.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.එම්. අල් ෆාරිස් මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමා, ගරු උප නගරාධිපතිතුමා සහ ජනතාවගේ ඡන්දයෙන් තේරීපත් වූ සියලුම සභිකයින්ගේ අවසරයි. සියලු දෙනාටම ආයුබෝවන්, වනක්කම්, අස්ලාම් අලික්කුම්. මුලින්ම මා සභිකයෙක් හැටියට තෝරා ගත් දෙවියන්ට මා ස්තුති කරනවා. දෙවනුව අනුරාධපුර මගේ කොට්ඨාසයේ ජනතාවට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. එසේම මෙම බල ප්‍රදේශයේ තිස්පන්දාහක් ඡන්ද දායක ජනතාව වෙනුවෙන් ගන්නා තීරණ වලට පක්ෂයක් වශයෙන් මා කෙරේ විශ්වාසය තියපු සියලු දෙනාට සහයෝගය  ලබා දෙනවා කියන එක කියන්න කැමතියි. එසේම නගර සභාවේ කොට්ඨාශ 15 ම ජයග්‍රහණය කළ අනෙකුත් සියලු මන්ත්‍රීවරුන්ට මාගේ සුභ පැතුම් එක්කරනවා. අනුරාධපුර ජනතාව වෙනුවෙන් ගන්නා සියලුම හොඳ තීරණවලට ලංකා මුස්ලිම් කොංග්‍රස් පක්ෂය වෙනුවෙන් මා සහයෝගය දෙනවා. ජනතාව යම්කිසි අසීරු තත්ත්වයකට පත්වන තීන්දු තීරණ ගත්තොත් මා විරුද්ධව ඡන්දය දෙනවා කියන එක දේ ප්‍රකාශ කරනවා එසේම සියලු දෙනාටම ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා. ඊළඟ අවස්ථාව කේ.පී. අසේල ඉන්දික විජේසිංහ මන්ත්‍රීතුමාට ලබාදෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.පී. අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, අභිනවයෙන් තේරී පත්වූ ගරු මන්ත්‍රීවරුනි මන්ත්‍රීවරියනි. විශේෂයෙන්ම මේ අවස්ථාව ලබා ගන්නවා පක්ෂයට ඡන්දය ලබාදුන් ඡන්ද දායකයින්ට ස්තුතිය ප්‍රකාශ කරන්න. අපි සෑම විටම පොදු අභිලාෂයන් සඳහා තමයි වැඩ කරන්නේ. පෞද්ගලිකත්වයෙන් බැහැරව එකම කණ්ඩායමක් විදිහට කටයුතු

කල මාගේ පක්ෂයේ සහෝදරවරුන්ටත්, බුද්ධිමතුන් අප සමඟ මේ කාලය පුරා කටයුතු කරා. උගතුන්, බුද්ධිමතුන් ව්‍යාපාරිකයන් මේ සියලු දෙනාට ස්තූති කිරීමට මා මේ අවස්ථාව යොදා ගන්නවා.

මගෙත්, අපේ පක්ෂය ඒ වාගේම මේ සභාව නියෝජනය කරන අපිත් වරක ලෙනින් කිව්වා මෙහෙම " ධනපති පාර්ලිමේන්තුව සහ වෙනත් සෑම වර්ගයකම ප්‍රතිගාමී ආයතන බැහැර කරලීමේ ශක්තිය ඔබ සතුව නැති තාක් කල් ඔබ ඒවා තුළම වැඩ කළ යුතුයි" ඒ නිසා අප මේ සභාව නියෝජනය කරන්නේ සෑම විටම මේ අපේ සභාව තුළින් රටට, නගර වැසියන්ට මේ පුරවැසියන්ගේ සාධාරණය වෙනුවෙන් ඔවුන්ගේ ජන ජීවිතය නගා සිටුවන්නට, ඔවුන්ගේ හෙට දවස වඩාත් යහපත් කරන්නට මේ සභාව තුළින් ගෙන එන යෝජනා අරමුණු ඕනෑම ක්‍රියාවලියකදී නගර වැසියන්ගේ, මේ පුරවැසියන්ගේ සාධාරණ වන ඉල්ලීම් ඔවුන්ගේ ජන ජීවිතය නගා සිටුවන්නට, ඔවුන්ගේ හෙට දවස වඩාත් යහපත් කරන්නට මේ සභාව තුළින් ගෙන එන යෝජනා කෙටුම්පත් ඕනෑම ක්‍රියාවලියකදී ඒ සාධාරණත්වය වෙනුවෙන් එහෙම නැත්නම් ඔවුන්ගේ ජීවිතේ නගාසිටුවන්නට ගෙනෙනා ඕනෑම කටයුත්තකදී පෙළ ගැහෙනවා කියන පොරොන්දුවක් දෙමින්, ඒ වාගේම ඔවුන්ගේ ජීවිතයන් හසුරවන්නට ඔවුන්ගේ ජීවිතය වලට දැඩි බලපෑම් කරන, ඒවා හකුලවන ඔවුන්ගේ ජන ජීවිතය අඩපණ කරන අණ පනත් කෙටුම්පත් ඕනෑම දෙයකට කොන්දේසි විරහිතව අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා කියන එකත් මා මේ අවස්ථාවේදි කියන්නට කැමතියි.

එමෙන්ම අනුරාධපුර කියන මේ නගරය ලෝක ශිෂ්ටාචාරය බලපුවාම වටිනාකමින් ඉහළ නගරයක්. අපි ඉන්නේ ඒ නගරය වඩාත් යහපත් කරන්නට මේ තිබෙන තත්ත්වයෙන් ඔසවා තබන්නට අභිනවයෙන් තේරී පත් වූ සභාවට මා හිතනවා බොහෝ කාර්යභාරයක් පැවරී තිබෙනවා. ඒ නිසා එම කාර්යය භාරය සිදුකිරීමේදී අප මන්ත්‍රීවරුන් තිදෙනාගෙන් ඉටු විය යුතු කාර්යභාරය දී අපි ඒ සඳහා අර මා පෙර සඳහන් කළ ජන ජීවිතය නගා සිටුවන්නට ගෙන එන යෝජනා වලදී ඒ සඳහා අපි සහාය දෙනවා කියන එක ප්‍රකාශ කරමින් මේ සභාව මේ නගර වැසියන්ගේ ජන ජීවිතය ඔවුන් තැබූ අභිලාෂයන් අප පක්ෂයට ඡන්දය දෙමින් ඔවුන් අප කෙරෙහි තබපු විශ්වාසය ඒ ආකාරයෙන් සුරක්ෂිත කරනවා කියන එ්‍ ප්‍රතිචාරය ලබා දෙමින් මා නිහඬ වෙනවා ස්තූතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තූතියි ගන්න නාගරික මන්ත්‍රී තුමා අපි ඊළඟට අවස්ථාවන් ලබා දෙනවා කේ.පී. සචිනි නිමේෂ මන්ත්‍රීතුමියට සභාව අමතන ලෙස.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.පී. සචිනි නිමේෂා මැතිනිය..</u>**

ගරු නගරාධිපතිතුමා ඇතුළු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් ගෙන් අවසරයි. පළමුවෙන්ම අපේ තේරී පත්වූ නගරාධිපතිතුමා සහ නියෝජ්‍ය නගරාධිපති තුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට සුභ පතනවා අද මේ මංගල මහ සභා වාරයට පැමිණීම සම්බන්ධයෙන්. ඒ වගේම දිවයිනේ ලාබාලතම පක්ෂයක් ලෙස පොදුජන පෙරමුණෙන් තරග වැදිලා දිවයිනේ ලාබාලතම මන්ත්‍රීවරිය ලෙස වාර්තාවත් පිහිටුවීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒවගේම අංක 14 කොට්ඨාශයට තරග වැදිලා විශිෂ්ට ජයක් අරගෙන මම මෙතැනට පැමිණ තිබෙනවා. මේ සඳහා මට අවස්ථාව ලබා දුන්නේ එච්.බී. සේමසිංහ ඇමතිතුමා සහ ශෙහාන් සේමසිංහ පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා. ඉතින්

මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන අරගෙන අපි මේ ස්ථානයට පැමිණිලා සිටිනවා. ඒ වගේම මගේ මෑණියන්ට සහ පියාණන්ට මම ස්තුති කරන්න ඕනේ එතුමන්ලාගේ දේශපාලන ගමන ඔස්සේ යමින් තමයි මට මේ අවස්ථාව ලැබුනේ. ඒ වගේම ප්‍රදේශයේ ජනතාව මාත් එක්ක ඉදලා මේ මහජන නියෝජිතයෙක් වශයෙන් මාව පත් කරාට එතුමන්ලාට මම ස්තුතිවන්ත වෙනවා. මේ නගර සභාවේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම මන්ත්‍රීවරුන් සමඟ කටයුතු කරන්න මම උපරිම සහයෝගය ලබා දෙනවා. මට හැකි අයුරින් මම සහයෝගය ලබා දෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමිය. ඊළඟ අවස්ථාව කේ.ඒ ඉන්ද්‍රානි මැතිනියට ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය.</u>**

ගරු නගරාධිපතිතුමා ඒ වගේම නියෝජ්‍ය නගරාධිපති තුමා, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම නාගරික මන්ත්‍රීවරුන් ගෙන් අවසරයි. මම නිදහස් පක්ෂයේ තරග වැදුණේ. පැවැත්වෙන දේශපාලන තත්ත්වය උඩ අපේ පක්ෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අත ලකුණට දුන්නු චන්ද නිසා අපේ කාන්තාවන්ට පනතින් ලැබුණු තෑග්ගක් විදිහට තමයි ඇත්තටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තේරුනේ. මම ඒ සම්බන්ධව අපේ පක්ෂයේ ගරු මහ ලේකම්තුමාට මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා. ඒ වගේම මම ප්‍රාදේශීය සභාවේ ම.නු.ප ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කලක් කටයුතු කළ කෙනෙක් සහ අපට මේ සභාවේදි අපේ නගරයේ ජනතාවට මේ සභාව කරන්ඩ ඕන අවශ්‍ය දේවල් කරන්ඩ දේශපාලනයෙන් තොරව අපි මේ සභාව තුලදී තමුන්නාන්සේලා සියලු දෙනා එක්කම අත්වැල් බැඳගෙන කටයුතු කරන බව මම ප්‍රකාශ කරනවා.

ඒ වගේම අපේ කණ්ඩායමේ අපි තුන්දෙනා අපේ නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා ඉන්නවා එතුමා අපිට උපදෙස් දෙනවා. අපෙන් මහා නගර සභා වාසීන්ට සිදුවිය යුතු සහ කරන්න පුළුවන් සියලු කටයුතු කරනවා . මේ දේශපාලන ගමනේදී දුමින්ද දිසානායක මැතිතුමා වගේම මං මගේ ස්වාමිපුරුෂයා බන්දුල මුණසිංහ මැතිතුමා දේශපාලන අත්දැකීම් තියෙන පුද්ගලයෙක් ඔහුගේ මග පෙන්වීම සහ ආශීර්වාදය මත තමයි මම දේශපාලනයට අවතීර්ණ වුණේ . මම මේක අවස්ථාව කරගන්නවා අත ලකුණට ඡන්දය දුන් සියලුම ජනතාවට ස්තුතිය ප්‍රකාශ කරන්න. ඒ නිසා මම නගර සභා බල ප්‍රදේශයේ සියලුම අත ලකුණට ඡන්දය දුන් අයට මගේ ස්තුතිය නැවතත් පුද කරනවා.

නැවත වරක් මම කියනවා මේ ඒ නගර සභා බල ප්‍රදේශයේ සිටින සියලුම අයට නගර සභාවකින් කෙරෙන්න ඕන දේවල් කිරීමේදී අපි තමුන්නාන්සේලාත් එක්ක එකතු වෙනවා. හැබැයි නගර සභා බල ප්‍රදේශයේ ඉන්න මහජනතාවට වරදක් කරනවා නම් වරදක් වෙනවනම් ඒ සියලුම අවස්ථාවන්වලදී අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තුන්දෙනා එයට විරුද්ධව නැගී සිටිනවා. තමුන්නාන්සේලා හිතයි සමහරවිට ආණ්ඩුවේ තමුන්නාන්සේලාගේ පක්ෂය ආණ්ඩු පක්ෂයේ වැඩි නිසා අපි විරුද්ධ වුණාට ප්‍රශ්නයක් නැහැ කියලා . නමුත් ඒක නෙමෙයි වෙන්න ඕනෙ ඒ අවස්ථාවේදී අපි විරුද්ධව ඉන්නවා ඒ නිසා අපි හොද වැඩ කරමු, අපි මේ ටික දෙනෙක් පත් වෙලා ඇවිල්ලා ඉන්නේ ජනතාවට හොද සේවයක් බලාපොරොත්තුවෙන් එනිසා නගර සභාවෙන් හොද සේවයක් කරමු කියලා මා ඉල්ලා සිටිනව. හොද කටයුතුවලදි තමුන්නාසේලාට සහයෝගය දෙනවා කියලා ප්‍රකාශ කරනවා තමුන්නාන්සේලා සියලු දෙනාටම මේ ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද සුභ අලුත්

අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා රටට යහපතක් කරන්ට සියලුදෙනාටම වාසනාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ස්තුතියි මන්ත්‍රීතුමිය. මීලග අවස්ථාව විරාජ් ධනංජය රණවීර මන්ත්‍රීතුමාට ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවීර මැතිතුමා</u>**.

ස්තුතියි ගරු නගරාධිපතිතුමා, ගරු නියෝජ්‍ය නගරාධිපති තුමා ඇතුළු අනුරාධපුර මහ නගර සභාවේ සියලුම නාගරික මන්ත්‍රීවරුන් ගෙන් අවසරයි. විශේෂයෙන් මම කියන්න ඕනේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදිහට එම පක්ෂයේ සන්ධානගත පක්ෂයක් විදිහට හිටපු නායක සෝමවංශ අමරසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් යුත් මහජන සේවක පක්ෂය නියෝජනය කරන්න මෙම අවස්ථාව උදාකර දීමේ දී විශේෂ කාර්ය භාරයක් ඉටු කරමින්, ඒ වගේම මම මේ මතක් කරන්න ඕනේ මගේ දේශපාලන භාවිතාව ගත්තහම මම හැමදාම නියෝජනය කළේ මේ රටේ වාමාංශික ව්‍යාපාරය , ප්‍රගතිශීලී ව්‍යාපාරය. ඒ තුළ අපට තිබුණා මේ රට අධිරාජ්‍යවාදීන්ට විරෝධී වීමට සහ මේ මහ පොළොවේ දුක් විදින ජනතාව වෙනුවෙන් පෙනී සිටීමට කටයුතු කරන්න. ඒ ඔවුන්ගේ අභිලාෂයන් වෙනුවෙන් හැමදාම පෙනී සිටින මිනිස්සු විදිහට අපේ නායකතුමා නිර්මාණය කරලා ඒ පක්ෂයේ ගමන් මග නිවැරදි ක්‍රියාදාමයකට අරගෙන එනකොට අවාසනාවන්ත විදිහට මේ මාතෘභූමියට එතුමා අහිමිවුණා.

එතකොට මම කියන්න ඕන හිටපු දේශපාලන ව්‍යාපාර තුළ 2002 වර්ෂයේ ගම්පහ මහ නගර සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම් නායකයා විදිහට එම පක්ෂයේ නියෝජනය කරලා 2004 වසරේදී මහර ආසන සංවිධායකවරයා වශයෙන් ජනතා විමුක්ති පෙරමුණේ කටයුතු කරලා ගන්න සිද්ධ වෙච්ච තීරණයක් මත තමයි අද මෙම තත්වය නිර්මාණය වෙලා තියෙන්නේ. කොහොම වුණත් අපි හිටියේ මේ රටේ මිනිසුන්ගේ පරම අභිලාෂයන් වෙනුවෙන් පෙනී සිටීමේ උදාරතර මිනිසුන් විදිහට අපට යුතුකමක් හා වගකීමක් තිබුණා මේ රට ගමන් කරන දිශානතිය වැරදියි කියන දැක්ම. ඒක නිසයි අපි මේ රටට ආදරය කරපු නායකයෙක් විදිහට අතිගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ සමග සාකච්ඡා කරලා එතුමා සමග අත්වැල් බැදගෙන මේ රට නැවතත් නිවැරදි දිශානතියකට ගමන් කරවන්න ඕනෙ කියන තීරණය අනුව තමයි මේ අවස්ථාව උදාකර ගත්තේ.

ඒ ආශිර්වාදය ලබා දීපු හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට ඒ වගේම එම පක්ෂයේ න්‍යාය පත්‍රය හසුරුවමින් සංවිධාන හසුරමින් කටයුතු කරපු බැසිල් රාජපක්ෂ මැතිතුමන්ට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ දිස්ත්‍රික් නායක එස් එම් චන්ද්‍රසේන මැතිතුමන්ට ඒ වගේම බටහිර ආසන සංවිධායක සරත් කුමාරසිරි මැතිතුමා වගේම මෙම මැතිවරණ ක්‍රියාදාමය තුළදී මට නන් අයුරින් සහය දුන් ඒ අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට සහ මන්ත්‍රීවරියන් ඇතුළු අපේ නගරාධිපතිතුමා, නියෝජ්‍ය නගරාධිපති තුමා වගේම නන්නාදුනන පළාතක 571, 572 කියන තුලාන මම යනකොට හතර මුල්ල දැනගෙන හිටියේ නෑ, ඇත්තම කාරණාව, හැබැයි ඒ ප්‍රදේශයේ ජීවත්වන මිනිස්සු මා පිළිබඳ විශ්වාසය තිබ්බා මගේ හැසිරීම, භාවිතාව පිළිබඳ විශ්වාසය තියලා ඔවුන් එක පෙළට හිටගත්තා.

ඒ හිටගැනීම තුළ ඔවුන්ගේ ශක්තිය මත ඔවුන්ගේ ධෛර්යය මත සහ ඔවුන්ගේ ආශිර්වාදය මත අද මෙම නගර සභාව තුළ ඉන්න සමස්ත ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු ප්‍රමාණයක් කරන්න සේවාවක් කරන්න අපට හැකියාවක් ලැබුණා. ඒ නිසාම විශේෂ ගෞරව ස්තුතිය හෘදයාංගම ස්තුතිය එම ප්‍රදේශයේ ජනතාවට මම පුද කරන්න ඕනේ . මම ඉතාමත් වගකීමෙන් කියනවා අපි පක්ෂ විපක්ෂ භේදයක් මෙතැන තිබිය යුතු නෑ .

අපි දැන් සභාවක් හැටියට කටයුතු කළ යුතුයි. මේ රටේ අද අමාරුවෙන් දුක් මහන්සි වන මිනිස්සු සිටින්නේ ඔවුන්ට දරාගන්න බැරි අධික බදු බරක් සහ ජීවන බරක් සහිතව ඔවුන් ජීවත්වන වකවානුවක් තුළ ඔවුන්ගේ බදු මුදල් තුළින් තමයි ඔබ අප සැම දෙනාම ජීවත් වෙන්නේ. ඒ නිසා ම, ඒ ගෙවන බදු මුදල් වලට ඔබ අපට එම ගෙවන බදු මුදල් වලට ඒ අහිංසක මිනිස්සුන්ට යුක්තිය හා වගකීම් ඉෂ්ට කරන්න ඕන කියලා අයිතියක් අපේ දෙවුර මත පැවරිලා තියෙනවා. ඒ නිසා මං ඉතාමත් ආදරයෙන් ඉල්ලනවා යුතුකම් හා වගකීම් පැහැර හරින්නේ නැතුව වඩාත් නිවැරදි දේ සභාව තුළ ඉස්මතු කරමින් උරුම නගරයන් අතර ප්‍රධාන නගරයක් වෙච්ච මේ ඓතිහාසික අනුරාධපුර පුරවරයේ පළමු රාජධානිය වෙච්ච මේ අනුරාධපුර නගර සභාවේ අපි සියලු දෙනා ඒකරාශී වෙලා එකමුතුව යහපත් දෙයක් වඩාත්ම නිවැරැදි යහපත් දෙය මතුකරමින් මේ සභාව නිවැරදි ගමන් මගකට ගෙන ඉතිහාසයේ යම් වැරැදි සිදු වුණා නම් ඒ සමස්ථ වැරදි අකා මකා දාලා ඒවා අමතක කරලා දාලා වඩාත්ම නිවැරැදි වැඩපිළිවෙළක් සකස් කර මේ මහ පොළොව දුක් විදින ඒ අහිංසක දුවා දරුවන් ඒ ආදරණීය අම්මා තාත්තා වෙනුවෙන් ඒ යුතුකම හා වගකීම ඉටුකිරීම, ඉෂ්ට කිරීමට හැකිවේවා කියන ගෞරවණීය ආරාධනය කරමින් මාගේ කතාව අවසන් කරනවා.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ස්තුතියි.මන්ත්‍රීතුමනි. අපි මීළඟ අවස්ථාව ලබාදෙනවා සුරංගි රේණුකා සමරතුංග මැතිතුමිය ට.

**<u>ගරු නාගරික මන්ත්‍රී සුරංගි රේණුකා සමරතුංග මන්ත්‍රීතුමිය.</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපති තුමනි සහ අනෙකුත් සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ද අවසරයි. පළමුවෙන් මා ස්තුතිය පුද කරන්නේ මා ඇති දැඩි කළ මගේ ආදරණීය දෙමව්පියන්ට. එමෙන්ම මා පරිපූර්ණ කාන්තාවක් ලෙස සමාජයට දායාද කර ස්වර්ණපාලි බාලිකා විදුහලේ ගුරු මෑණිවරුන්ට පියවරුන්ටත් . ක්‍රියාකාරී දේශපාලනයේ වසර 12ක් ජනතාව අතර ඉදලා මගේ දක්ෂතා හඳුනා ගත්ත දේශපාලන දිවියේ පියා වන එච් බී සේමසිංහ මැතිතුමාට මාගේ හෘදයාංගම ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා.

ඒ වගේම තෙවනුව 48 අභය පෙදෙස ජනතාව මා කෙරෙහි විශ්වාසය තබා මට ඡන්දය දුන් ජනතාවට මම හිස නමා ආචාර කරනවා සහ මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ටත් මා පසුපසින් සැම මොහොතකම දිරිමත් කළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ශෙහාන් සේමසිංහ මැතිතුමාටත් ඉන්දික හෙන්දාවිතාරණ මහත්මයාටත් මගේ විශේෂ ස්තුතිය පුද කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ලෝකයේ බොහෝ රටවල් දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය 33% දක්වා ඉහළ දමා තිබෙන යුගයක ශ්‍රී ලංකාවේ කාන්තා නියෝජනය 25% ක කෝටා ක්‍රමයට හඳුන්වාදීමට ඇප කැප වී ක්‍රියා කළ සංවිධාන වලට, පක්ෂ වලට මං මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා . මොකද කාන්තාවට උපතේ සිට මරණය දක්වා තීන්දු තීරණ

ගැනීමට අවස්ථා සලසා දීම පිළිබඳව ඒ වගේම නගරය සංවර්ධනය කිරීමේදී ගන්නා සියලුම තීරණයක දී මාගේ සහයෝගය මා ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අසාධාරණයක් වන සෑම අවස්ථාවකදී ඔවුන් වෙනුවෙන් නැගී සිට ක්‍රියාකරන බව ප්‍රකාශ කරනවා ඒ වගේම ගරු නගරාධිපතිතුමා අනුරාධපුර නගරය සංවර්ධනය කරන්නට මම සහයෝගය සහ අවශ්‍ය යෝජනා ලබාදෙන බවට මා ප්‍රකාශ කරනවා බොහොම ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ස්තුතියි ගරු මන්ත්‍රීතුමිය. මීළඟට නීතීඥ නිර්මලි ප්‍රියදර්ශනී මැතිනියට අවස්ථාව ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතීඥ නිර්මලී ප්‍රියදර්ශණී මැතිතුමිය.</u>**

ස්තුතියි ගරු නගරාධිපති තුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ පක්ෂ නායක ඉන්දික අරුණ කුමාර මැතිතුමනි, මගේ ජේෂ්ඨ නීතිඥ හැම වෙලාවෙම මට අවවාද උපදෙස් ලබාදෙන සහ උදව් කරන රංජිත් රාජකරුණා මැතිතුමනි, මගේ ඥාති සහෝදරිය සුරංගි  මැතිනියනි ඇතුළු පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීතුමියනි, මගේ ප්‍රදේශවාසී ජනතාවනි.

ඇත්තටම මම දීර්ඝව කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. මොකද නව මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා කතා කරන්න.මං මේ මන්ත්‍රීවරියක් වෙන්න කවදාකවත් බලාපොරොත්තුවක් තිබුණෙ නැහැ.  මම ස්තුතිවන්ත වෙන්න ඕනේ මගේ ඇමතිතුමිය කාන්තා කටයුතු ඇමතිතුමිය චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමිය ඇය මට හදිසියේම ඉල්ලීම කරා ඒ වෙනකොට මම වැඩබලන මහේස්ත්‍රාත්වරිය විදිහට වැඩ කරේ. මට ඒ අවස්ථාව කැප කරන්න වුණා. මේ මන්ත්‍රීධූරය හින්දා නමුත්, මං ඒ වෘත්තියට වඩා කැමති වුනේ ජනතාව එක්ක ඉන්න. මම ඒ මගේ අනාගත බලාපොරොත්තු පැත්ත තියලා මන්ත්‍රීවරියක් වෙන්න කල්පනා කළා. මගේ ප්‍රදේශවාසී ජනතාවට සේවය කරන්න මේ හරහා, මම මගේ ප්‍රදේශවාසීන්ට පොරොන්දු වෙනවා අවශ්‍ය සෑම අවස්ථාවකම ජනතාව වෙනුවෙන් පෙනී සිටිනවා. එසේම, මම එක්සත් ජාතික පක්ෂ නායක තුමන්ට සහ මගේ ඇමති තුමියට ස්තුතිවන්ත වෙමින් ,තව ද මට මේ අවස්ථාවට උපකාර කළ මගේ දෙමව්පියෝ මගේ සහෝදරයෝ ඥාති සහෝදරයෝ විශාල වශයෙන් නීතිඥවරු සහ ප්‍රදේශවාසීන්ට ස්තුති කරන්න මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. ඒ අනුව මම පොරොන්දු වෙනවා නගර සභාවේ නීති අණපනත් වලට යටත්ව සියලුම සේවකයන් සමඟ එකතු වෙලා එකට උදවු කරල මගෙ නගරය දියුණු කරන්න ඇප කැප වෙනවා කියලා. නගරාධිපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට සුභ පතමින් මා නිහඬව වෙනවා ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමිය. මීළඟට ප්‍රභාත් කීර්ති වැවේ ගෙදර මන්ත්‍රීතුමාට අවස්ථාව ලබාදෙනවා.

**ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා.**

ස්තුතියි ගරු නගරාධිපතිතුමනි. ජනතා විමුක්ති පෙරමුණ ගැන කතා කරනවානම් මේ රටේ දේශපාලන පක්ෂවල විකල්ප දේශපාලන පක්ෂයක් හැටියට හඳුන්වන්න පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණේ ආදර්ශයන් මත ඉගැන්වීම් මත අද දේශපාලනයට ඇවිත් තියෙනවා. මෙම සභා ව්‍යුහය හරහා මේ සභාවේ ඉදිරි වැඩකටයුතු සඳහා සහයෝගය දෙන්න මා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ඔබ තමුන්නාන්සේලා දන්නවා ජනතා විමුක්ති පෙරමුණ විදිහට පහුගිය කාලය තුල නගර සභාවේ පුරවැසියාට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා අපි ඡන්දයට ඉදිරිපත් වුණා. පුරවැසියෝ අපේ වැඩපිළිවෙළ තේරුම් ගත්ත ප්‍රමාණය අනුව අපට මන්ත්‍රීධුර තුනක් පමණයි ලබා ගන්න පුළුවන් උනේ.

අපිට නගර සභාව හදන්ඩ බලය ඉල්ලන කොට අපට බලය දුන්නේ නෑ. නගර සභාවේ බලය දුන්නේ වෙනත් දේශපාලන පක්ෂයකට. අපට වගකීමක් පැවරිලා තියෙනවා බලය දුන්න නගර සභාවේ ඡන්ද ප්‍රතිඵල වලින් පෙනී යන්නේ ඒ වගකීම් වලින් පෙනී යන්නේ බලය දුන්න කණ්ඩායම වැඩ කරන්නේ කොහොමද කියන එකට අදාලව බලන්න අපිට බලය දීලා තියෙනවා. ගරු නගරාධිපතිතුමා ඇතුළු ඒ කණ්ඩායම හෙට දවස වෙනුවෙන් මේ නගර සභාව හදන්න ගන්නා තීන්දු තීරණ ගැන හොඳ හෝ නරක. හොද ඒවා රැගෙන නරක ඒවාය විරුද්ධ වෙලා මේ නගර සභාවේ හැම වැඩපිළිවෙලකට ම දායකත්වය සපයමින් අඩුපාඩුකම් තියෙන දේවල් පෙන්නමින් හොඳ වැඩපිළිවෙලවල් වලට හොඳ දේවල්වලට සහාය දීමෙන් කටයුතු කරන්න මා බලාපොරොත්තු වෙනවා. ඒවගේම මේ සභාව නියෝජනය කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දීපු ජනතාව වෙනුවෙන් නූතන සභාවේ අඩුපාඩු තියෙනවා හදන්න බැරි අඩුපාඩු තියෙනවා ඉතිං අපි මේවා නිවැරදි දැක්මක් තුළ ඉදගෙන මේ නගර සභාව හදන්න උදව් කරමු. අවුරුදු හතරක් ඇතුළත මේ සභාව හොඳ සභාවක් බවට පත් කරලා පුරවැසියන්ට සේවයක් ඉටු කරන්න උත්සාහ කරමු එ් සඳහා මගේ සහයෝගය ලබා දෙන බව මා ප්‍රකාශ කර සිටිනවා ස්තුතියි.

**ගරු නගරාධිපතිතුමා.**

මේ අවස්ථාව ගරු නාගරික මන්ත්‍රී විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමාට.

**ගරු නාගරික මන්ත්‍රී විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා.**

ගරු නගරාධිපති තුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපති බුද්ධික ප්‍රේමදාස මැතිතුමනි, විපක්ෂයේ ඉන්දික අරුණ කුමාර මැතිතුමනි, ඒ වගේම සියලුම මන්ත්‍රීවරුනි මන්ත්‍රීවරිය නි. ඒ වගේම සියලුම මහා නගර සභාවේ නිලධාරීන් ඇතුළු සියලුම දෙනා, අද දින මේ පැමිණි සිටින මන්ත්‍රීවරුන්ගේ ඥාති මිත්‍රාදී සියලු දෙනාගෙන්ම අවසර ගන්නවා. මෙවැනි සභා වාරයක මංගල මහා සභාවාරයට මම නවකයෙක් මන්ත්‍රී ධුරයට.

මම හිතන්නේ පසුගිය කාලයේදී ගරු නගරාධිපතිතුමා මෙන්ම මන්ත්‍රීවරු සමග එකට එකතු වෙලා ලොකු වැඩ කොටසක් කරපු පුද්ගලයෙක්. ඒ එක්කම මේ දේශපාලනයට මාව සම්බන්ධ කළ එකම පුද්ගලයා, මහා නගර සභා සහ බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික අමාත්‍යතුමා. මම මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් කරනවා මොකද එතුමා තමයි මේ මඟට මාව යොමු කරන්න , ඒ පෙළඹීම මත මේ අවස්ථාව ලබා දුන්නත් අපේ අරුණ බුද්ධික

හිටපු පළාත් සභා මන්ත්‍රී තුමා ඇතුළු අනුරාධපුර දිස්ත්‍රික් නැගෙනහිර ආසනයේ ප්‍රධාන සංවිධායක ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිණිය ගේ අනුදැනුම මත මෙම ස්ථානය ලබාගැනීමට හැකියාව ලැබුණා. 254 තුලානය නගර සභාවට පිවිසියත් අර කිව්වා සේම ඡන්ද 597 ලබාගෙන නගර සභාවට සභිකයෙක් ලෙස ට එන්න නොහැකි වුණත් ලබා ගත්තා වූ සමානුපාත ක්‍රමය නිසා නගර සභාවේ මන්ත්‍රී ධූරයක් ලබාගැනීමට හැකිවුණා.

ඉතින් මේ තුළ කරපු කාරයන් සහ ඉදිරියේදී මේ නගර සභාව තුළ ගන්නා වූ සියලු ම හොඳ තීන්දු තීරණ කොතැනද ඒ තීන්දු තීරණ වලට හිටගන්නවා. ඒ වගේම වැරදි තීන්දු තීරණ ගන්නවා නම් ඒ සියලු තීරණ නිෂ්ප්‍රභා කරලා වැරදි පැත්තෙන් හිට ගන්නවා.

ඒ එක්කම අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයේ සියලුම ඡන්ද දායකයන්ට මගේ ස්තුතිය පුද කරනවා මොකද එවැනි ඡන්ද ප්‍රමාණයක් ලැබුණු නිසා තමයි ප්‍රතිශතය අනුව මේ නගර සභාව නියෝජනය කිරීම සඳහා අවස්ථාවක් උදා වුණේ , හැකියාව ලැබුණේ. මෙය තුල ඔබතුමාලත් එක්ක ඒ කියූ ආකාරයෙන් වැඩ කරන්න, සහ හැම ඕනෙම අවස්ථාවක වැඩ කරන්න ශක්තිය සහ ධෛර්යය තියෙනවා. ඒ තුල ඔබතුමාලත් එක්ක ඕනෑම වෙලාවක නොපැකිළිව ඕනෑම වැඩකදී ඒ සහයෝගය දෙන්නත්, ඒ වගේම නියෝජ්‍ය නගරාධිපති බුද්ධික ප්‍රේමදාස මහතා ඔහුගේ කාලයේ ඉදිරිමගට උදව් කරපු පුද්ගලයෙක් මම. කොහොම වුණත් මම හිතනවා මේ ක්‍රමය නැතුව සමහරවිට මනාප ක්‍රමය තිබුණා නම් මේ තනතුර මම බාර නොගන්න තිබුණා.

මොකද මගේ ජීවිතේ ඒ වෙනකොට දේශපාලනයේ වෙනත් තීන්දු තීරණ තිබුණේ. මොකද හරිදේ හරි තැනට හිටගන්න තමයි මම හැමවෙලාවෙම උත්සාහ කරන්නෙ. ඒ නිසා මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා හිටිනවා හැමදේටම, අපි මේ දේවල් අපේ බූදලයක් නොව අපිට අවශ්‍යතාවය තියෙන්නේ සමාජයට අවශ්‍ය දේවල් සිදු කිරීමට. අප විපක්ෂයේ හිටියත් ඔබ ආණ්ඩුපක්ෂයේ හිටියත් අපි හරි තැන හිට ගමු ඒක නිසා කාට හරි කමක් නෑ කවුරු හරි හෝ නායකයා වෙන්න පුළුවන් අපි හැමෝම හරි තැන හරි දේ කරලා හරි තැන හෙට ගමු අපි ආදර්ශමත් මන්ත්‍රීවරු වෙමු. මේ පළවෙනි මංගල මහා සභා රැස්වීමේදී මම යෝජනා කරනවා අපි මේ සියලු දෙනා ගේ අදහස් හා යෝජනා කැටිකරගෙන හරි තැන ඉඳගෙන ඉදිරියට යන්න . යම් යම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න සාකච්ඡා කරන්න අනුරාධපුර නගරයට සේවයක් කරන්න. අඩුපාඩු ඇත්නම් ඒ සියලුම අඩුපාඩු නිවැරදි කරන්න, මේ සියලුම ජනතාවගේ දුක් කරදර අවම කරන්න නොහැකි වුනත් හැකි පමණින් යහපත් ක්‍රියාවන් සිදු කරන්න හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසන් කරනවා ස්තුතියි.

**<u>ගරු නාගරාධිපතිතුමා.</u>**

ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළග අවස්ථාව අපේ විනෝදනි විජේසූරිය මැතිනියට.

**<u>ගරු නාගරික මන්ත්‍රී විනෝදිනී විජේසූරිය මැතිනිය.</u>**

ගරු නගරාධිපතිතුමා, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රී මණ්ඩලයෙන්ද නිලධාරි මණ්ඩලයෙන් ද පැමිණ සිටින සියලු දෙනාගෙන්ම අවසරයි. පැතිස්පුර කොට්ඨාසය නියෝජනය කරමින් පත් වූ මන්ත්‍රීවරිය මම. මට නායකත්වය ලබා දුන් හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහ මගේ කොට්ඨාසයේ සියලුම ජනතාවට ස්තුතිවන්ත වන අතර මට නායකත්වය ලබාදෙන පිවිතුරු හෙළ උරුමයේ නායක උදය ගම්මන්පිල මැතිතුමාටත් ස්තුතිවන්ත වන අතර, බටහිර ආසන සංවිධායක තුමා ඇතුළු සියළුම විපක්ෂය නියෝජනය කරන සියලුම

මන්ත්‍රීවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ස්තුති වන්ත වන අතර මාට මේ සභාවට එන්න අවස්ථාව ලැබුනේ මාගේ මහත්තයාට අවස්ථාව නොලැබුණු නිසා. ඒ වගේම මට ඒ අවස්ථාව ලබාදුන් ස්වාමි පුරුෂයා වන මානවඩු මහතාට ස්තුතිවන්ත වන අතර මේ නගර සභාව තුලදී කරන්නාවූ කටයුතු සඳහා සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කරමින් මගේ කතාව අවසන් කරනවා ස්තීතියි.

**<u>ගරු නාගරාධිපතිතුමා.</u>**

ස්තූතියි මනිත්‍රීතුමිය, මීළඟ අවස්ථාව එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපති තුමනි, අභිනවයෙන් තේරී පත්වී පැමිණි ගරු නාගරික මන්ත්‍රීවරුන් මන්ත්‍රීතුමියන්ලාගේන් අවසරයි. මම මේ අවස්ථාව කරගන්නවා මේ ගමනට සහයෝගය දැක්වූ සියලු දෙනාට ස්තුතිය ප්‍රකාශ කිරීම සඳහා. ශ්‍රී ලංකා පොදුජන එක්සත් පෙරමුණ පක්ෂයේ නෙළුම් පොහොට්ටුවෙන් පක්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත ගෞරවය සහ ආදරය පුද කර සිටිනවා. දේශපාලන ජීවිතයේදී අපි බිම් මට්ටමේ දේශපාලනය කරමින් මැති ඇමතිවරුන් ප්‍රිය කරමින් ඔවුන් පත්කරමින් අන් අයට සහාය දැක්වූ අය. එවන් තත්ත්වයක ඒ අත්දැකීම් තුළින් තමයි මම මේ දේශපාලන ගමනට අවතීර්ණ වුණේ ඒ අවස්ථාවේදී බටහිර අනුරාධපුර නවක සංවිධායක කුමාරසිරි මැතිතුමා තමයි මට මේ අවස්ථාව උදාකර දුන්නේ. ඒ බටහිර අපේ ආසන සංවිධායක මැතිතුමාට මම ගෞරවය ආදර ස්තුතිය පුද කරනවා.

ඒවගේම යන ගමනේදී කණ්ඩායමක් වශයෙන් කණ්ඩායම් හැඟීමෙන් අපිව ඉදිරියට තල්ලු කරමින් අපිට සහය දැක්වූ හිටපු නගරාධිපති සහ වර්තමාන නගරාධිපති අපේ එච්.පී. සෝමදාස මැතිතුමාට මගේ ගෞරවය සහ ආදරය පුද කරනවා . එතුමා තමයි අපේ පිටුපසින් මේ ජයග්‍රහණ සඳහා ගෙන ගියේ. ඒ වගේම අපගේ කණ්ඩායම් නායකයා එස්. එම් චන්ද්‍රසේන මැතිතුමා, රංජිත් මැතිතුමාට මං මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඒවගේම ඒ කණ්ඩායමේ පෙරගමන්කරුවන් වශයෙන් සහාය දැක්වූ සේමසිංහ මැතිතුමාට, ශෙහාන් සේමසිංහ මැතිතුමාට මම මගේ ගෞරවය ස්තුතියි මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වගේම බුද්ධික ප්‍රේමදාස මැතිතුමා හා ඒ වගේම අපේ රජකරුණා මැතිතුමා ඇතුළු නම් වශයෙන් මතක් කරන්නේ නැහි උනත් මේ අපේ සියලු මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවය ආදර ස්තුතිය පුද කරනවා. ඒ කැපවීම සහ එ් උපදෙස් නිසයි අද මම මේවැනි ස්ථානයක සිටින්නේ.

ඒ වගේම මේ අලුත් දේශපාලන ක්‍රමය තුළින් කොට්ඨාස ක්‍රමය කියන දේශපාලන ක්‍රමයක් ගෙනාපු නිසයි අපි අද මේ අවස්ථාවේ සිටින්නේ . නැතිනම් අපට මේ දේශපාලනයට එන්න කිසිම අවස්ථාවක් ලැබෙන්නෙ නෑ. කොට්ඨාශ ක්‍රමය හොඳ පැත්ත තිබෙන්නේ ඒ නිසයි නමුත්, මෙය ජයග්‍රහණය උච්චාවචනයට පත් කරපු දේශපාලන ක්‍රමයක් කොට්ඨාශ ක්‍රමය. ඒ වගේම මා ඉදිරිපත් වුණේ සාලිය මාවත 1 කොටසින් නගරාධිපතිතුමනි, සාලිය මාවත අපේක්ෂකයෝ 4 දෙනෙක් ඉදිරිපත් වෙලා සිටියා . ඒ හතර දෙනාම අත්දැකීම් බහුල අය. නමුත් මම කොට්ඨාශයක් වශයෙන් මනාප වැඩියෙන්ම ලබා ගෙන ඔසවා තැබුවේ මේ මාගේ සදාදරණීය සාලිය මාවත කොටස ජනතාවයි. මෙම අවස්ථාව උපයෝගී කරගන්නවා එවන් වූ ජනතාවකට ඉදිරි දේශපාලන ජීවිතයේදී යම් කාර්යයක් ඉටු කරන්න. මම දැකල තියනවා රජුන්

මැති ඇමතිවරුන් බිහිවෙනවා දැකලත් තියෙනවා, රජුන් මැති ඇමැතිවරුන් පරාජය වී කුජීත ලෙස ගෙදර යනව දැකල තියෙනවා. ඒ අත්දැකීම් තුළින් තමයි මම දේශපාලන ජීවිතය හැඩ ගසා ගත්තේ. මොකද අපි නිවැරදි නොවුනොත් මේ දේශපාලන ජීවිතයේදී ගමන් මඟක් නැහැ. ජනතාව අතර ඉන්න ඕනේ ඒ අදහස් තේරුම් ගන්ඩ ඕනේ අපි ජනතාවගේ කැමැත්ත අනුව වැඩ කරන්න ඕනේ එතකොට තමයි අපිට දේශපාලන ජීවිතයක් හා අපේ ගමන් මඟක් තියෙන්නේ. ඉතින් මම වැඩිපුරම කතා කරන්න යන්නේ නෑ .

මගේ කොට්ඨාශයෙන් මම තරග වදින කොට මට සහයෝගය ලබා දුන්නා ලයිස්තු අපේක්ෂකයෙක් වශයෙන් අජිත් ධර්මරත්න මැතිතුමා . මම එතුමාව ගෞරවයෙන් සිහිපත් කරමින් සාලිය මාවත 2 කොටස කියන්නේ තුලාන 318 හා 319 තුලාන 318 තුලානේ සාලිය මාවත ඇල පාර, කට්ටකඩුව, නුවරවැව වත්ත, මේ වගේ කොටස් බෙදෙනවා. ඒ වගේම 319 තුලාන පුලියන්කුලම, බණ්ඩාර පුලියංකුලම, නුවර පාර, යාපනය පාර ආදි වශයෙන් කොටස් බෙදෙනවා මේ සියලුම ජනතාව මා හට සහ හිටපු ජනාධිපතිතුමාට සහ කොට්ඨාශයක් වශයෙන් ගත්තහම ගමේ මනුස්සයෙක් වශයෙන් තමයි මට ඡන්දය දුන්නේ. මා හට තැබූ විශ්වාසය මත තමයි මේ වැඩි ඡන්දෙන් ඔසවා තැබුවේ. මම ඒ ජනතාවගේ කැමැත්ත අනුව කටයුතු කරමින් බටහිර ආසනයේ නගර සභාවට අදාළ කොටස් පහක් තියෙනවා . එම කොට්ඨාශ පහටම ජයග්‍රහි නාගරික මන්ත්‍රීවරයෙක් ඊට පෙර සිටියේ නෑ.

නමුත් ඒ අඩුව පිරවීමට මට ශක්තියක් ලැබුණා. ජනතාවගේ කැමැත්තට අනුම්කන් දෙමින් ඒ ජනතාවගේ කැමැත්ත පරිදි මේ නගර සභාව තුළින් ලැබෙන වරප්‍රසාද ජනතාවට ලබා දෙමින් හොඳ සමාජ සේවකයෙක් වෙන්න බලාපොරොත්තු වෙමින්, මේ ලැබුණු අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් හොඳ ගමනක් යන්න දිවුරා ප්‍රකාශ කරමි මගේ වචන ස්වල්පය අවසන් කරනවා සියලු දෙනාටම සුභ දවසක් වේවා ... තෙරුවන් සරණයි.

<u>ගරු නගරාධිපතිතුමා.</u>

බොහොම ස්තූතියි ගරු මන්ත්‍රිතුමා මීළඟට අවස්ථාව ලබාදෙනවා රොෂාන් ඉස්මත් බුහාරි මැතිතුමාට.

<u>නාගරික මන්ත්‍රී රොෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා.</u>

ගරු නගරාධිපතිතුමනි, ගරු නගරාධිපතිතුමා ඇතුළු සියලුම නාගරික මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා මෙවර මෙම පළාත් පාලන මැතිවරණයට ඒමට අවස්ථාව ලබාදුන් අප දිස්ත්‍රික් නායිකා හා කාන්තා කටයුතු ඇමතිනි ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිනියට ඒ වගේම මගේ ස්තූතිය පළ කර සිටිනවා මගේ දෙමව්පියන්ට, මගේ ගුරුවරුන්ට මගේ ප්‍රදේශවාසීන් සියලුදෙනාටම. ඇත්තටම මෙවර මේ පළාත් පාලන මැතිවරණයට මම ඉදිරිපත් වීමට හේතුවත් මෙම කොට්ඨාශ ක්‍රමයයි.

මෙම කොට්ඨාශ ක්‍රමයේදී අපිට මේ අනුරාධපුර නගර සභා බල සීමාව ඇතුළත සිටින සියලුම ජනතාවට සේවය කරන්නට පුළුවන්. ඒ වගේම විශේෂයෙන් අපේ කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න තමයි මෙම පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වුණේ . ඒ අනුව, අද සිට පටන් ගන්නා මෙම මහ නගර සභාවේ සියලු වැඩකටයුතුවලට ජනතාවට ප්‍රයෝජනවත් වන සියලු ජනතා වැඩකටයුතුවලට මාගේ සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කරමින් මාගේ

දේශපාලන ව්‍යාපාරය තේමාවක් වූ '' just for diesen politics '' එම තේමාව ක්‍රියාකාරීව ඉටුකිරීමට කැපවෙන බව ප්‍රකාශ කරමි. බොහොම ස්තූතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තූතියි ඔබ තුමාට මීළඟ අවස්ථාව ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා</u>**.

ගරු නගරාධිපතිතුමනි, ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම යටතේ මම තීරණය කරනවා මට මෙතැනට එන්න උපකාර කර එ් සියළු දෙනාට ස්තුතිවන්ත වීමට. ප්‍රථමයෙන් ම නදීර කියන දරුවා බිහි කරපු අතපය හතර හොඳට හදපු පොළොවේ පය ගහලා ඉන්න පුළුවන් චරිතයක් බිහිකරපු මගේ දෙමව්පියන්ටත්, සහෝදරියන් දෙනාටත්, සහෝදරයන් දෙදෙනාටත් මම බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා.

ඒ වගේම නගරාධිපතිතුමා ප්‍රකාශකර පරිදි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන පක්ෂය කෙටි කාලයක් තුලදී බිහිකරමින් ඒ ජයග්‍රහණය ලබා ගැනීමට යෝධ ශක්තියක් වුණු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් මම බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම දිස්ත්‍රික් නායක එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමාටත් ඒවගේම එස්.එම්. රංජිත් සමරකෝන් එතුමාටත් විටක පියෙක් වගේ සහෝදරයෙක් වගේ දේශපාලන ගමන්මගේ ඡන්ද කටයුතු සිදුකරන අතරතුර දී සහයෝගය දැක්වූ බටහිර ආසන සංවිධායක කුමාරසිංහ මැතිතුමාටත් මාගේ විශේෂ ස්තූතිය පුද කරමි. අංක 5 ඉසුරුමුණිය පූජා නගරය කොට්ඨාසයෙන් තරග වැදුණු මට අවවාද අනුශාසනා ලබාදුන් සියලූම ස්වාමීන් වහන්සෙලාට මගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා.

ඒ වගේම සියලුම රැස්වීම් වලට නැගෙනහිර බටහිර භේදයකින් තොරව සියලුම කුඩා රැස්වීම්වලට පැමිණිලා සහයෝගය දුන් ෂෙහාන් සේමසිංහ මැතිතුමාට , එච්.බී.සේමසිංහ මැතිතුමාට මම ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම දේශපාලනයට පිවිසීමට පෙර උතුරු මැද පළාත් සභා ලේකම් කාර්යාලයේ සේවකයෙක් වශයෙන් රැකියාව කරද්දී දේශපාලනයට පිවිසීමට පන්නරය ලැබුණේ ඒ උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ සිරිපාල සභාපතිතුමා ඇතුළු පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ අනුර බුද්ධික ගුණසේකර මන්ත්‍රීතුමන්ලාගේ ඒ උපදෙස් හා ක්‍රියා කරපු ආකාරය දැකලා තමයි මේ පන්නරය මට ලැබුනේ. එතුමාටත් මගේ ස්තූතිය ප්‍රකාශ කරන්න කැමතියි.

ඒවගේම ඡන්ද ව්‍යාපාරය අතරතුරත් සියලූම රැස්වීමට ගිහිල්ලා අපිව දිරිමත් කරපු අපේ සෝමදාස මැතිතුමා, නියෝජ්‍ය නගරාධිපති තුමා ඇතුළු මන්ත්‍රීවරු සියලු දෙනාටත් ඒ වගේම ප්‍රාදේශීය සභාවෙන් තේරීපත් වූ සියලුම මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තූතිය ප්‍රකාශ කරන්න කැමතියි. ඒවගේම මේ ජයග්‍රහණය ලබන්නට ලැයිස්තුගත අපේක්ෂක ලෙස කටයුතු කරපු සෙනරත් බණ්ඩාර මැතිතුමා ඒ වගේම එතුමාගේ සහෝදරයා ඇතුළු පවුලේ සියලුම දෙනාට සහ අනෙකුත් සියලූම කණ්ඩායම් වලට ජයග්‍රහණය කරන්න වැඩ කරපු සියලූම දෙනාටම මගේ ස්තූතිය ප්‍රකාශ කරන්න මේ අවස්ථාව යොදා ගන්නවා. ඒ වගේම එදා මෙදා තුර සියලු බර කරට ගත්ත මාත් එක්ක සිටි සියලුම ජනතාවට ඒ වගේම අංක 5 ඉසුරුමුණි කොට්ඨාසයෙන් මාව තෝරා ගත් සියලුම ජනතාවට මං මගේ ස්තූතිය ප්‍රකාශ කරන්නට කැමතියි. අපේ අනෙකුත් පක්ෂ වලින් තේරී පත් වී සිටින මන්ත්‍රී දෙපළ මම මගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා.

තවද, මේ ලැබුණ ජනවරම ආරක්ෂා කරගනිමින් ඒවගේම මේ මැතිවරණය පවත්වද්දී මැතිවරණයක් ප්‍රචණ්ඩ ක්‍රියා කිසිවක් සිදුවුණේ නෑ අපේ කොට්ඨාසය තුළ. එබැවින් ලැබු ජනවරමට සාධාරණය ඉෂ්ට කරමින් අප විරාජ් මන්ත්‍රිතුමා ප්‍රකාශකර පරිදි මේ අහිංසක ජනතාවගේ බදු මුදල් වලින් අපි ලබන වැටුපට සාධාරණයක් ඉෂ්ට කරන්නට මේ අනුරාධපුර නගරය සුන්දර නගරයක් බවට පත් කරන්නට ඕනෑ ම වෙලාවක හරි දේ හරි දේ බවට දකිමින් ,වැරදි දේ වැරදි දේ ලෙස දකිමින් එය ආණ්ඩු පක්ෂයේ ද විපක්ෂයේ ද යන මතය නෙවෙයි ඒ මොහොතේම කතා කරන්න ඇප කැප වී සිටින බවට මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න කැමතියි. ඒවගේම අපිට ශක්තිමත් කණ්ඩායමක් ඉන්නවා ඒ කණ්ඩායම තුළින් මේ සියලු දෙනාම එකතුවෙලා අපට කොමසාරිස්වරයා ඉතාමත් අත්දැකීම් බහුල කෙනෙක්.

ඒ වගේම සහකාර කොමසාරිස් ඇතුළු සියලුම නිලධාරීන් සමඟ එකතුව කටයුතු කරමින් , මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ට ස්තුති ප්‍රකාශ කරමින් වැරදි දේ වැරදි විදිහට අපට පෙන්නලා දෙන්න, හරි දේට ප්‍රශංසා කරන්න. අවසන් වශයෙන් නැවතත් මේ සියලු දෙනාට ස්තූතිවන්ත වන අතර, ලබන්නාවූ සිංහල හින්දු අලුත් අවුරුද්ද සියලු දෙනාට ම සාමය සතුට සෞභාග්‍ය පිරි සුහම සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසන් කරනවා. ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තූතියි මන්ත්‍රීතුමා. ඊලඟට මං අවස්ථාව ලබාදෙන අපේ එම්.පී.එම්. අන්සාර් මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.පී.එම්. අන්සාර් මැතිතුමා.</u>**

බොහොම ස්තූතියි ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමනි, ගරු නාගරික මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන් මම සියලු දෙනාටම සුභ පතනවා. අනිත් කරුණ නම් මට දේශපාලනයට එන්න අත දුන්න කේ. බී රත්නායක මැතිතුමා. මම එතුමා මේ වෙලාවේ මතක් කරනවා. ඊළඟට සෝමසිංහ මැතිතුමා, එතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ දේශපාලන ගමන් මඟට , 252 තුලාන ජනතාව මට දුන්න උදව් වලට මම ජනතාවට ස්තුතිවන්ත වෙනවා. මම කොට්ඨාසයක් වශයෙන් තෝරලා ඒ ජනතාවට වැඩ කරන්න මාව පත් කළා. මට ජනතාව ගොඩක් උදව් කරා. රෑ දවල් නොතකා මගේ ඡන්ද වැඩවලට ගොඩක් උදව් කරා. මම බලාපොරොත්තු වෙනවා බහු ආසනයක් වශයෙන් ලැබුණේ සහෝදර මන්ත්‍රීවරු තව දෙපලක් ඉන්නවා. ඉතින් මම බලාපොරොත්තු වෙනවා මේ ජයග්‍රහණය විජයග්‍රහණයක් කරලා මේ නගර සභාව හොඳ සභාවක් බවට පත්කිරීමට මගේ පූර්ණ සහයෝගය ලබාදෙනවා කියමින් මම නිහඬවම ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**

බොහොම ස්තූතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට අපි අවස්ථාව ලබා දෙනවා නීතිඥ රංජිත් රාජකරුණා මැතිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතීඥ රංජිත් රාජකරුණා මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියේජ්‍ය නගරාධිපතිතුමනි, අද මෙම සභාව වර්ණවත් කිරීමට පැමිණ සිටින සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. හෘදයාංගම කෘතඥතාවය සහ සිහිපත් කිරීම මා සිදුකළ යුතුයි ශක්තිය, දැනුම, මහජනතාවත් එක්ක ඉන්න ඒ හැකියාව ලබා දුන්නේ මගේ පියාණන්ට මම ස්තුතිවන්ත වෙනවා. අද ජීවතුන් අතර නැති වුණත් මම හැමදාම ඒ දෙන්නට පින් දෙනවා. ඒ දෙන්නට කෘතඥතාව ප්‍රකාශ කර සිටිනවා.

ඊළඟට නගරාධිපතිතුමනි. මේ නගර සභාවය 1997 ප්‍රථමයෙන් පත් වෙලා එනකොට මා සමග ආව ආනන්ද දහනායක මන්ත්‍රීතුමා එවකට සභාපති ධුරයට පත් වුණේ මගේ හිතවත් වෛද්‍ය කල්දේරා මැතිතුමා. මට මතක් වුණා 1997 කාලයේ අපි තරුණයි අපි අවුරුදු අටක් එක දිගට හිටිය අපේ පක්ෂයෙහි. මට මතකයි ආනන්ද දහනායක මැතිතුමා, සුසිල් තිලකරත්න මැතිතුමා තේරිලා ආවා. කල්දේරා මහත්තයයි මමයි , අපි 4 දෙනා හිටියෙ විපක්ෂයේ. ඉතින් මම මේ අවුරුදු කීපයක විරාමයක් අරගෙන තමයි නැවතත් දේශපාලනයට ආවේ. මෙවර තරග කරන්න හේතු වුණේ විශේෂයෙන්ම කාරනා කීපයක් තියනවා. මගේ ජීවිතයේ වෘත්තිය අත්දැකීම් අවුරුදු තිහකට ආසන්න කාලයක් ගත කරා. මම කළ යුතු යුතුකමක් තියෙනවා මේ නගරය වෙනුවෙන්. මේ ඓතිහාසික නගරයක්. අර මන්ත්‍රීතුමා කිව්වා වගේ මේක ලෝක උරුමයක්. World heritage city එකක්. ඒ වගේම මම ඉපදිච්චි කොට්ඨාශයට මම තරග කළේ. මම ඉපදුනේ අනුරාධපුර පලවෙනි පියවර 249 තුලානට. මම කල්පනා කෙරුවා කොට්ඨාස ක්‍රමයට ඇවිල්ලා ප්‍රථම අවස්ථාව මම ඉපදිච්ච ඉස්පිරිතාල තියෙනවා මගේ තුලානේ.

ඒ නිසා මම හිතුවා මට ලැබුණ අවස්ථාව හොඳ අවස්ථාවක් කර ගන්න. ඒ නිසා මම තීරණය කෙරුවා තරග කරන්න ඒත් එක්කම එච්.බී. සේමසිංහ මැතිතුමා මට දේශපාලනයට ආරාධනා කලේ. 1997 දී මම විදෙස් සංචාරයකට ගිහිල්ලා ආපුහම මට පණිවිඩයක් එවලා තිබ්බා රංජිත් ඇවිල්ලා හම්බවෙන්න කියලා. එතුමා මට කිව්වා තරග කරන්න ඕන කියලා. මම දේශපාලනයට ඇතුල්කරන්න එච්.බී. සේමසිංහ මැතිතුමා එවකට, නැගෙනහිර ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායක බොහොම දේශපාලනයෙන් මුහුකුරාගිය අයෙක්. මම සිහිපත් කරන්න ඕනේ මෙවර මේ තරගයට මාහට තරමක් පෙළඹුවා හිටපු අග්‍රවිනිශ්වයකාර සරත් එන්. සිල්වා මැතිතුමා මගේ හිතවතා ඉල්ලීමක් කරා මේ පාර තරග කරන්න ඕන ඇති දැන් මේ රස්සාව කලා කියලා. ඒවගේම 249 සහ 252 බහු ආසනයක් වශයෙන් මා හට අවස්ථාව ලැබුණා තරඟ කරන්න. මම සන්තෝෂ වෙනවා මේ බහු ආසනයට තරග කරන්න ඉදිරිපත් වෙච්ච එක මොකද මේ බහු ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරු මේ සභාව ඉන්නවා අල් ෆාරීස් මැතිතුමා, අන්සාර් මැතිතුමා , රොෂාන් බුහාරි මැතිතුමා ඒ වගේම මම සන්තෝෂ වෙනවා මුස්ලිම් සහෝදර මන්ත්‍රීවරු තුන්දෙනෙක් එක්ක මට සහයෝගයෙන් වැඩකරන ලැබීම ගැන.

විශේෂයෙන්ම කියන්න ඕන මේ නගර සභාව ඓතිහාසික වශයෙන් පමණක් නොවෙයි ලෝක උරුමයක් හැටියට මේ නගරයේ ජීවත්වන අපි පමණක් නෙවෙයි මුළු ලංකාවේ සතර දිග්භාගයේම ජනතාව එනවා. ලෝකයේ සියලුම රටවල්වල මම හිතන්නේ ආපු නැති කෙනෙක් නෑ අනුරාධපුරයට. ඇමරිකාව වෙන්න පුළුවන්, ජපානය වෙන්න පුළුවන්,මේ පැත්තෙන් එංගලන්තය අනිත් පැත්තෙන් ඕස්ට්‍රේලියාව මේ රටට ආවම අනුරාධපුරය දක්වා පැමිණුනේ නැති කෙනෙක් නැහැ . ඒ නිසා මේ තත්ත්වය අපට වැදගත්. අපට යුතුකමක් තියෙනවා මේ නගරය හා අවශ්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් කතාකරොත් පහසුකම් සැලසීම අයිති නගර සභාවට තමයි. ඒ වගකීම තියෙන්නේ විශේෂයෙන් ඔබතුමාලා ආඥා පනත 4 වන වගන්තිය කියෙව්වොත් තේරෙයි. එහි සටහන් වන ආකාරයට පාර්ලිමේන්තුවක ඇමතිවරයකුට වත් නැති මහජනතාවට සැප පහසුකම් , සුභසාධන පහසුකම් කටයුතු මහජන සෞඛ්‍ය ඇතුළු සියල්ල තියෙන්නේ අපට. එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට කරන්න බෑ .

මේ නාගරික මන්ත්‍රීවරුන්, නගරාධිපතිතුමා, උප නගරාධිපතිතුමා ඇතුළු මේ කාර්ය මණ්ඩලයට විශාල වැඩ කොටසක් තියෙනවා ඒ වගේම තව කාරණයක් තියෙනවා දැන් ලෝක තත්වය වෙනස් වෙලා පරිසරය පිළිබඳ ප්‍රශ්නය දැඩි ලෙස බලපානවා. කාලගුණික තත්වයන් වෙනස් වෙලා , දේශගුණික තත්වයන් වෙනස් වෙලා, විශාල ආපදා ඇතිවෙනවා ස්වභාවික ව්‍යසනයන් ඇතිවෙනවා අපට මුහුණ දෙන්න තියෙන ප්‍රශ්ණ ඒවා. දැන් සුළි සුළඟක් ඇවිල්ලා ගහක් වැටුණු ගමන් අන්න නගර සභාවට කියන්නේ. ජලය රැඳෙනවා ඒවා අපට ඒ කියන්නේ. ඒවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට

කියන්නේ හෝ පළාත් සභා මන්ත්‍රීවරුන්ට කියන්නේ නෑ. ඒකයි මම කියන්නේ අපිට තමයි මේ වෙලාවේ වැඩිම වගකීම තියෙන්නේ. ඒ නිසා මේ සා විශාල වැඩකොටසක් කරන්න තියෙනවා ඉදිරි අනාගතයේදී අභියෝග වැඩි නිසා මම හිතන්නේ පක්ෂ දේශපාලන භේදයකින් තොරව අපි සියලු දෙනාම එකතු වෙලා වැඩ පිළිවෙළක් හදලා සාකච්ඡා කරලා ක්‍රියාත්මක කළොත් මම හිතන්නේ ලංකාවටම ආදර්ශයක් වේවි.

ඒ වගේම මම තව කාරණයක් කියන්න ඕන විශේෂයෙන්ම අනුරාධපුර නගර සභාවේ කටයුතු කරගෙන යෑමේදී නිලධාරි මණ්ඩලය නාගරික කොමසාරිස්තුමාගේ ටීම් එක ඒ බැටැලියන් එක හරිම වැදගත් . ඒ නිසා මම හිතනවා එතුමන්ලාගෙන් මම විශේෂ ඉල්ලීමක් කරනවා අපි සැලසුම්කරණ ප්‍රතිපත්තින් හා යෝජනා අනුව කටයුතු කරන්න සහයෝගය දෙන්න කියලා. ඒ වගේම ගරු නගරාධිපතිතුමානි මම විශ්වාස කරනවා සියලුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීතුමන්ලා නගරාධිපතිතුමා උප නගරාධිපති තුමා ප්‍රමුඛ සියළුම දෙනා අපේ නගරයේ තියෙන සංකල්පය යටතේ පක්ෂ භේද, පාට භේද, ජාති භේද , ආගම් භේද අමතක කරලා අපේ නගරය කියන තේමාව යටතේ මම හිතන්නේ වැඩ කලොත් අපට විශාල ප්‍රතිඵලයක් ලබාගන්න පුළුවන් .

අවසන් වශයෙන් මම ස්තුතිවන්ත වෙන්න ඕනේ අද මේ වැඩසටහන පටන් ගන්නකොටම කමිටු සකස් කිරීමේදී ඇතිවෙච්ච තත්ත්වයන් සම්බන්ධයෙන් . අපේ හිතවත් ජ්‍යේෂ්ඨ නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමාත් ඉන්දික අරුණ කුමාර මැතිතුමා පනතේ 26 වන වගන්තිය යටතේ තියෙන කරුණ ගැන ප්‍රකාශ කරලා ප්‍රශ්නයක් ඇති වුණා . අපි සහයෝගය දුන්නා ඒක නිරාකරණය කරගන්න . ඒ නිසා තියෙන ගැටළු අපි හදාගමු. අපට වෙනසක් කරන්න තියෙනවා නම් ඒ තුළ අපට ඒවා හදාගන්න පුළුවන් . අපි දැඩි ලෙස ඉන්නේ නෑ යම් කාරණා වලදී. අපිට ඕන නම් ඒ අය ගැන කතා කරලා ඒක නිවැරදි කරගන්න පුළුවන් . එක ලොකු ප්‍රශ්නයක් නෙවේ.

ඒ වගේම මම හිතන්නේ ඉදිරියේදීත් අපි ඔබතුමන්ලගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා පක්ෂ විපක්ෂයකින් තොරව. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා වගේ අපි අතින් වැරදි තීරණයක් ගත්තොත් තමුන්නාන්සේලා විරුද්ධ වෙනවා කියලා එක අනිවාර්යයි. වැරදි තීරණයක් ගත්තොත් තමුන්නාන්සේලා විතරක් නෙමෙයි අපිත් විරුද්ධයි ඒ තමයි අපේ හෘද සාක්ෂිය කියන්නේ . එනිසා මා හිතනවා සියළුම දේට විරුද්ධ වෙන්නේ නැතුව වැරදි දේට විතරක් විරුද්ධ වෙයි කියලා. ඒ වගේම මගේ ඡන්ද ව්‍යාපාරයේදී තිරයෙන් පිටුපස තව කෙනෙක් හිටියා මට මේ අවස්ථාවේදී මතක් කරන්න ඕන ලයිස්තුවෙන් හිටිය ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා අපේ ලැයිස්තුවේ හිටපු සහෝදරයා. මම එතුමාවත් මතක් කරනවා ඒ අනුව අපි ඉදිරියේදී එකතුවෙලා වැඩ කරමු. ඒ වගේම මෙම අද දින මෙම උත්සවය සංවිධානය කරපු අජන්ත ගුණවර්ධන කොමසාරිස් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මගේ විශේෂ ස්තුතිය පිරිනමනවා . මෙතන දැන් මම දැක්කා ගරු නගරාධිපතිතුමා අද හවසට හම්බවෙන්න කියලා. ඒ ආරාධනයටත් මම ඔබතුමාටත් ,නියෝජ්‍ය නගරාධිපති තුමාටත් ,නාගරික කොමසාරිස්තුමාටත් ස්තුති වන්ත වෙනවා. ඒ වගේම මගේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට නම් මම සුබපැතුවා . නමුත් මට විපක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුන්ට නිදහසේ සුභ පතන්න බැරි උනා. ඒ අනුව මම මේ අවස්ථාවේ විපක්ෂයේ සියලු දෙනාටම සුභ පැතුම් එකතු කරන්නත් අවස්ථාව ලබා. ඒත් සමඟ මගේ කතාව මෙතනින් අවසන් කරනවා.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා ඊළඟට මම අවස්ථාව ලබා දෙනවා නගර සභාවේ ජ්‍යේෂ්ඨතම මන්ත්‍රී ආනන්ද දහනායක මන්ත්‍රීතුමාට මේ සභාව අමතන ලෙසට.

**<u>ගරු නාගරික මන්ත්‍රී ආනන්ද දහනායක මැතිතුමා</u>.**

ගරු නගරාධිපති තුමනි , නියෝජ්‍ය නගරාධිපති තුමනි ගරු නාගරික මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, අපේ නගර සභාවේ කොමසාරිස්තුමනි, ඒවගේම අපේ කාර්ය මණ්ඩලය සහ මේ අවස්ථාවට සහභාගී වූ සියලු දෙනාගෙන්ම අවසරයි. 2018 පෙබරවාරි 10 වැනි දින පැවැති පළාත් පාලන මැතිවරණයේදී විශේෂයෙන්ම මම නියෝජනය කරපු කොට්ඨාසයෙන් ඡන්දය ලබා දීලා මාව නැවතත් පත් කර ගත්තට මගේ ප්‍රදේශවාසීන්ට, ඡන්දය පාවිච්චි කළ ඒ සියලු දෙනාට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. මට මේ සභාවේ දී නිතරම ඇහෙනවා මගේ අවුරුදු 28ක දේශපාලන ජීවිතය නිසා " ජ්‍යේෂ්ඨ " කියන නාමය දීලා නිතරම අමතනවා. මට අන්තිමේදි ඉතුරු උනේ " ජ්‍යේෂ්ඨ " කියන කෑල්ල විතරයි වෙන සත පහක දෙයක් ඉතුරු උනේ නෑ. 1991දී අලුතෙන්ම ඇතිවෙච්ච මනාප ක්‍රමය තුළ තමයි මම මේ තරඟ කළේ අනුරාධපුර මහ නගර සභාවට. ඒ කාලය නගර සභාව තිබ්බ කාලය.

අනුරාධපුර නැගෙනහිර ආසන සංවිධායක එච්.බී. සේමසිංහ මැතිතුමා, බටහිර ආසන සංවිධායකතුමත් මාත් එක්ක තරග කළේ මාත් එක්ක නගර සභාවට එතකොට එතුමා තරඟ කරලා ඉවර වෙලා විපක්ෂයේ නායකයා වශයෙන් හිටියා. ඒ අනුව 91 ඉඳලා අද වෙනතුරු අඛණ්ඩව අපරාජිතව මේ ක්ෂේත්‍රයේ ඉන්නවා. ඉතින් මම සතුටු වෙනවා මොකද මනාප ක්‍රමය අවසන් වෙලා නැවත ඇර කොට්ඨාස ක්‍රමයෙන් ජනතාව මාත් එක්ක සිටීම සම්බන්ධයෙන්. ඒ එක්කම නගරාධිපතිතුමනි, මෙවර අද දේශපාලන පක්ෂ වලින් සැදුම්ලත් විපක්ෂයක්. අපේ නමුත් බහුතර ජයග්‍රහනය පොහොට්ටුවෙන් කරල තියෙන්නෙ අපේ ඒ ජයග්‍රහණය අපේ හිටපු ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා මා මේක පිටුපස සිටියේ නැත්නම් සිටියේ නැත්නම් අපට ජයග්‍රහණය කරන්න ලැබෙන්නේ නැහැ. අද අපි උදාහරණයක් වශයෙන් ගත්තොත් අද අනුරාධපුර නගර සභාව කොට්ඨාශ 15 ම ජයග්‍රහණය කරන්න හැකියාව ලැබිලා තියෙනවා ඒ ජයග්‍රහණයෙන් පස්සේ විශාල ජයග්‍රහණයක් කරා ඉන්පස්සෙ ඒ තුළ විපක්ෂයට සාමාන්‍යයෙන් හේනේ සුළු කොටසක් කියලා නමුත් බලං ගිහාම අපෙන් පහලවයි , එහෙන් දාහතරයි .

ඉතින් මේකේ විශාල පහසුව කුත් නෑ ලේසිය කුත් නෑ අපි සතුටු වෙනවා මේ මන්ත්‍රීතුමන්ලා ගොඩක් පිරිසක් අපිත් එක්ක සම්බන්ධවීම ගැන. මේ නගරයේ ඉදිරි සංවර්ධන කටයුතු ඉටුකිරීමට. නමුත් අර වෙනසකට තියෙන්නේ පහුගිය තිබිච්ච කාලවකවානුව වගේ නෙමේ. අපට ඡන්දයකින් යන්නත් අපහසුතාවය කුත් තියෙනවා. නමුත් කෙසේ හෝ මේ ගමන යන්න ඕනේ , නගරය සංවර්ධනය වෙන්නත් ඕන. මෙතන කතා කරපු හැම කෙනෙක්ම කිව්වේ වැරදි දේ වැරදියට දැකලා නිවැරදි දේ නිවැරදි විදියට දැකීමෙන් තමයි සත්‍යය සහ යුක්තිය ඉටු කළ හැකි කියලා. ඇත්තටම මමත් දැන් මේ දේශපාලනයට අවුරුදු විසි හතක් වෙනවා ඒත් ඒ කාලය මට ගෙවා ගන්න බැහැ වැරදි දේ වැරදි විදිහට දැක්කෙ නැත්නම්. ආණ්ඩු පක්ෂය හෝ වේවා, විපක්ෂයේ හෝ වේවා, මගේ කාලසීමාවේ දී වැරදි දේ වැරදි විදිහට දැක්ක නිසා අපි නිසි පරිදි කටයුතු කරගෙන ගියා. ඒ අනුව මම හිතනවා ඉදිරියේදී තමුන්නාන්සේලා සියලු දෙනාම එකතු වෙලා මේ අනුරාධපුර නගරය වැඩිදියුණු කරන්න සහයෝගය ලබා දෙයි කියලා. ඒ සඳහා සියලු දෙනාගෙන්ම ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ස්තුති මන්ත්‍රීතුමනි ඊළඟ අවස්ථාව අපි ලබාදෙනවා දුමිඳ දයාසෙන් රූටියල මන්ත්‍රීතුමාට

**<u>ගරු නාගරික මන්ත්‍රී දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි ගරු උප නගරාධිපති තුමා ඇතුළු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම අවසරයි . මට මේ වෙලාවේ පළමුව සිහිපත් වෙනවා මගේ දෙමව්පියන් දෙපල, හා දේශපාලනයට පිවිසෙන්න මූලික උවමනාව තිබුනේ මගේ පියාට. මම ව්‍යාපාරිකයෙක් ව සිටිය දී දේශපාලනය යොමුකර මගේ මව සහ පියා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. එතුමන්ලාට වුවමනාවල වෙලා තිබුනෙ ඒ . දෙපලගේ උපදෙස් පරිදි මම වසර 5 ක් කටයුතු කළා. මට කියා සිටියේ දේශපාලනය තුළ කිසිම අන්සතු දෙයක්, සභාව සතු දෙයක්, නොගන්නා ලෙසත් , ඒ වගේම මගේ නම දාලා තියෙන්නේ දුමිඳ, දුමිඳු කියන්නේ බෝධිය කියන සත්‍යය ඒ අනුව කටයුතු කරන ලෙස මට කියා සිටියා. මම පහුගිය කාලය තුළ ඒ ආකාරයෙන් මම කටයුතු කළා කියලා මම හිතනවා.

ඒ වගේම ඒ අවස්ථාවට මාව දෙමව්පියෝ යොමු කරන අවස්ථාවේදී මම මහා සංඝරත්නයෙන් අවසර ගත්තා. ඒ වෙලාවේ අපේ ජයන්ති පන්සලේ හාමුදුරුවෝ කියා සිටියා රැටියල මල්ලි ඡන්දය ඉල්ලුවට කමක් නෑ රගන්න හදන්ඩ එපා කියලා. පහුගිය කාලේ ඒ උපදෙස් පරිදි කටයුතු කළා ඒ වගේම මිරිසවැටිය නායක ස්වාමීන් වහන්සේගේ අවවාද අනුශාසනා මත උන්වහන්සේ කියා සිටියේ ඔබතුමා ඡන්දය ඉල්ලන්න ඇපල් ගෙඩියක් වගේ ගිහිල්ලා කවදාකවත් කලු තිතක් එකක් තියා ගන්න එපා කියලා , උපදෙස් අනුශාසනා දුන්නා. ඒ ස්වාමීන්වහන්සේලාත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒවගේම මේ ඡන්ද ප්‍රතිඵලය ලබා දෙන්න ප්‍රථම ඒ ඡන්ද ප්‍රතිඵලය ගැන කිවූ අපවත් වී වදාළ ගිරාඹේ නායක ස්වාමීන් වහන්සේ වත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ අය වගේම මම දේශපාලනයට පිවිසෙද්දී අන්‍යාගමිකයෙක් පූජකතුමන්ලාත් මට එවකට උපදෙස් දුන්නේ රියාස් මව්ලවි පූජකතුමා වත් මම ව්‍යවස්ථා දී මතක් කරනවා.

ගරු නගරාධිපතිතුනි, තුන්වනුව මගේ ගුරුවරුන්, ඒ වගේම මට අධ්‍යාපනය ලබා දුන් ගුරුවරුන් ඒ වගේම, මම අවුරුදු හතලිස් ගානක කාලයක් තුල මං යම් කිසි ක්‍රීඩාවක නියැලිලා සිටිනවා. ඒ කාලය තුළ අභියෝගය තුළ මුහුණ දෙන්න මට ශක්තිය ලබාදුන් සියළුම ගුරුවරුන්ටත් මුදල් වලට වහල් නොවන්න කියලා කුඩාකල කියලා දුන්න මගේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ මුල්ම ගුරුවරයා වත් මම මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

ඒ වගේම මේ මැතිවරණ ක්‍රමය තුළ අපිට ලැබුනු අවස්ථාවක් අලුත් පක්ෂයකින් ඉදිරිපත් වෙන්න. කාලයක් තිස්සේ අපිට මැතිවරණයක් නැතුව මේ අලුත් පක්ෂයකින් ඉදිරිපත් වෙන්න අවස්ථාව ලබා දුන්නා. ඒ වගේම මං ආණ්ඩු පක්ෂයෙන් මුලදී ඉල්ලන්න ප්‍රතික්ෂේප කරලා වෙනත් පක්ෂයකින් තමයි මුල් අවස්ථාවේදී දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පක්ෂයේ එවකට හිටිය දිස්ත්‍රික් නායක විදිහට සමරකෝන් මහත්තයා අද අප අතර නෑ . එතුමා සිහිපත් කර සිටිනවා.

ඒ වගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මට ඔහුගේ කාලය තුළ මන්ත්‍රීවරයා විදිහට පක්ෂයක අවස්ථාව ලැබුණට පස්සේ එතුමා මාව දිස්ත්‍රික්කය නායකයා කළා පක්ෂයේ ඒ තුළ මට පළාත් සභා ඉල්ලන්න හම්බ උනා ඒ අනුව මම ඡන්ද නවදාස් ගාණක ඉදිරියෙන් හිටියා. පාර්ලිමේන්තු මැතිවරණය ඉල්ලන හම්බ උනා ඒ අවස්ථාවේදී ඡන්ද දාහත් දහස් ගණනකින් මම ඉදිරියෙන් හිටියා . මේ නැවතත් නගර සභා අපේක්ෂකයෙක් හැටියට ඉල්ලන්න පොහොට්ටුව ලකුණෙන් ලැබුණා. ඒ අවස්ථාවේදී මම ජයග්‍රහනය කළා . ඒ ජයග්‍රහණයට උර දුන් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රි තුමන්ලා ඒ වගේම සේමසිංහ මැතිතුමා, ශෙහාන් සේමසිංහ මැතිතුමා ගරු දිස්ත්‍රික් නායක එස්.එම් චන්ද්‍රසේන මැතිතුමා ඇතුළු සියලුම පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාටමත් මේ අවස්ථාවේදී ස්තුතිය ප්‍රකාශ කර සිහිපත් කර සිටිනවා.

ඒ වගේම නගරාධිපතිතුමනි මට මේ දිස්ත්‍රික්කය තුළ ජනතාව මෙන්ම මේ නගර සීමාව තුළ ජනතාව මෙන්ම, මගේ කොට්ඨාශයේ සියළුම ජනතාව මට මේ ජයග්‍රහණය සඳහා ශක්තිය ලබා දුන්නා. ඒ අනුව මේ සියලු දෙනාම මේ අවස්ථාවේ සිහිපත් කරමින් අද මෙම අවස්ථාවට අපේ ආරාධනය පිළි අරගෙන පැමිණි සියලුම මාධ්‍යවේදී මහත්වරුන්ට ඒවගේම නිලධාරි මහත්තරුන්ට ඒ වගේම අපේ කොට්ඨාශ වල සියළුම මන්ත්‍රීතුමන්ලා නියෝජනය කර පැමිණි සියලුම ජයග්‍රහණය සඳහා උරදුන් සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරන අවසන් කරනවා. ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**.

ස්තුතියි ඔබ තුමාට මීළඟ අවස්ථාව අපේ ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමාගේ නියෝජ්‍ය නගරාධිපති තුමනි නාගරික මන්ත්‍රීතුමනි නාගරික මන්ත්‍රී තුමියනි ප්‍රථමයෙන්ම මා දෙවැනි අවස්ථාවට නගරාධිපති ධූරයෙන් පිදුම්ලත් ඔබතුමාටත්, පළවෙනි වතාවට නියෝජ්‍ය නගරාධිපති ධූරයෙන් පිදුම්ලත් බුද්ධික මැතිතුමන්ටත් සුභාශිංසන පිරිනමනවා. ඒ වගේම සියලුම මන්ත්‍රීතුමනි මන්ත්‍රීතුමියනි ඔබලාගේ ජයග්‍රහනය ටත් මාගේ හෘදයාංගම සුබපැතුම් එකතු කරනවා.

ඒ වගේම ගරු නගරාධිපති තුමනි ආශිර්වාදය ලබාගත් මා මුලින්ම 255 තුලානේ වික්‍රමශිලා ධර්මායතන නායක හිමිපාණන් සහ එහි සියලුම සංඝයා වහන්සේලාට සහ ශ්‍රී භාරතීඥ විහාරස්ථානයේ නායක හිමිපාණන් සහ අනිකුත් සංඝයා වහන්සේලාට මාගේ හෘදයාංගම මං මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වගේම 255 තුලානේ අද දහහත් වැනි වරටත් මහජන නියෝජිත වරයෙක් හැටියට තේරී පත් වන්නට උදව් උපකාර කර ඒ සියලු දෙනාට මාගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ විතරක් නෙවෙයි ගරු නගරාධිපති තුමනි වර්ග කිලෝමීටර් 32ක ප්‍රමාණයකින් දාහත් වසරක් මේ කොට්ඨාසය දාසයේ මේ සියලුම සියළුම ජනතාව දුන් සහයෝගය නිසා තමයි මම අද මහජන නියෝජිතයකු ලෙස පත්වීමට මා භාග්‍ය ලැබුවේ. ඒ සියළු දෙනාටම මගේ ස්තුතිය පුද කරනවා. ඒ වගේම ගරු කොමසාරිස්තුමා නියෝජ්‍ය කොමසාරිස්තුමා ඇතුළු, ඒවගේම ඉංජිනේරු අංශය, ආදායම් අංශය ,සෞඛ්‍ය අංශ පාලන අංශය , නඩත්තු අංශය ඒ සියලුම අංශ ප්‍රධානීන් ඇතුළු සියළුම නිලධාරීන්ට පුස්තකාලාධිපති තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් , ඒ වගේම සුසානභූමිය පාලක සියලුම කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කරනවා. ඒ විතරක් නෙමේ සනීපාරක්ෂක මේ සියළුම මහත්ම මහත්මීන් බිම තියන ටොපි කොලේ පවා අද ඇහිදලා මේ නගරය අලංකාර කිරීම සම්බන්ධව විශේෂ ස්තුතියක් ඒ අයට පුදකරන්න ඕන.

නාගරික මන්ත්‍රීවරයෙක් හැටියට තේරීපත්වීමට නාගරික කොමසාරිස් තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය ගත් මෙහෙය විශාල රුකුලක් වුණා මේ ගමනට. ජනතාව අතරට යන්නට හැකිවුණේ ඒ අය විසින් කළ යුතු සියලු කාර්යන් හැකිතාක් දුරට ඉටු කිරීම ගැන මා නැවතත් ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා . ඒ වගේම අපිත් එක්ක දැනට වසර 16 සිට මේ මාධ්‍යවේදී මහතුන් අපිත් එක්ක මා දන්නා තරමින් මේ අය එකතු වෙනවා. ඒ අයටත් අපේ ස්තුතිය පුද කරනවා. ඒ විතරක් නෙමෙයි අපේ මේ ජයග්‍රහණය වෙනුවෙන් අපි පහළොස් දෙනාම සියළු අවස්ථාවල නගර සභා සීමාව

තුළ , අපේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු විපක්ෂනායකතුමා විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනේ අපි සියලු දෙනාට විශාල සහයෝගයක් ලබා දුන්නා .

ගරු නගරාධිපති තුමනි මගේ කතාව නම් හිතාගෙන ආපු විදිහ වෙනස් කරන්න වෙනවා යම් යම් මන්ත්‍ර මන්ත්‍රීවරුන් සිහිපත් කර කරුණු කාරණා අනුව. මාගේ සුබපැතුම් වගේම සුදු හුණු ගාන්න මේක අවස්ථාවක් කරගන්නෙ නෑ ඇත්ත කියන්න ඕනෙ. බුදුහාමුදුරුවොත් දේශනා කරල තියෙනවා වැරදි කරන පුද්ගලයෙක් ගැන හොඳ කියන්න යන්න එපා ඒක විශාල පාපකර්මයක් කියලා, ඒවගේම වැරදි නොකරන කෙනෙක් පිට වැරදි පටවන්න එපා එක විශාල පාපයක් කියලා. විශේෂයෙන් මතක් කරන්න ඕන මේ අපේ ආසන සංවිධායක තුමා අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී තුමත් අපි හදපු ඉස්ටේජ් වලට ඇවිල්ලා මේ ජනතාව අමතලා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කිරීමට කල කැපවීම් වලට ඉදිරියේදී අවශ්‍ය ස්ථාන ලැබෙයි.

ඒ වගේම මොන හේතුවක් උඩ ද දන්නෙ නැහැ ප්‍රතිශතය සහ ජ්‍යේෂ්ඨත්වය තියෙද්දී කුමන හේතුවක් මත ළඟට ගිහින් කතා කළා කරලත් එය නොතකා නම් දෙකක් පමණක් නිර්දේශ කරලා යවලා තවත් කෙනෙකුට ඊර්ෂ්‍යා කරන්න තරම් ආසන සංවිධායකවරයෙක් මේ වගේ වෙයි කියල හිතුවෙ නෑ. කුමන හෝ හේතුවක් මත ඔබතුමන්ලා දන්නවා නායකයෙක්ගේ ගුණාංග මොනවද කියල. මේ සභාවේ සමාරම්භක උත්සවයට නිකමටවත් සුබ පැතුම් එක් කරලා කඩදහි කෑල්ලක්වත් එව්වේ නැති ආසන සංවිධායක තුමෙක් සහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්

. මොකද ගොඩක් අය ස්තූති කරා ඇත්ත. අපිත් ස්තූති කළා. එකනේ මම අවුරුදු දහසක සිට අවසාන මොහොත දක්වාත් මේතුමත් එක්ක වැඩ කරන්නේ. අන්තිම මොහොතෙදිත් ඇහුවා දැන් මෙතුමා. මං විශේෂයෙන් කියන්නම් අපේ නලින් මන්ත්‍රීතුමා කතාවක් කිව්වට ප්‍රතිශත සහ යම් ආකාරයකට මන්ත්‍රීවරයෙක් හැටියට යන ගමනේදී නොයෙකුත් වෙනස්කම් ඒ ප්‍රතිශතය අඩු කිරීමේ හැකියාව තියෙනවා කියලා. මම හිතන්නේ මන්ත්‍රීවරයෙක් හැටියට ඉදිරිපත් කිරීමේදී නාමයෝජනා බාර දෙන්න නෑ ඒ ප්‍රශ්න තියනවනම්. නාම යෝජනා භාර දීලා සුදුසුකම් ලත් අවස්ථාවක කරපු වැඩේ මොන තරම් පහත් වැඩක් ද කියන එකයි මගේ මතය.

එබැවින් ඔබ වැනි නායකයන් මීළඟට එන මැතිවරණයේදී මම විශ්වාස කරනවා දිට්ඨධම්මවේදනීය සේ ඒ ඒ ජනතාවගේ අවශ්‍ය ප්‍රතිචාර ලැබෙයි, ඒ විතරක් නෙවෙයි ගරු නගරාධිපතිතුමනි, ඔබ මේ පලවෙනි පුරවැසියා හැටියටත්, මෙතුමන් දෙවැනි පුරවැසියා හැටියටත් මේ දක්වා අසාධාරණයක් වුණා නේද කියලා මගෙන් නිකමටවත් විමසීමක් කළේ නෑ . එයින් යම් සතුටක් ලැබේ ද ඒ සතුට මගේ සතුට බවට මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අත්හැරීම් කියන ඒවා පුරුදු වෙන්න ඕනේ වෙන්න ඕනේ බුදුදහම අනුව සුදුසු තැන ඉන්න පුරුදු වෙන්න ඕනේ තව තැනකට පනිනවා නම් තමන් හිතන්න ඕනේ මම මේ කරන වැඩේ හරිද කියලා යම් කෙනෙක් එයාගේ බලතල ඇසුරෙන් පුළුවන්කම් නීත්‍යානුකූලව ජනතා කැමැත්තෙන් හෝ දේශපාලන හයියෙන් ඉවු කරන අවස්ථාවක තවත් කෙනෙක්ගෙ තැනක් තියෙද්දි මට යෝජනා කරනවා ඔබ එතැනට යන්න ඕන කියලා මම නම් බාරගන්නේ නෑ මොකද අවුරුදු දාසයක් හිටපු දිවංගත ප්‍රධාන අමාත්‍ය ගරු බර්ට් ප්‍රේමලාල් දිසානායක මැතිතුමා කලින් ළඟින්ම ඇසුරු කළා මම මේ සියලු දෙනාම දන්නවා.

මට ඒ කාලෙදි කිව්වා එතුමා ඉල්ලන්න මේ සඳහා ඉල්ලන්න කියලා මම කිව්වා එපා කවදාහරි දවසක සුදුසු තැනක් එයි එදාට කතා කරමු කියලා. එදා ඒ කියපු කතාව අවස්ථාව ලැබුණ අවස්ථාවට වෙච්ච දේ, මේ නගර වාසීන්ට රහසක් නෙමෙයි. හැමෝම අහනවා ඒ අයටත් කියන්න ඕන නැත්නම් මේ කාරණය හංගගෙන ඉන්න අවශ්‍ය නෑ . මොකද මම වරදක් කරලත් නෑ වරදක් කළා නම් ජනතාව මාව ප්‍රතික්ෂේප කරන්න ඕනේ. ප්‍රතික්ෂේප නොකර එවපු මට යම්කිසි

පෞද්ගලික පලිගැනීමක් හෝ වෙනයම් කරුණක් තියෙනවා නම් ඒක ප්‍රසිද්ධියේ කියන්න ඕනේ නායකයෝ කියන්නේ හැංගිලා ඉන්න අවශ්‍ය නෑ. කෙළින් ඇවිල්ලා වැඩ කරන්න පුළුවන් නායකයන්ට යන්න ඇරලා කකුලෙන් අදින්න මට වෙච්ච අසාධාරණය මම මේ මට ලැබුණු ලිපිය සභාගත කරනවා. ( ඇමුණුම අංක 02 ) යම් යම් හේතූන් මත 50% නොතේරුවා කියලා අපේ නලින් මන්ත්‍රීතුමා කිව්වා. පක්ෂ මූලස්ථානයෙන් මට එවලා තියෙනවා ලිපියක්. රහස් නෙමෙයි මේ ඇත්ත මේ වගේ ආසන සංවිධායකවරු සහ වගකියයුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හන්දා යන්ඩ ඇරලා කකුලෙන් අදින නායකයෝ ගැන ජනතාව තීන්දු කරන්න ඕන ඉදිරියටත් මේ අයටත් එක්ක ඉන්නවද නැද්ද කියල ඇත්තටම සුබාසින්සන ප්‍රාර්ථනා කරන්න ආපු මංගල සභාවේ කීමට සිද්ධ වුණේ යම් යම් මන්ත්‍රීවරුන්ගේ කථාවනුත් සමඟයි ඒ වගේම අපේ මන්ත්‍රීතුමා ජේෂ්ඨතම ආනන්ද දහනායක මැතිතුමා කිව්ව, එතුමාට ඉතුරු වෙලා තියෙන්නේ ජේෂ්ඨත්වය විතරයි කියලා. මං හිතන්නේ ඒ අවුරුදු දාසය තුළ මට ජේෂ්ඨත්වය නැතිවෙලා වගේ මේ වගේ නායකයොත් එක්ක. එකත් රහසක් නෙවෙයි.

එක වෙලාවකට මට හිතෙනවා ආවේගශීලී වැඩි උනා වගේ, මනසට මට හිතෙනවා කියලා කියන්න ආපු දේවල් අමතක උනා වගේ වෙලා කියලා, ඉතිං මේ වගේ දේවල්වලදී ප්‍රතිශතයක් තිබිලා ජේෂ්ඨත්වය තිබිලා නිහතමානීව හිටි, වෙනත් සභාවල මේ දිවයිනේ දැකලා තියෙනවා පත් කරන අවස්ථා වල ගල් මුගුරු සහ එක එක අමනාපකම් හදාගෙන සභාවල ගහගන අපි එහෙම වෙන්න අවශ්‍ය නෑ. මොකද අත්හැරීම් කියන ඒවා අපි පුරුදුවෙලා තියෙනවා ඒ නිසා නිහතමානී විදිහට ඇවිල්ලා ආරම්භක උත්සවයට නගරාධිපති තුමනි සියලු දෙනාට සුභ පතලා ඔබතුමාටත්, නියෝජ්‍ය නගරාධිපති ඔබටත් සුභ පතලා අපි යන්න ගියා. ඒ නිසා, ඉදිරියේදීත් පළාත් සභා මැතිවරණ එනවා මේ වගේ පුරප්පාඩු වෙන්න පුළුවන් . ආං ඒ අවස්ථාවලදී මම විශ්වාස කරනවා බට්ටා පනින්න ලෑස්ති වෙන්ඩ එපා. අත්හැරීම් කියන ඒවා පුරුදු වෙලා, සුදුසු තැනට යන්න අවස්ථාව සලසා දෙන්න කියලා ඉල්ලා සිටිමින් අපි සියළු දෙනාටම ඡන්දය ප්‍රකාශ කරමින්, ජනතාව වෙනුවෙන් අපි පාට හතර පහකින් ගිහින් වේදිකාවල නොයෙකුත් ප්‍රතිපත්ති ප්‍රකාශ, ප්‍රකාශන හදාගෙන කරමින් ගිහිල්ල කරපු ප්‍රකාශ . ඒ සියළු දේවල් ජනතාව වෙනුවෙන් වැඩ කරන්න. ඒ නිසා අපි ඔක්කොම එක සභාවක් ලෙස ඒ කියපු පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉෂ්ට සිද්ධ කරන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**.

බොහොම ස්තූතියි මන්ත්‍රීතුමනි මීළඟ අවස්ථාව ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමාට.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු මන්ත්‍රීතුමිය නි. පළමුවෙන්ම මම ඔබතුමාට මගේ ස්තූතිය පල කරනවා අවස්ථාවක් ලබාදීම සම්බන්ධයෙන් මගේ අදහස් පළකිරීමට. ඒ වගේම නගර සභාවේ නව නගරාධිපති ලෙස තේරී පත්වීම පිළිබඳව මම ඔබතුමාට සුභ පතන අතර, විශේෂයෙන්ම අනුරාධපුර නගරයේ ජනතාවට විශේෂයෙන් උපකාර කරපු මහජන හිතකාමී ,අපේ බුද්ධික ප්‍රේමදාස මැතිතුමා නියෝජ්‍ය නගරාධිපති වරයා වශයෙන් පත්වීම පිළිබඳවත් අගය සහ විශේෂ ස්තූතිය පළ කරනවා.

විශේෂයෙන්ම මගේ 1999 පළාත් සභා මැතිවරණයේ දී පුද්ගලිකව විශාල උදව් උපකාර කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් මෙතුමා නියෝජ්‍ය නගරාධිපති ධුරයට තේරී පත්වීම සම්බන්ධයෙන් මා නැවතත් මගේ ස්තූතිය හා ගෞරවය පුද

කරනවා . ඒ වගේම එදා මේ නගර සභාව තියෙන කාලය 1983 මැතිවරණයට මුහුණ දීලා මම 1989 සිට මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉදලා පැරණි නගර සභාවෙත්, නව නගර සභාවේත්, පැරණි නගර සභාව අන්තිම රැස්වීම දම නව නගර සභාවේ පලවෙනි රැස්වීමේත් ඉදලා අනු එකේදී, දැන් අපේ සුසිල් මන්ත්‍රීතුමා කිව්ව කතාව වගේ වැඩක් වෙලා තමයි මගේ දේශපාලන තත්වය නැති වුණේ . එක්දහස් නවසිය අනු එකේ දී මේ සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මාස දෙකක් මැතිවරණය යනකල් ඉද්දි ඒ මැතිවරණයේ නාම යෝජනා නොලබපු පුද්ගලයෙක් වශයෙන් , ඔය මේ පක්ෂ විගඩම් ඔක්කොම එන්න මුල ඕක අද මේ පැත්තෙ ඉන්නත් හේතුව ඕක. ඒ නිසා ඒ වෙලාවෙදි මට මතකයි මම පක්ෂය දාලා ගියේ නෑ මම දන්නවා මම ඉල්ලන්නෙත් නෑ , මට දීලත් නෑ නමුත් මම මාස හයක් ලොකුබරණ මන්ත්‍රීතුමාට, එදිරිසිංහ මන්ත්‍රීතුමාට මම උදව් කරා ඒ උදව් කරපු මන්ත්‍රීවරු තුන්දෙනෙක් පත්වුණා එහෙම ඉතිහාසයක් මේකේ තියෙන්නේ.

ඉන්පසු මට ආපසු දේශපාලනයට එන්න හම්බුනේ නෑ. 1999 දී බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා, 94 අද මේ දෙපැත්තේ ඉන්න කට්ටිය කෙලින් ඉන්නේ බර්ටි දිසානායක ඇමතිතුමා මේ රටේ ඉන්න වෙන කවුරුත් මේකේ හිටියේ නෑ බර්ටි දිසානායක මැතිතුමා නැත්නම් අනුරාධපුර ශ්‍රී ලංකා එකකුත් නෑ ඔය කියන පාට පක්ෂත් නෑ. ඔය ඔක්කොම ශ්‍රී ලංකා තමයි ඒ තැනට ගෙනාපු මනුස්සයාට තමයි මේ කෙනහිලිකම් කරපු මේ අනුරාධපුර මිනිස්සු මොකද්ද ඔබතුමා ගැන කතා කරන්නේ සුසිල් මන්ත්‍රීතුමා. ඒ හින්ද මම මේක මතක් කරනවා ඉතිහාසයේ අනුරාධපුරයේ තැනකට එන මිනිහට එන්න දෙන්නෙ නෑ. Zig zag කරනවා කොහොන් හරි ආවට පස්සේ කවදා හෝ ඔය කියන අර කිව්ව දඬුවමක් විඳින්න වෙයි ඒ අයට කියන එක සිහිපත් කරමින් මම ආනන්ද මන්ත්‍රී තුමාට සුභ පතනවා. මොකද අවුරුදු විසි හතක් අනු එකේ ඉදන් එදා ආරම්භ කරපු අවුරුදු විසිහතක් අඛණ්ඩවම මේ සභාව නියෝජනය කරපු ආනන්ද මන්ත්‍රීතුමා මේ සභාවාරය තුල දකින්න ලැබීම ගැන. ඊළඟට අවුරුදු දාසයක් දැන් ඊළඟට අඛණ්ඩව මන්ත්‍රීවරයා වශයෙන් සිටින්නේ සුසිල් මන්ත්‍රීතුමා දකින්න ලැබීම ගැන මම එතුමාටත් සුභ පතනව මෙ තැනට ආපු එක ගැන.

ඒ අතරෙදි අපේ මන්ත්‍රීවරු කණ්ඩායම නැවත මේ මැතිවරණ ක්‍රමයේදී කොට්ඨාශ ක්‍රමය සහ සමානුපාතික ක්‍රමය මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් නිසා අනුපාතිකව 58% ක් ගත්ත අය තමයි මේ 14 දෙනෙක් නියෝජනය කරන්නේ සියයට 42% ගත්ත තමුන්නාන්සේලා තමා ඔය ඉන්නේ . ඒක හොඳට සිහිපත් කරගන්න මේ නගරය ජනතාවගෙන් 58% නියෝජනය කරන්නේ මේ දාහතර දෙනා අපි ඒ 58% දෙනා වෙනුවෙන් පෙනීසිටිනවා ඒ 58% නෙමෙයි 100% වෙනුවෙන් අපි පෙනී සිටිනවා. මේ වේලාවේ දී මතක් කරනවා නලීන් සිරිවර්ධන මැතිතුමා කිව්වා අපි පහුගිය සභාව කාලෙ කොහොමද වැඩ කරේ. අර මිලියන ගානක් අයවැය ලේඛනය වැඩි කරගන්න කොහොමද වැඩ කළේ කියන එක සිහිපත් කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත එතුමට වෙනවා. ඒවගේම තමයි මේ මැතිවරණ ව්‍යාපාරයේදී කැලෑ පත්තර ගහලා අපි මොනවත් කරපු නැති විදිහට ප්‍රචාරය ගියපු හින්දා තමයි අපි මේ තත්ත්වයට ආවේ .

නමුත් අපි පනතේ නීතිය නිසා අපිට 58% ප්‍රතිඵලය නිසා අපටත් මේ තැනට එන්න පුළුවන් වුනා මේ තැනට එන්න ඒ මුල පාදපු මගේ ඉතිහාසයේ වශයෙන් ගත්තොත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔය කියපු දැන් පක්ෂ දෙක තුනක හිටියත් මේක කෙලින් කරගෙන ආපු මෛත්‍රීපාල සේනානායක මැතිතුමා , කේ බී රත්නායක මැතිතුමා විශේෂයෙන්ම වැටිලා තිබුණු 1977න් පස්සේ කොන්ද කෙලින් 1994 දී ආපු බර්ටි දිසානායක මැතිතුමා හින්දා ඒ අය විශේෂයෙන් මතක් කරනවා අපි මේ වෙලාවෙදි මෙතැනට අපිට එන්න ඒ නිසා ඒ අයත් මතක් කරමින් , මේ අවස්ථාවේදී මෙහි මන්ත්‍රීවරයෙක් වශයෙන් මට අනුරාධපුර නැගෙනහිර ආසනය දැන් සංවිධායකවරයා වශයෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, දුමින්ද දිසානායක පක්ෂයේ ලේකම් තුමා මට දුන්න අනුග්‍රහය උඩ මට මෙතන්ට එන්න ලැබුණා. ඒ නිසා එතුමන්වත් මේ අවස්ථාවේ දී සිහිපත් කරමින් මේ අවස්ථාවේදී අපිට උදව් කරපු විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඡන්දය දුන් ජනතාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව අනුරාධපුර නැගෙනහිර ජනතාවට

ඒ වගේම අනුරාධපුර මහනගර සභා බල ප්‍රදේශය ජනතාවට ඒ වගේම අනුරාධපුර මා නියෝජනය කරපු පැතිස්පුර සියලුම ජනතාවට උදව් උපකාර කළ මම මේ අවස්ථාවේදී මා මගේ ගෞරවය ස්තුතිය පුද කර සිටිනවා.

මේ එක්කම අපි ජේෂ්ඨ නීතිඥ අපේ රංජිත් රාජකරුණා මැතිතුමා කිව්වා, මම හිතුවේ මේ සැරේ පොඩ්ඩක් පොතේ හැටියට යන්ඩ කියලා හිතාගෙන අදත් පොඩ්ඩක් වැරැද්දුවා පලවෙනි දවසෙම දැන් වැරදි එකේ මම විරුද්ධ වෙච්ච එකේ අපේ කණ්ඩායම ඡන්දය පාවිච්චි නොකරපු එකේ වැරැද්ද දැන් එළි වෙලා තියෙනවා. අනිවාර්යෙන් පනතේ වගන්තිය අනුව කමිටුවකට ඉන්න පුළුවන් වෙන්නේ එක මන්ත්‍රීවරයකුට කමිටු දෙකකට විතරයි . නමුත් මෙතන සමහර අය කමිටු තුනකට ඉන්නවා ගන්න කොටම නීති විරෝධී.. මම කියන්නේ මේක කලබලයේ කරන්නේ නෑ . ඒක තමයි පනතේ දීලා තියෙන්නෙ මේක තව දවසකට කල් දාන්න පුළුවන් කියලා. ඒක සිහිපත් කරමින් මේ සැරේ කොහොම හරි ඉදිරියේදී කමිටු වල කටයුතු කරන හැටි ගැන පොඩි අදහසක් දීලා තියෙනවා ඒක හරි වැදගත් කාරණයක් ඒ එක් එක් විෂය පථයන් ගැන දක්වලා තියනවා, ඒක වැදගත් කාරණයක් වෙනවා. මුදල් කමිටුව ගැන මේ සැරේ මේක මං කාලයක් තිස්සේ ප්‍රකාශ කරා මම ස්තුතිවන්ත වෙනවා නාගරික කොමසාරිස් තුමාට , නියෝජ්‍ය නාගරික කොමසාරිස් තුමාට, කාර්ය මණ්ඩලයටත් කමිටු වල හා විෂය පථය ගැන හොඳ පැහැදිලි කිරීමක් කරලා තියෙනවා. ඒකෙදි මුදල් කමිටුව විෂය පථය ගැන වෙනම පැහැදිලි කිරීමක් කරලා තියෙනවා. අනිවාර්යෙන්ම අනිත් කමිටු වල වාර්තා ගැන සලකා බැලිය යුතු වෙනවා. දැන් මේ සැරේ ඒක හොඳට අවධානයටලක් කිරීමක් කරල තියෙනවා. මේක තමා වෙන්ඩ ඕන දේ නැත්නම් වෙන්නේ කලබලේ මුදල් කමිටුවට මොනවා හරි දාලා ඒක සම්මත කරගන්න, එක්කෝ මහා සභාවට දාන එක සම්මත කර ගන්නවා. හොඳ ආදර්ශයක් දැන් මෙතනදි අරන් තියෙනවා අන්න ඒකයි මම කියන්නේ මේ පොතේ හැටියට යනවනම් ඒක හොඳයි කියලා . අපට කවදාවත් ඔඩිට් වෙන්නෙත් නෑ, ප්‍රශ්න එන්නෙත් නෑ, ඊට පස්සේ අපිට අත ඉස්සුවා කියලා දඬුවම් හම්බවෙන්නෙත් නෑ. ඒ නිසා ඒ ගැන සිහිපත් කරනවා.

ඊ ළගට මම තව කාරණයක් මතක් කරන්ඩ ඕනේ අද තියනවා අතුරු ව්‍යවස්ථාවක් මම මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධයි එදා ඉඳන්ම. මේක අතුරු ව්‍යවස්ථාව නෙවෙයි, මේ පාර්ලිමේන්තුවේ ගැසට් කරපු ගැසට් එක අපේ සභාව පිළිඅරන් කියලා තියෙනවා. නමුත් ඒ ගැසට් එකේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වෙන ක්‍රමයක් තියනවා. ඕක පහුගිය කාලේ පන්ති තිබ්බා. පන්තිත් කරලා ඒක හදන්න කිව්වා අපි දෙකක් හැදුවා. නමුත් දැන් ඒකත් පිළිගැනීමක් වෙලා නෑ . මම මේ සැරේ කියන්නෙ ආයෙ පන්ති ගෙනියන්න නම් එපා. ඔය කවුරු හරි දන්න කෙනෙක්ට කියලා හදන්ඩ. හදලා ගෙනත් දෙන්න සභාවට , අපි ඒකෙ අඩුපාඩු හදලා ඉදිරිපත් කරන්නම්. ඒ අතුරු ව්‍යවස්ථා නිවැරදි විදිහටවත් සකස් කරන්න මේ සැරේ.

තුන්වැනි කාරණය අපේ දැන් සභාව තියෙනකොට කාරක සභා වල් වලට කාරක සභාව පවත්වන කොට අපි හුඟාක් දුරට පූර්වගාමී නගර සභාවල තිබ්බ කමිටු ක්‍රමය තමා කියන්නේ. ඒක වැරදි ක්‍රමයක් මහ නගර සභාවේ කාරක සභා තියන්න ඕන ක්‍රමය ගැන කොළඹ මහ නගර සභාවෙන් හරි උපදෙසක් අරගෙන ඒවා වල හරියටම මන්ත්‍රීවරුන්ගේ වගකීම වැඩි කරන්න , මන්ත්‍රීවරුන්ට තමයි ඒ කමිටුවේ වගකීම තියෙන්නේ. මොකද නිලධාරීන් නෙවෙයි ප්‍රමුඛ වෙන්නේ. එනිසා මහා නගර සභා වලදී මන්ත්‍රීවරු ප්‍රමුඛතා කරලා කමිටුව ක්‍රියාත්මක කරන්න ඒකට අවශ්‍ය කරන උපකාරක ගන්න නිලධාරී ඉන්නවනං ඒ වේලාවට ගෙන්න ගන්න . ඒ නිලධාරීන් එනකොට මම ඉල්ලීමක් කරනවා ඔක්කොම නිලධාරි අවශ්‍ය නෑ හැම අංශයකම ප්‍රධානීන් එක්ක notebook එකක් අතේ අරන් එන්න කියන්න. එහිදී කාරක සභාවේ කතා කරන දේවල් notebook එකේ දා ගත්තම ඒ කාරණය ඉෂ්ට කරන්නයි තියෙන්නෙ. පස්සේ ආයේ අහන්න දෙයක් නෑ ඒ ගැන.

ඊළඟට මම විශේෂ කාරණයක් මතක් කරනවා මේ පලවෙනි සභාවලදී මේවා මතක් කරන්නත් හොඳ නැහැ මම අනුරාධපුර මහ නගර සභාවේ හිටපු නියෝජ්‍ය නගරාධිපති වරයා වශයෙන් සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනුරාධපුර

නැගෙනහිර ආසන සංවිධායකවරයා වශයෙන් මම මගේ යුතුකමක් ඉටු කළා . මොකක්ද ? කුම්බිච්චන්කුලම උද්‍යානය අල්ල ගන්න ගියා අපේ කොළඹ අමාත්‍යාංශයක්. මම විරෝධතා පළකරලා ආණ්ඩුකාර කාර්යාලයට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට, නාගරික කොමසාරිස්තුමාට, පළාත් ඉඩම් කොමසාරිස් තුමාට විරෝධතා දක්වලා. දැන් ඉතුරුවෙලා තියනවා තමුන්නාන්සේලා බලය තියන හින්දා ඒක නිවැරදි විදිහට අයිති කරගන්න. කාර්යාල ගොඩනැගිල්ලේ පොත්පත්, ලිපි ද්‍රව්‍යය ඔක්කොම ගෙනාවා. මගේ විරෝධතාවය උඩ ඒවා ආපහු අරන් යන්ඩ වුණා. දැන් ඕක අතරමැද තත්වයේ තියෙනවා අපේ මහා නගර සභා බලයට අභියෝග කරමින්, විශේෂයෙන්ම මහා නගර සභාවට තමයි උද්‍යානයක නම් කිරීමේ බලය පවා තියෙන්නේ. අපි යෝජනා කළ නම එක පැත්තක තියලා වෙන නමකුත් දැම්මා දැන් ඒකට. දැන් මේ සඳහා අවධානය ලක් කරන්න මේ දේපළ සුරක්ෂිත කරගන්න.

අපේ පනත තියෙන අයිතිවාසිකම් ගන්ඩ ලොක්කෝ වෙන කවුරුවත් නැහැ අර 4 වැනි වගන්තිය පෙන්වා දුන්නා වගේ අපි තමයි මේකෙ ලොක්කෝ. එකම තමා අර සුසිල් මන්ත්‍රීතුමා මතක් කරා ඒ වගේ අපි නිකම්ම නිකම් නිකමෝ කියලා හිතලා තමයි මහජනයා කටයුතු කළේ . බොරු පෙත්සම් කැලෑ පත්තර මහජනයාට වතුර දුන් නෑ කියලා ඉවරවෙලා කිව්වා. වතුර දෙන ඒක නැවැත්තුවා කියලා කිව්වා ඊළඟට තිසා වැවේ නානවට අපි කැමති වුණේ නෑ කිව්වා, ඒ වගේ කැලෑ පත්තර ගහලා පට්ටපල් බොරු කියලා ඡන්ද එහෙ මෙහෙ කරලා, ඒකෙන් අපේ මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීතුමාත් එතුමා අපේ ප්‍රදේශයටත් පොඩි සැලකිල්ලක් කරන්න. අපේ යම්කිසි ඡන්ද ප්‍රමාණයක් හම්බ වුණා. ඉතිං ඒ නිසා ඒ ප්‍රදේශයටත් විශේෂ සැලකිල්ලක් දක්වන්න කියලා මතක් කරමින් මේ සභාවේ ඉදිරි කටයුතු වලදී අපි විරුද්ධකම් අරගෙන කතාවක් නැහැ අපි ඉස්සර වැඩ කළෙත් එහෙමයි.

ගිය සැරේ උනත් පත්වෙනකොට ඉස්සල්ලාම ආවේ ඔබතුමා අපි දෙපැත්තේ නමුත් ඇතුලෙ වැඩ කරේ අපේ සභාවක් වශයෙන්. අපේ විපක්ෂ නායකතුමා අපිට විරුද්ධවාදීන් විදිහට කටයුතු කළේ නෑ ඒ හැමෝගෙම දැනුම සභාවේ යෙදෙව්වා. ඒ සභාවේ දැනුම ලැබුනා අපිට අද ආඩම්බරයෙන් අයවැය ලේඛන මෙච්චර බින්දු ප්‍රමාණයක් වැඩියි කියලා කියන්න පුලුවන් තත්වයට පත්කර ගත්තා. මේක සාමූහික වගකීමෙන් ඒ නිසා ඉදිරියටත් හොඳ දෙයට හැබැයි පොතේ හැටියට විධිමත් විදිහට යන්න කටයුතු කරන්න ඒ සියලු දේට සහයෝගය දෙනවා කියලා ප්‍රකාශ කරමින් , මේ විහිළු ඡන්ද ක්‍රමයෙන් මහජනතාව නොමග යවමින් ගත්ත ප්‍රථඵලයක්. අපි වැඩ නොකරමින් නෙවෙයි, අපි වැඩ කරලා තමයි මේකෙන් එළියට ගියේ. ඒ නිසා වැඩ නොකිරීම නෙමෙයි තියෙන්නේ විකෘති මානසිකත්වයක් ඇති අර කොහෙදෝ නැති ඡන්ද ක්‍රමයක් යටතේ මහජනතාව අපට පිරිසුදු ඡන්දයක් දීල තියෙනවා අපි අනාගතය ගැන හොඳට දන්නවා, ඒ හින්දා ඒ ගැන සිහිපත් කරමින් තමුන්නාන්සේට විශේෂයෙන් ස්තුතිවන්ත වෙමින් මහ නගර සභාවේ සියලුම සංවර්ධන කටයුතුවලට පූර්ණ දායකත්වය ලබාදෙන බව ප්‍රකාශ කරමින් මගේ කතාව අවසන් කරනවා ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ අවස්ථාව ඉන්දික අරුණ කුමාර මැතිතුමාට ලබා දෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා</u>**.

ගරු නගරාධිපති තුමනි ඔබ තුමාට ප්‍රථමයෙන්ම සුභ පතනවා. විශේෂයෙන්ම මමත් ඔය පුටුවට එන්න තමයි වලි කෑවේ අන්තිමේදි මම මේ හුරු පුටුවෙම ඉන්නවා. ඔබතුමාට සුභ ආකාරයෙන් මේ සභාව මෙහෙයවන්න හැකි වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම බුද්ධික මන්ත්‍රිතුමා මං හිතන්නේ වැදගත් තනතුරකට වැදගත් පුද්ගලයෙක් පත්වෙලා

තියෙනවා. එතුමා විපක්ෂයේ හිටියත් යම් යම් සෑම පොදු කටයුත්තකදීම සෑම පෞද්ගලික උවමනාව කදීම උදව් කරන පුද්ගලයෙක් .

එ් එක්කම සුසිල් මන්ත්‍රීතුමාට යම්කිසි අසාධාරණයක් වෙලා තියෙනවා එතුමා සිත් වේදනාවෙන් කතා කළා. දේශපාලනය කියන්නේ ඕක තමයි . අපට කැලෑ පත්තර ගහනවා. මඩ ගහනවා. මේක තමයි දේශපාලනයේ හැටි. බොරු චෝදනා දානවා, හාමුදුරුවෝ අල්ල ගන්නවා. හාමුදුරුවෝ අල්ලගෙන පත්තරවල දානවා, ඒවා ගෙයින් ගෙට බෙදනවා අපි දේශපාලනයේ මඩින් ගියේ නෑ අපි ප්‍රතිපත්තිගරුකව ගරු නගරාධිපති තුමනි එදා ඉඳන් දේශපාලනය කරනවා මම ක්‍රීඩකයෙක් මට ජය පරාජය හොඳට හුරුයි ඒ නිසා අපි වැදගත් දේශපාලනයේ නියැළෙනවා අපි කවදාවත් පුද්ගලික චරිත ඝාතනය කරලා හෙළා දැකලා ජයග්‍රහණ කරනවට වඩා මෙහෙම එකෙන් ගිහිල්ලා ඉන්න එක සැපයි හිතට සතුටුයි.

ගරු නගරාධිපතිතුමාගේ පහුගිය කාලයේ අනුරාධපුර මහා නගර සභාව ට මැතිවරණයක් ගන්න වලි කෑවා. බහුබූත පනතක් ගෙනල්ලා සමහර නායකයෝ මේ රටේ මේ විකාර විරූපී පනතක් ගෙනල්ලා මේ ජනමතය විකෘති කළා. ඒ සම්බන්ධව අපි නගර සභාවක් විදියට පළාත් පාලන මන්ත්‍රීවරු විදියට ඇත්තටම කනගාටු වෙනවා. මම විශේෂයෙන්ම මේ පනත 2012 පනත ගෙනල්ලා මේ සභාවේ සුභපැතුම් යෝජනා ගෙනවා. මම විතරයි එදා විරුද්ධව මං විතරයි මේ සඳහා කතා කරේ. මේ සමානුපාතික ක්‍රමය කියන්නේ මේ රටේ තියෙන දියුණුම මැතිවරණ ක්‍රමය. මේ දියුණු මැතිවරණ ක්‍රමයෙන් එපිටට මේ කොට්ඨාස ක්‍රමය, කොට්ඨාශයට තුන්දෙනෙක්, මොන විකාරද මන්ත්‍රීවරුන්ගෙ තත්ත්වයට හැල්ලු කරලා තියෙනවා. ගරුත්වය විනාශ කරල තියෙනවා පරස්පර විරෝධී මත තියෙනවා, ඇතැම් කොට්ඨාශ වලට මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා. හංදියට එක්කෙනයි පදුරට ගැහුවත් වීසිවෙන සයිස් එකේ මන්ත්‍රීවරුන්, මොකක්ද මේ වැඩේ රජයේ ඒකට යම් කිසි වගකීමක් තියෙනවා. ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

2012 දි පනත තුලින් මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේදී දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ගෙනාපු මේ කොට්ඨාස ක්‍රමය විකෘති ක්‍රමයක් , මේකට එරෙහිව අපි සන්විධාන වෙන්න ඕනේ. සභාවක් විදිහට මේකට යෝජනාවක් ගෙනල්ලා පළාත් පාලන හා පලාත් සභා ඇමතිවරයාට කියන්න ඕනේ මේ තියෙන අඩුපාඩු . ඡන්දය තියලත් මාස ගානක් ගියා පත්කරන්න මන්ත්‍රීවරු මේක අපරාධයක් වුණා. ගොඩනැගිලි කඩන්ඩ වුණා, විනාශයක් වුනා මහජන මුදල් . ගැසට් එක තිබුනේ මන්ත්‍රීවරු 25 යි, hanging කියලා හතරක් ගේනවා මන්ත්‍රීකම විනාශ කරා ගරුත්වය ආරක්ෂා කරන ක්‍රමයකට මේ සභාව කටයුතු කරන්න ඕන ගරු නගරාධිපතිතුමා ඔබතුමාට අත්දැකීම් තියෙන නායකයෙක් ඔබතුමාට ශක්තිය තියෙනවා අපි මේකට යෝජනා ඉදිරිපත් කරලා අපි මේක පළාත් පාලන ඇමතිවරයාට යොමු කරන්න ඕනි මේ පිළිබඳ කටයුතු කරන්න.

ගරු නගරාධිපතිතුමා අද සභාව පටන් ගන්න කොට මම පෙන්නල දුන්නා තමුන්නාන්සේලාට ආඥා පනත 26 වැනි වගන්තිය යටතේ. මේ කටයුත්ත වැරදි ගැන කරුණු ගණනාවක් තියෙනව එකක් තමයි මේකට දාල තියෙනවා මන්ත්‍රීවරු තුන්දෙනෙක්. එක මන්ත්‍රීවරයකුට කමිටුවක් නියෝජනය කරන්න පුළුවන් දෙසැරයයි. මේක තුන්දෙනෙක් තුන් පාරක් ඉන්නවා. අනිත් එක තමයි මහා නගර සභාවේ හිටපු නියෝජ්‍ය නගරාධිපතිතුමා ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරයෙක් . එතුමාට නීතිය පිළිබඳ දැනීමක් තියෙනවා, සභාවේ මූල්‍ය කටයුතු පිළිබඳ දැනීමකුත් තියනවා, නමුත් දාලා තියෙන්නේ කාන්තා කටයුතු හා පූර්ව ළමාවිය පිළිබඳ කමිටුවට

( සභාවේ ඝෝෂාකාරී තත්ත්වය )

මම ඉල්ලීමක් කරනවා දැන් මේ සභාවේ මන්ත්‍රීවරු විසි නවයක් ඉන්නවා මේ කමිටු පිළිබඳ අධ්‍යයනය කිරීමක් කරන්න තිබුණා, සාකච්ඡා කළ යුතුව තිබ්බා. මම ඉල්ලා සිටිනවා අද මේ කමිටු පත් කිරීම ලබන පාර කමිටුවට දාන්න පුලුවන් ඒ අදාල විෂය සම්බන්ධව සාකච්ඡා කරලා තීරණයක් ගන්න . දැන් බලන්න මම දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපතිවරයා නමුත් මම නෑ ක්‍රීඩා කමිටුවේ.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

මන්ත්‍රීතුමා අපි වැඩ බාරගන්න දවසේ මම ආරාධනා පත්‍රයක් එව්වා. ඔබතුමාට ඒකට සහභාගි වෙන්න කියලා ඔබතුමා එදා ආවේ නැහැ මම හිතුවා එන්නෙම නැති වෙයි කියලා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා</u>**.

වැඩ බාරගන්න දවසේ ආවෙ නැති වුණාට ඒක අත්‍යවශ්‍ය දෙයක් නෙමෙයිනේ ගරු නගරාධිපතිතුමා අපි හිතුවා ඒකත් කල් යයි කියලා . මොකද ඒක හිතා මතා මඟ හැරීමක් නෙවෙයි වැඩ රාජකාරි උසාවි රාජකාරි, උසාවියේ නඩුවක් තිබ්බා ඒකයි මම ආවෙ නැත්තේ ඒ ආවේ නැති හින්දද දන්නෙත් නෑ කමිටුවට දාලා නැත්තේ.. සභ ගරු නගරාධිපතිතුමනි මම ඉල්ලා සිටිනවා මේක මහා නගර සභා ආඥා පනත අනුව මන්ත්‍රීවරු වි සිනවයක් එක්ක යන ගමනක් නිසා අද මේ පත් කිරීම් සම්බන්ධව දැන් අපි අර්බුදයක් තියෙනවා ගැටලු සංඛ්‍යාවක් තියෙනවා ඒ නිසා ස්ථාවර කමිටු පත් කිරීම කල් දාලා ඒක ලබන සභාවට සාකච්ඡා කරලා අපි පත් කරපු මගේ අදහස මම ඉදිරිපත් කරනවා. මොකද එහෙම වීම මම හිතන්නේ වඩාත් විනිවිදභාවයෙන් කටයුතු කිරීම සුදුසුයි කියලා මම මේ සභාවට ප්‍රකාශ කරනවා. ගරු නගරාධිපති තුමනි අපි මේ පහුගිය කාලයේ මේ නගර සභාවේ නොසිටියත් නගර සභාවේ පාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට නාගරික කොමසාරිස් තුමා ඇතුළු නිලධාරී මණ්ඩලය කළ කාර්ය භාරයට ස්තුති කිරීමට මා මේ අවස්ථාව කරගන්නවා. සභාව වගකීම හා වගවීම එයාකාරයෙන්ම නගරාධිපතිවරයකු සභාවක් නොමැතිව තිබුනත් යම් මට්ටමකින් පවත්වාගෙන යාමට ඔවුන් කටයුතු කිරීම සම්බන්ධයෙන් නැවතත් ස්තුති කිරීමට අවස්ථාවක් ලබා ගන්නවා.

ගරු නගරාධිපතිතුමනි, අපි විශේෂයෙන් පහුගිය මැතිවරණයේදී අපි තරග කරද්දි විවිධ යෝජනා ගෙනාවා ප්‍රකාශ ගෙන ආවා ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මම කියනවා මේ නගරයේ ඉන්න ජනතාවගේ ප්‍රශ්න සම්බන්ධව මේ නගර සභාව තුල තියන නාගරික ජනතාවගේ අයිතිවාසිකම් හා යුතුකම් වෙනුවෙන් අපි සියලු දෙනාම එකා වන්ව එක්සිත්ව කටයුතු කරන්න ඕනේ. විශේෂයෙන්ම වර්ග කිලෝමීටර් 36 ක භූමි ප්‍රමාණය තුළ මන්ත්‍රීවරු දහතුනයි සිටියේ දැක් ඉන්නවා 29 දෙනෙක් මේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අරගෙන මේ නගරය දියුණු කරන්න. විධිමත් වැඩපිළිවෙළක් අපි සකස් කරන්න ඕනේ .

මේ මන්ත්‍රීවරු පත් කරලා තියෙන්නේ මහජන ඡන්දයෙන් ඇවිල්ලා තියෙන්නේ මහජන මුදල් වැය කරන්න. ඔවුන්ගෙන් යම් කිසි පල ප්‍රයෝජනයක් ගන්න විවිධ අදහස් තියන මන්ත්‍රීවරු ඉන්නවා සෝමවංශ අමරසිංහ මහත්මයා නියෝජනය කරන දේශපාලන පක්ෂයක් තියෙනවා, සිංහල හෙළ උරුමය ඉන්නවා, මහජන එක්සත් පෙරමුණ ඉන්නවා , මුස්ලිම් කොංග්‍රසය ඉන්නවනේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, අලුතෙන් බිහිවෙච්ච පොහොට්ටුව, එක්සත් ජාතික පක්ෂය මේ සියලු දේශපාලන පක්ෂ වල ඔවුන්ගේ සියලු එලදායිතාවය මේ නාගරික ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරලීම උදෙසා අපි වැඩ කරන්න ඕනේ .

අපිට වගකීමක් තියෙනවා, අපේ කණ්ඩායම සභාවක් ඒ සභාවේ සියලු මන්ත්‍රීවරු එකාවන්ව එක්සිත්ව ජනතා මෙහෙවර උදෙසා වැඩ කරන්න ඕනෙ. ඒ නිසා ඒ උදෙසා නායකත්වය දෙන්න තමුන්නාන්සේට මා ආරාධනා කර සිටිනවා මේ කරුණු කාරණා සම්බන්ධව කමිටුවල යෝජනා ඇවිල්ලා තියෙනවා මම හිතන්නේ කමිටු යෝජනා හරහා යන්න කියලා ඒවගේ යනවනම් මම කියන්නේ මේකේ තියන වැදගත්කම. එහි වැදගත් කමනම් එය පනත අනුව කටයුතු නොකිරීම තුළ ඒ නිසා ඒකට අදාලව කමිටු වලට අදාලව ඒ සම්බන්ධ නිපුණතාවයක් තියෙන පිරිස යොදා ගෙන. ඒ සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණ කරන්න කියලා ඉල්ලා සිටිමින්, අපේ සුරංගි මන්ත්‍රීතුමිය ස්තුති කලා ස්වේච්ඡා සංවිධානවලට සියයට 25 ක කාන්තා නියෝජනය පිළිබඳව.

අපේ වර්තමාන කාන්තා කටයුතු ඇමතිතුමිය ඉදිරිපත් කළේ මේ ගැන පාර්ලිමේන්තුවට ඒ ගෞරවය ස්තුතිය යන්න ඕනෑ 25% කාන්තා නියෝජනය පිළිබඳව නමුත් මගේ පෞද්ගලික මතයනම් සියයට 25 ක කාන්තා නියෝජනය වැඩියි කියන එක. මේ සභාවට වැඩියි කියන එක. නමුත් ඔබේ අයිතිවාසිකම වෙනුවෙන් වර්තමාන රජය කටයුතු කර ඇති බවත් , ඒ සඳහා කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමිය චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමිය විශේෂ සහයෝගයක් සහ නායකත්වය ලබාදී ඇති බවප්‍රකාශ කරමින්, අද ලංකාවේ මිනිස්සුන්ට ගරු නගරාධිපතිතුමා මේ තොරතුරු පනත මාධ්‍ය නිදහස , ස්වාධීන කොමිෂන් සභාව මේ එවැනි බුද්ධි මට්ටමක මේ රටේ ජනතාව නැහැ . මේ රටේ ඉන්නේ බඩ ගැන හිතන කදින් තීරණ ගන්න පිරිසක්. ඒ නිසා අපිට ඒ ප්‍රතිඵලය ලැබුනා අපි ප්‍රතිඵලය නිහතමානීව භාර ගන්නවා අපි ජයග්‍රහණය උදෙසා කටයුතු කළේ . නමුත් අපිට ජය පරාජය විඳ ගැනීමේ ශක්තිය ඇතුව මේ නාගරික ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට මුළු නගර සභාවත් එක්ක කටයුතු කරන බව ප්‍රකාශ කරමින් තමුන්නාන්සේ ගන්නා හොඳ සෑම කටයුත්තකදීම එයට අවශ්‍ය නායකත්වය සහ සහයෝගය ලබාදෙනවා කියලා කියමින් අද තේරී පත් වූ සියලු නවක මන්ත්‍රීවරු සියලුදෙනාටම. විශේෂයෙන්ම මම ඉස්සරලා සඳහන් කළා වගේ විවිධ දේශපාලන මත තියෙනවා ඒ සියලු මත සභාව තුළ නියෝජනය කරමින් ජනතා විමුක්ති පෙරමුණ මුස්ලිම් කොංග්‍රසය අපේ සෝමවංශ අමරසිංහ මැතිතුමාගේ පක්ෂය හෙළ උරුමය ඒ සියලුම පක්ෂ සමඟ සම්බන්ධතාවයක් තියෙන්න ඕනේ. ඒ නිසා ස්ථාවර කමිටු නැවත පත් කිරීම සම්බන්ධයෙන් හිතා බලන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා ස්තුතියි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

බොහොම ස්තූතියි මන්ත්‍රීතුමා මීළඟ අවස්ථාව මා ලබා දෙනවා ගරු නියෝජ්‍ය නගරාධිපති තුමාට

**<u>ගරු නියෝජ්‍ය නගරාධිපති එම් ඩබ්ලිව් බුද්ධික ප්‍රේමදාස මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, නාගරික මන්ත්‍රීවරුනි. මම පළමුකොට ම දෙවැනි වරටත් නගරාධිපති ධූරය පිදුම් ලද ඔබ තමුන්නාන්සේට සුබ පතනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් තේරී පත්වී ඇවිත් ඉන්න සියලුම නාගරික මන්ත්‍රීවරුන්ටත් , එක්සත් ජාතික පක්ෂයෙන් තේරී පත්වී ඇති, මන්ත්‍රීවරුන්ටත් ජනතා විමුක්ති පෙරමුණෙන් තේරී පත්වූ මන්ත්‍රීවරුන්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය මන්ත්‍රීවරුන්ටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් සුභ පතනවා.

තමුන්නාන්සේලා අපි සියලු දෙනා එකතු වෙලා මේ අවුරුදු හතරේ වැදගත් සේවාවන් ක්‍රියාත්මක කරන්න අනුරාධපුර ජනතාවගේ සුබවිහරණය වෙනුවෙන් අපි හා එක්වෙන්න කියලා මම ආරාධනා කරනවා. 2015 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ පලාත් පාලනමැතිවරණය කිසිම හේතුවක් නිසා සාධාරණ හේතුවක් නැතුව දිගින් දිගටම කල් දාලා එහි ඇති යම්කිසි දේශපාලන වාසිය ලබාගන්න කටයුතු කළා. ජනතාව උපේක්ෂාවෙන් බලා හිටියා ඡන්ද ගැන. මෙරට පළාත් පාලන ආයතන 340 තිබුණා 340 ,239 ක බලය ලබා දුන්නා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට.

ලංකාවේ ඉතාම සුළු කාලයකින් පක්ෂයක් ආරම්භ කරලා විශාල ජයග්‍රහණයක් කරපු ප්‍රථම වතාව මේක. මේක ඉතිහාසගත වෙනවා මේ රටේ හිටපු පස්වන විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආශිර්වාදය ඇතිව බැසිල් රාජපක්ෂ මැතිතුමා ජී.එල් පීරිස් මැතිතුමා කාලය කැප කරලා මේ පක්ෂය ආරම්භ කරා. මේ රටට කරපු විශාල සේවයක් තිස් අවුරුදු යුද්ධය නැවැත්වීම විශාල ජනප්‍රසාදයක් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට තියෙනවා. ඒ නිසා තමයි අපිට මේ ජයග්‍රහණය ලබාගන්න පුළුවන් වුණේ. මේ රටේ බහුතර ජනතාවගේ ඡන්ද අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට දුන්නේ. අපේක්ෂකයා නමට පෞද්ගලික ඡන්ද ගත්තනම් ලැබුණේ කීප දෙනාටයි.

අපි බලාපොරොත්තු වෙනවා පසුගිය කාලය තමුන්නාන්සේ නගරාධිපති හැටියට ඉදේද්දි විශාල සේවාවක් මේ නගරයට කළා අපි සියලු දෙනා අවිවාදයෙන් මේක පිළිගන්නවා විශේෂයෙන්ම ඉන්දික අරුණ කුමාර විපක්ෂනායකතුමා තුමා වර්තමාන විපක්ෂනායකතුමා පිළිගන්නවා . මේ නගරයට විශාල සේවාවක් කරපු ඒවා අතරින් නගරයේ ආදායම් උත්පාදන වැඩිකරලා නගරවාසීන්ට විශාල සේවාවක් කරා.

මෙහි තිබුණු කනත්ත නිසල නිම්නය ලෙස නම් කරලා සංවර්ධනය කරලා මෙහි මිහිදන් කරපු සියලුම මේ නගරවාසීන්ගේ සියලුම පුද්ගලයන් සිහිපත් කිරීමට අවුරුද්දට වතාවක් දිනයක් ලබා දීලා තමන්ගේ ආදරණීය මවුපියන් සහ සහෝදර සහෝදරියන් සිහිපත් කිරීමට අවස්ථාවක් ලබා දුන්නා. ඒකට ගියවර විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් සහභාගි වුණා අපි ගිය පාර හිටියේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දහදෙනයි. විපක්ෂයේ මන්ත්‍රීවරු තුන් දෙනයි අපි අද සතුටුවෙනවා එතනින් දහදෙනෙක් මන්ත්‍රීවරු අද මෙතන ඉන්නවා අපිට නැතිවුණේ මන්ත්‍රීවරු දෙන්නයි දේශපාලන කටයුතු වල දී මත් මම අගය කරන චරිතයක් තමයි අපේ ඉන්දික මන්ත්‍රීතුමාගේ පක්ෂයේ හිටපු ගරු නීතිඥ ආරියරත්න වික්‍රමාරච්චි මැතිතුමා. මම ඉතාමත් ප්‍රිය කරන චරිතයක් එතුමා සභාවට ඉතාමත් වටිනවා. තමුන්නාන්සේලා එතුමාට ඒ බව පවසන්න.

ඒ විතරක් නෙමෙයි මේ මැතිවරණ ක්‍රමය විකෘති මැතිවරණ ක්‍රමයක් කියලා ප්‍රකාශ වුණ. මේක මැතිවරණය විකෘති මැතිවරණ ක්‍රමයක් තමයි තමුන්නාන්සේලා දන්නවා හැම පක්ෂයකම අපේක්ෂකයෝ පහළොස් දෙනෙක් තමයි එදා අස්සන් කෙරුවේ. එතකොට අතිරේක ලයිස්තුවට දහදෙනයි මැතිවරණ ප්‍රතිඵල නිකුත් උනාම දාහතරක් ඇවිල්ලා ආපු විදිහ කොහොමද දන්නෙ නෑ මම හිතන්නේ මැති ඇමතිවරු වත් ආසන සංවිධායකවරු වත් දන්නේ නෑ. මේ හතරක් ආවෙ කොහොමද කියල ඒ විතරක් නෙමේ පහුගිය කාලේ හැම තැනම සාකච්ඡා වුණා . පත්තරයක් මට හම්බ වුණා මේ මැතිවරණය ඇත්තටම විකෘති මැතිවරණයක්. මෙන් ඉතාම විශාල මහජන සල්ලියක් වියදම් කරලා තියෙනවා පළාතකට ගත්තෝත් අපේ මන්ත්‍රීවරු 434 දෙනෙක් ඉන්නවා. ඒගොල්ලන්ට විසිපන්දාහ ගානේ බැලුවොත් කෝටිය ඉක්මවලා මහජන සල්ලි ගෙවන්න ඕන . මේ වියදම් දරා ගන්න බෑ . සමහර ප්‍රාදේශීය සභා තිබ්බා ඉඩ පහසුකම් සුළු ප්‍රමාණයයි වැඩි ප්‍රමාණයක් පත්වුණා මේවා කඩල හදන්න සිද්ධ වුනා. තමුන්නාන්සේලා දන්නවා ඇති මේ ශාලාවේ බිත්ති කඩල හදන්න සිද්ධ වුණා මන්ත්‍රීවරුන්ගේ විවේකාගාරය හදන්න සිද්ධ වුණා පසුගිය මාස කිහිපය තුළම නාගරික කොමසාරිස්තුමා , නියෝජ්‍ය නාගරික කොමසාරිස් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ හිස ගිනි ගත්තා වගේ අපි කතා කරත් කතා කරන්න වෙලාවක් නෑ එහාට දුවනවෙ මෙහාට දුවනවා. මේකෙ වැඩ විශාල බරක් දරන්න සිද්ධ වුණා අපි ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

මැතිවරණ ක්‍රමයෙන් මෙය පලවෙනි මැතිවරණ ක්‍රමය වගේම අවසන් මැතිවරණ ක්‍රමයක් වෙන්න ඕනේ. හාර දහස් ගණනක් හිටපු මන්ත්‍රීවරු අද නවදාහක් කිට්ටු කරලා තියෙනවා ඇත්තවශයෙන්ම අපේ මන්ත්‍රීවරු දහතුන් දෙනෙක්

හිටපු තැන අද මන්ත්‍රීවරු 29 දෙනෙක් ඉන්නවා . මෙතුමන්ලා ආවට මගේ කිසිම අකමැත්තක් නෑ මම කැමති නමුත් මේ රටේ ආර්ථිකයට දරාගන්න පුළුවන් ක්‍රමවේදයක් තියෙන්න ඕන.

මම හිතන්නේ නගර සභාවට නම් මම හිතන්නේ දුවන්න පුළුවන් ආර්ථික ශක්තියක් තියෙනවා. සමහර ප්‍රාදේශීය සභා තියෙනවා දුවන්න බෑ ආදායම නෑ නගර සභාව ඊට වඩා පොහොසත් කියලා කියන්න පුළුවන් . නමුත් මුළු රටටම මේ තත්ත්වය ඇති වෙන නිසා මේ ක්‍රමය විනාශ වෙන්න පුලුවන් ඒ වගේම මම මේ අවස්ථාවේ ස්තුති කරනවා මගේ කොට්ඨාසය 257 තුලානේ ජනතාවට විශේෂයෙන්ම පුබුදුපුර, ජයසිරිපුර , යසසිරිපුර තුන්වන පියවර මීකිරි පාර සහ සමූහ ගොවිපොල පාර ජනතාවට අපි. මන්ත්‍රීවරු පහලොස් දෙනෙක් පත්වුණා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් මට හැකියාව ලැබුණා මගේ ජනතාව නිසා මට පාලොස් දෙනාගෙන් වැඩිම ඡන්ද ලබා දීලා තියෙන්නෙ මට. ඡන්ද 1454 ක් ලබා දීලා තියෙනවා. ඇත්තවශයෙන්ම මගේ ආදරණීය ජනතාවට මම ස්තුතිවන්ත වෙනවා ඒ විතරක් නෙමේ මා එක්ක විශාල පිරිසක් ගෙයින් ගෙට ගියා මට උදව් කරා . එ් අයට ස්තුතිවන්ත වෙනවා. මෙවැනි ගමනක් යෑමට අවස්ථාව උදාකර දීම සම්බන්ධයෙන් . ඒ වගේම මෙතුමා කිව්ව වගේ කැලෑ පත්තර , මඩ ප්‍රහාර මේ මැතිවරණයේදී භාවිතා කරලා තිබුණා මට කැලෑ පත්තරයක් අහලා තිබුණා මම ලක්ෂ පන්සීයක් මේ නගර සභාව සල්ලි හොරකම් කරලා කියලා පත්‍රිකා තුන්දාහක් ගහලා ඒක හැම තැනම බෙදිලා තිබ්බා. එක රෑට මගේ කොට්ඨාසය පුරාම ඒක තියෙන්නෙ ලක්ෂ 185 සල්ලි මට දීලා මාර්ග හදන්න දීපු සල්ලි එවා සාක්කුවෙ දාගෙන කියලා එතකොට නිලධාරී කවුරුත් නැහැ මම තමයි සල්ලි අරන් සාක්කුවේ දාලා තියෙන්නේ. මේ දේශපාලන නොහොබිනාකම් මේ වගේ කරල තියෙන්නෙ පහත් , දෙකේ පන්තියේ මිනිස්සු. මම මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් දැම්මා මැතිවරණයට සහ පොලිසියට ඒක හොඳ වෙලාවට පසුදා පත්තර වල ගියා මමත් විස්තර duplo කරල කරල ගිහිල්ල පස්සෙ බෙදාහැරියා උදේ 4.30 බලනකොට කණ්ඩායම් දෙකක් එකතු වෙලා ෂොපිං බෑග් දෙකක් තියාගෙන අරවා අහුල අහුල දානවා . ඒකෙන් අපි තීන්දුකරා කවුද මේ වැඩේ කළේ කියලා නමුත් අපේ මන්ත්‍රීවරුන්ටත් මේ ජනතාවටත් මම කියනවා අවුරුදු දහයක් මම මේ නගර සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. මේ සභාවේ මට ලැබිච්ච දීමනා එක රුපියලක් මම අරගෙන නෑ.

මම මුල්ම අවුරුද්දෙදි මම ඒව එකතු කරලා දුන්නා ඇස්කණ්නාඩි පරීක්ෂා කරලා නොමිලේ ඇස් කණ්ණාඩි බෙදා දුන්නා . ඊළඟ වර්ෂයේදී මගේ අතිනුත් දාලා මම මගේ ප්‍රදේශයට මදුරු දැල් ලබා දුන්නා අන්තිමේටම මේ අකාරයෙන් රුපියල් එක්ලක්ෂ හැත්ත නම දාහක් වියදම් කරලා මෙතන වතුර ෆිල්ටරයක් හයි කරල දුන්නා. මට මේක ආවෙ ඔලුවට පුස්තකාලෙට ආපු ළමයි එහෙම ඇවිල්ලා නගර සභාවට එන අය වතුර බොනවා ඒ ළිදේ වතුර එන්නේ බොන්න සුදුසු වතුර නැහැ එලෙස මම කටයුතු කරා එහෙම කරපු මට මඩ ගැහුවා මම හොරකම් කරා කියලා මම හිතන්නේ මට ඒකෙන් තවත් යහපතක් වුණා බුද්ධිමත් අය කවදාකවත් පිළිගත්තෙ නෑ ඒක තව එකක් වුණා මට විරුද්ධව පොලිසියට කතා කරලා කියලා තියෙනවා මම වැඩිපුර ඡන්ද කැන්වසින් අරන් යනවා කියලා ඊට පස්සේ මම පන්සලට ගියා ආගමික කටයුතුවලට පොලිසියට කියලා තියෙනවා මම පාසලේ රැස්වීම් තියනවා කියලා ඒ වගේ ගොඩාක් අරියාදු කරා මට. ඒ අරියාදු කර නිසා තමයි මම ජය ගත්තේ. ඒ නිසා මම නැවතත් මගේ ප්‍රදේශයේ ජනතාවට වගේම මේ අවස්ථාවට එන්න මග පාදලා දුන්න එච්.බී. සේමසිංහ මැතිතුමාට ඒ වගේම බටහිර ආසනයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කණ්ඩායම් නායක එස් එම් චන්ද්‍රසේන මැතිතුමාටත් සියලුම නායකයන්ට ස්තුතිවන්ත වෙනවා ඒ වගේම මම ඔබතුමාලා සියලුදෙනාටම ආරාධනා කර සිටිනවා නගරයට යහපත් සේවාවක් කරන්න එකතු වෙන්න කියලා. අපි ඔබතුමාලාගේ අදහස් බලාපොරොත්තු වෙනවා තමුන්නාසේලාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

සියලුම සභිකයින්ගේ අදහස් දැක්වීම අවසන් වෙනවා ඉන් අනතුරුව කමිටු සම්බන්ධයෙන් පැන නැගී තිබූ ගැටලු කිහිපයක් නිරාකරණය කිරීම නගරාධිපතිතුමා විසින් සිදුකරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී දුමිඳ දයාසෙන් රුටියල ඇමතිතුමා**.

ගරු නගරාධිපති තුමනි, මේ අවස්ථාවේදී මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි කමිටු අතර සිදු කරන ලද සංශෝධනයන් මේ සභාවේ ස්ථිර කරනවා.

**ගරු නගරාධිපතිතුමා.**

එහෙනම් සියලුම මන්ත්‍රීවරුන්ට අද මම ස්තුතිවන්ත වෙන්න ඕන. අනුරාධපුර මහ නගර සභාව මංගල සභා රැස්වීම පැවැත්වූවා. දැන් ලංකාවේ 341 ක් තියනවා නගර සභා ප්‍රාදේශීය සභා දෙපාර තුන්පාර තියන්න ගිහිල්ලා කල් ගියා කොහොම උනත් මං ස්තුතිවන්ත වනවා ප්‍රථමයෙන්ම මේ සභාවට සභා කටයුතු සාර්ථක කරගන්න නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුළු ජයග්‍රහි කණ්ඩායමත් ඒ වගේම ඒ ඉදිරිපස ආසනවල ඉන්න සියලුම පක්ෂවල මන්ත්‍රීවරුන්ට .

විශේෂයෙන්ම මතක් කරන්න ඕනේ අපේ බුද්ධික මැතිතුමා තමයි සභාවේ නියෝජ්‍ය නගරාධිපති හැටියට තේරී පත් වුනේ එතකොට අපේ ඉන්දික මන්ත්‍රීතුමා කිව්වා වගේ ලංකාවේ ගෙනාපු හොදම ක්‍රමය තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගෙනාපු මනාප ක්‍රමය. එම මනාප ක්‍රමය විකෘති කර ගත්තා මැතිවරණ කොමසාරිස් ඒ ගොල්ලෝ තමයි මේකට වග කියන්න ඕනේ. ඒගොල්ලෝ තමයි මේ මැතිවරණ ක්‍රමය නිවැරදිව පැවැත්වූයේ නැත්තේ. 2011 නැවත පළාත් පාලන මැතිවරණයේදී මම නගරාධිපතිවරයා හැටියට මනාපයෙන් ක්‍රමය යටතේ තේරී පත්වුණේ කොට ඒ මැතිවරණය තියෙන දින ගානක් ඇතුලත සභාපති උප සභාපති පත් කරා මේ මැතිවරණයේදී මාසයක් ගියා ප්‍රතිඵලය කියන්න , සභාපතිවරු ගැසට් කරන්න තව මාසයක් ගියා . ඉතින් ඒකයි මම කියන්නේ මේක 2015 දි කරපු සංශෝධන එක්ක මේ මෙය ක්‍රමය අපට ගැළපෙන්නෙ නෑ . ඒ උනත් අපි තමුන්නාන්සේලා ඔක්කොම ඇවිල්ලා ඉන්නවා නගරයේ ජනතාව තිස්පන්දාහක් තිස් හය දාහකට ආසන්න ඡන්ද සංඛ්‍යාවක් තියෙනවා . මේකෙන් මේ මැතිවරණයේදී ඡන්දය පාවිච්චි කරලා තිබුණා ඡන්ද විසිපන්දාහකට ආසන්න සංඛ්‍යාවක් . ඒ ජනතාව ඡන්දෙ දුන්නේ තමුන්නාන්සේලා අපිට මේ නගරය දියුණු කරන්න . ඉතින් අපි අද මේ මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේදී අපි දැක්කා අපි සියලු දෙනාම එකතුවෙලා වැඩ කරන්න ඕනේ මම ඇත්තවශයෙන්ම සන්තෝෂ වෙනවා අපි පහුගිය සභාවේ ආණ්ඩු පක්ෂයේ විපක්ෂය එකතුවෙලා වැඩ කෙරුවේ. විපක්ෂයේ හිටියේ තුන්දෙනයි. ඒ නිසා මේ ප්‍රමාණය විසි නව දෙනෙක් වුණා .

කලින් හිටපු මන්ත්‍රීවරු දන්නවා මේ සභාවට කොච්චර වියදමක් යන්න ඇද්ද. අපි තවම දන්නේ නැහැ අපිට නාම අයවැය ලේඛනය කුත් නෑ ,කොමසාරිස්තුමාගේ ඇහුවෙත් නෑ , දැන් කීයක් තියනවද කියලා දැන් ඒකටත් ලොකු මුදලක් වියදම් කරලා තියෙනවා එතකොට මන්ත්‍රීවරුන්ට වැටුප් ගෙවන්න වැටුප් කොළඹින් ආවත් අනෙකුත් පහසුකම් දෙන්නත් ගොඩක් වියදම් යනවා . ඉතින් අපි මේ නගර සභාවට ආවේ ජනතාවට යහපත් සේවයක් කරන්න සියලූදෙනාම එකතු වෙන්න ඕන. අපි ස්තුතිවන්ත වෙන්න ඕනෙ විශේෂයෙන්ම මාස විස්සක් අපි ගෙදර හිටිය. එහිදී අපි දැක්ක දෙයක් තමයි ඒ මාස තුළ නගර සභාව පාලනය කළේ කොමසාරිස්තුමා ඉතින් අපි දැක්කා කොමසාරිස්තුමා ලොකු වැඩ කොටසක් අපි නැති කාලේ කරලා තියෙනවා. ඒ කාලය තුළ මොනවා හරි අඩුපාඩු කම් වැරැද්දක් මොකක් හරි තියෙනවා නම් ඒක අපි සාකච්ඡා කරන්න ඕන. නමුත් අපි දැකපු දෙයක් තමයි හැමතැනම කුණු ප්‍රශ්නේ, සුනඛ ප්‍රශ්න එනවා ඒ හැර , එහෙම දැඩිව ප්‍රශ්නයක් නගරයට බලපෑවේ නෑ, අපිට ගියසැරේ කරන්න බැරි දෙයක් තිබුණා මේ කමිටු බෙදනකොට විෂයන් බෙදන්න ලැබුණේ නෑ . ඒ නිසා අපි කල්පනා කළා මේ විෂයන් එක්ක මේ කමිටුවලට බෙදුවොත් ගිය වාරයට වඩා වැඩියෙන් අපට යහපත් සේවයක් කරන්න හැකියාව ලැබෙයි කියලා විශ්වාසයෙන් තමයි අපි මේ කමිටු කොටස බෙදලා විෂයන් වෙන් කරා. අපි බලාපොරොත්තු වෙනවා අපි කමිටුවලට දින දැම්මා, මහා සභාවට දින දැම්මා , මෙයින් බලාපොරොත්තු වෙනවා ජනතාවට අඩුපාඩු නැතුව ඒ සියලු කටයුතු ඉටුකරන්න ගොනු කරල දෙන්න පහසුයි කියලා

සහ අපි ඒ කමිටුවලට පත්කරපු සියලු දෙනාට අපි සුභ ප්‍රාර්ථනා කරනවා. නගරාධිපතිට උප නගරාධිපති ට මේ ඔක්කොම බදා ගත්තොත් අපට යන්න අප අමාරුයි ගමන. ඒ නිසා මේ කාර්‍යයන් පහසු කරන්න තමයි එසේ පත් කෙලේ. සම්පූර්ණ කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම අපේ මේ පක්ෂය බිහි කරන්න උර දුන්න සියලූ දෙනාට ස්තූතිය පුද කරන්න ඕනේ . මොකද අපි මේ පක්ෂය හැදුනේ නැත්තම් වෙනත් කොටසක් ජයග්‍රහණය කරනවා ඒක නිසා කොහොම උනත් අපි සන්තෝෂ වෙනවා පක්ෂයක් හදලා එම පක්ෂය මැතිවරණයට ඉදිරිපත් වෙලා ඒ පක්ෂය ලංකාවේ පලවෙනි වතාවට කෙටි කාලයක් තුලදී ලංකාවේ කොට්ඨාශ අතරින් 70% ක ආසන්න බලයක් දේශපාලන වශයෙන් පාලන ආයතනය බිහි කරන්න ශක්තිය ලැබීම පිළිබඳව ඒ වගේම ඒ සඳහා උරදුන් අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට , බැසිල් රාජපක්ෂ මැතිතුමාට ජී.එල්. පීරිස් මැතිතුමාට පක්ෂයේ ලේකම්තුමාට ඒවගේම අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් නැගෙනහිර ආසන සංවිධායකතුමාට , ශෙහාන් සේමසිංහ මැතිතුමා, එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා ඒ වගේම බටහිර ආසන නියෝජනය කර අපේ කුමාරසිරි මන්ත්‍රී තුමා ඇතුළු සියළුම මේ පක්ෂය දිනවන්න කටයුතු කර සියලූ දෙනාට අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.

විශේෂයෙන්ම අලුත් ක්‍රමය අනුව මම 240 තුලාන් තමයි ඡන්දය ඉල්ලුවේ. එකේ අපේ හිටියා හිටපු මන්ත්‍රී දූෂාන්ත රුවන් කුමාර මැතිතුමා එතුමට අලුත් ක්‍රමයෙන් පොල්ලක් දැම්මා සමෘද්ධි නිලධාරීන්ට ඉල්ලන්න බැහැ කියලා . ඉතින් ඒ වෙනුවෙන් එතුමාගේ මන්ත්‍රීකම පරිත්‍යාග කරන්න සිද්ධ වුණා . හැබැයි ඒ කොට්ඨාසයෙන් මගේ ජයග්‍රහණය වෙනුවෙන් එතුමා විශාල කැප කිරීමක් කරා . මට උදව් කරා මගේ ජයග්‍රහණය වෙනුවෙන් මගේ සහෝදරයෙක් වගේ එතුමාට මගේ ගෞරවනීය ස්තූතිය මේ අවස්ථාවේදී පුද කරනවා . ඒ වගේම මගේ ලයිස්තු අපේක්ෂකයා ශාන්ත මැතිතුමා එතුමා මට උදව් කරා , කාන්තා සංවිධාන, මරණාධාර සමිති ස්වච්ඡා සංවිධාන සඳහා මගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිනවා .

ඒ වගේම අපේ පක්ෂය ජයග්‍රහණය කරන්න මම හැම තුලානයකටම වගේම ගියා. ඒ ඒ අපේක්ෂකයා ජයග්‍රහණය කරන්න අපිට හැකි ශක්ති ප්‍රමාණයෙන් අපි සෑමවිටම උදවු කරා. ඒ අනුව අපට කොට්ඨාශ 15 ජයග්‍රහණය කරන්න හැකියාව ලැබුණා. ඒ අනුව මේ මගේ ඡන්ද දායකයන්ට මගේ ගෞරවනීය ස්තූතිය නැවත වරක් පුදකරනවා මම හිතනවා අපි වාසනාවන්තයි ඓතිහාසික පූජා නගරයේ ඡන්ද කාලය තුළ කිසිම ගැටලුවක් ඇති වුණේ නෑ කිසිම ගැටුමක් ඇති වුණේ නෑඅපේ ආණ්ඩු පක්ෂයේ. එක්සත් ජාතික පක්ෂය , ජනතා විමුක්ති පෙරමුණේ අය අපි දැක්කෙත් නෑ කොහෙද ඉන්නේ කියලා. අපි මේ මැතිවරණ කටයුතු කිසිම ගැටුමක් නැතිව සිදු කලා කියලා මා නැවත වරක් කියනවා. අපි නගර සභාවට පත් වීම ගැන ගැසට් එකේ තියෙන 25යි. නමුත් විසි නම දෙනෙක් ආවා. අපි විශේෂයෙන්ම මේ සභාව නිර්මාණය කරලා තමුන්නාසේලාට ඒ පහසුකම ලබා දීපු මේ නිලධාරි මණ්ඩලයටත් පහුගිය කාලේ වගේම.. සියලුදෙනාටම නැවත වරක් ම ස්තූතිවන්ත වෙනවා. අද සිට අපි සියලු දෙනා එකතු වෙලා මේ නගරයේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න තමුන්නාසේලාට ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා, ඒ ප්‍රාර්ථනා කරන ගමන් ඊලඟ සභාවාරය මැයි මාසේ 8 වැනි දින පවත්වන බවට යෝජනා කරනවා.

ගරු සුසිල් තිලකරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, මැයි මස 8 වන දින ඉදිරි මහා සභාව රැස්වන බව සභාවට දන්වමින් මෙදින දින සභාවේ කටයුතු ප.ව. 01. 20 ට ගරු නගරාධිපතිතුමා විසින් අවසන් කරන ලදී.

එච්.පී. සෝමදාස,

නගරාධිපති,

මහා නගර සභාව,

අනුරාධපුරය